

# වීථි විභාගය සහිත පට්ඨාන ත්‍රී රාශිය

අතිපූජ්‍ය නා උයනේ අරියධම්ම
ස්වාමින් වහන්සේ පරිවර්ථිත



# වීථි විභාගය සහිත
# පට්ඨාන ත්‍රී රාසිය

**සම්පාදනය:**

බුරුම රට (මියන්මාර්හි) මහා ගන්ධායුං විහාරාධිවාසී
අතිපූජනීය භදන්ත යූ. ජනකාභිවංස මාහිමි

**පරිවර්තනය:**

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන අනුශාසක
මහා කම්මට්ඨානාචරිය, ත්‍රිපිටකධාරී ආචාර්යෝත්තම
අතිපූජනීය නාඋයනේ ශ්‍රී අරියධම්ම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**ධර්මදානය:**

ලසන්ත අලගියවන්න මහත්මා
අමා ජයසිංහ අලගියවන්න මහත්මිය

2555
2011

# පෙරවදන

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

**ධම්මාරාමො ධම්මරතො - ධම්මං අනුවිචින්තයං**
**ධම්මං අනුස්සරං භික්ඛු - සද්ධම්මා න පරිහායති**

(ධම්මපදය - භික්ඛු වග්ග)

හද මැඳුර ධර්ම මන්දිරයක් බවට පත්කොට ධර්මයෙහිම සිත පිනවන, නැවත නැවත ධර්මයම සිතන, ධර්මය මෙනෙහි කරන බෞද්ධයා නවලොවුතුරා ධර්මයෙන් නොපිරිහෙයි.

ධර්මය - අභිධර්මය, විනය - අභිවිනය නමින් ධර්මවිනය සතරාකාර වෙයි. සූත්‍රපිටකය ධර්මයය - අභිධර්ම පිටකය - අභිධර්මයය. විනය පිටකයෙහි පාරාජිකා පාලි පාචිත්තිය පාලි ග්‍රන්ථ දෙක විනයය, මහවග්ග චුල්ල වග්ග පරිවාර ග්‍රන්ථ තුන අභිවිනයය.

විනය අභිවිනය - ආඥාදේශනයකි. යථාපරාධ ශාසනයකි. සංවරාසංවර කථාවකි. සූත්‍ර පිටකය ව්‍යවහාර දේශනයකි. යථානුලෝම ශාසනයකි. දෘෂ්ටි ගතියන් නිරාකරණ කථාවකි. අභිධර්මය පරමාර්ථධර්ම දේශනයකි. යථාධර්ම ශාසනයකි. නාමරූප පරිච්ඡේද කථාවකි. විනය උගෙන ශීලයෙහි පිහිටයි. සූත්‍ර දේශනා උගෙන ධ්‍යාන සමාපත්ති අභිඥාබල වඩයි. අභිධර්මය උගෙන නාමරූප පරමාර්ථ ධර්ම විදර්ශනා වඩා මග පල නිවන සාක්ෂාත් කරයි. මෙසේ ධර්ම විනය මඟින් සීල සමාධි ප්‍රඥා වඩා නිවන්මග ආලෝකවත් වනු පිණිස පැරැණි උතුමෝ සුවිසුද්ධ වූ ත්‍රිපිටක ධර්මය ඉගෙන ගත්හ, උගැන්වූහ, ලියා තැබූහ, පාලි භාෂාව නොදත් අයට පහසුව පිණිස තම තමන්ගේ භාෂාවනට පරිවර්තනය ද කළහ.

බුරුම රට මණ්ඩලේ අමරපුර නුවර මහාගන්ධායුං මහා පරිවේණාධිපතිව වැඩ විසූ මහා ග්‍රන්ථකාරක අතිපූජ්‍ය ජනකාභිවංස මහා නාහිමියන් වහන්සේ විසින් බුරුම බසින් ලියා මුද්‍රණය කරවන ලද (වීථි භාෂාටීකා) චිත්ත වීථි - රූප වීථි විභාග සහ (පට්ඨාන් තුන්ජෙසු) පට්ඨාන ත්‍රිරාශිය නමැති දහම් පොත් දෙක මා විසින් සිංහල බසට පරිවර්තනය කරන ලද්දේ වර්ෂ 1964 අගෝස්තු මාසයේ දී අතිපූජ්‍ය භදන්ත අග්ගමහා පණ්ඩිත ඤාණින්ද සෙයාඩෝ නාහිමියන් වහන්සේගේ කාරුණික අනුග්‍රහයෙනි.

ආධුනිකව අභිධර්මය හදාරන ශිෂ්‍යයනට උපකාර පිණිස මේ දහම් පොත් දෙක එකතු කොට මුද්‍රණය කරවා ධර්ම දානය කරන ලෙස සත්ගුණවත් ලසන්ත අලගියවන්න ඇමතිතුමාටත්, එම අමා ජයසිංහ අලගියවන්න මැතිතුමියටත් සිහිපත් කරන ලද්දේ පූජ්‍ය නාග පොකුණේ අරියසීල ස්වාමීන් වහන්සේ විසිනි. මෙය ඉතාමත් සතුටෙන් පිළිගත් පින්වත් අමා ජයසිංහ අලගියවන්න මැතිතුමියත්, පින්වත් ලසන්ත අලගියවන්න ඇමැතිතුමාත් මුද්‍රණය කරවා පිරිනමනුයේ ධර්ම දානමය පුණ්‍ය සම්භාරයේ අගය අමිල බව දැන ඉමහත් ගෞරවයෙනි.

තව ද, සම්බුද්ධත්ව ජයන්තිය (2600) නිමිත්තෙන් සහ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සමසැට (60) වසර නිමිත්තෙන් අනුරපුර රුවන්මැලි මහා සෑ මළුවේ දී (2011.06.04 සහ 05) දෙදින තුළ සිදු කෙරෙන සාරාණීය පුණ්‍ය මහෝත්සවයේ දී පිරිනැමෙන මෙම ධර්ම දානය ද බුද්ධ පූජාවක්ම වේවා යන ප්‍රසාදනීය භක්තියෙනි.

මෙම ධර්මදානමය කුශලානුභාවය සම්බුද්ධ ශාසන චිරස්තිය පිණිස වේවා. මෙහි ප්‍රථම කර්තෘවර අතිගරු පූජනීය මහා ගන්ධායුං සෙයාඩෝ නම් වූ ජනකාභිවංස නාහිමිපාණන්ට සහ පරිවර්තනයට අනුග්‍රාහකත්ව දැක්වූ අතිගරු පූජනීය භදන්ත අග්ගමහා පණ්ඩිත ඤාණින්ද නාහිමිපාණන්ටත් පැතූ උතුම් බෝධියෙන් අමා මහ නිවන් සුව පිණිස හේතු වේවා. පින්වත් ලසන්ත අලගියවන්න ඇමතිතුමාගේ සහ එම මැතිනියගේ පියවරු දෙදෙනා ප්‍රධාන පරලෝ සැපත් සියලු ඤාති මිත්‍රාදීන්ටත්, අමා මහ නිවන් සුව පිණිස හේතු වේවා. ජීවත්ව සිටින ආදරණීය මවුවරු දෙදෙනාට සහ දයාබර දරු දෙදෙනාට ද අලගියවන්න දම්පතීන් දෙදෙනාට ද ආයුවර්ණ සැප බල ප්‍රඥාවත්, දෙලොව සුබ සෙතත්, ශාන්ත නිවන් සුව පිණිසත් වාසනා වේවා. සිතුපැතු සංකල්පනා සියල්ල සමෘද්ධ වේවා.

"සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා"

මෙයට,
මෙතැති,

**නාඋයනේ අරියධම්ම ස්ථවිර**

නාඋයන ආරණ්‍ය සේනාසනය.

# ධර්ම දානය

සර්වඥ සම්බුද්ධ රාජෝත්තමයාණන් වහන්සේ නමක් ලොව පහළ වීම පුදුම ආශ්චර්යයකි. එවන් අසිරියක් තවත් නොමැත. එය එසේ වන්නේ සියලු සත්ත්වයන්ටම බුදු උපත සැපතක් වන බැවිනි. මුළු ලොවම අවිදු අඳුරෙන් අඳුරු වී ඇත. තණ්හාවෙන් හරිත වී ඇත. එහි ප්‍රතිඵලය අනන්ත සසර දුකෙහි ගිලීයාමයි. පුහුදුන් සියලු සතුන්ගේ තත්ත්වය එයයි. මෙය සර්වකාලික ය. හැම කල්හිම ලෝකයේ හැටි එහෙමයි. මේ දුක් සයුරෙන් එතෙර වන්නට ඇති එකම පිහිට බුදු පිහිටයි. තමන් වහන්සේ ඒ බවදුක් සයුර තරණය කළ සේක. මහා කරුණාවෙන් ලෝකයටත් එය පහදා වදාළ සේක. තමන් කළ දේ කියන - කියන දේ කරන ශාස්තෘන් වහන්සේ නමකගේ දහමක් වෙතොත්, ඒ බුදු දහම පමණයි නියම නිවන් මග වන්නේ.

ඒ සුවිශුද්ධ නිර්වාණ මාර්ගය, සම්මුති දේශනා පරමත්ථ දේශනා වශයෙන් දෙවැදෑරුම් වෙයි. සාමාන්‍ය ජනයාට ලෝකව්‍යවහාරය ඇසුරෙන් දැනුම ලබා දී නිවන් මගට යොමු කරවීම සම්මුති දේශනාවයි. ඍජුවම නිවන් මග පෙන්වීම පරමත්ථ දේශනාවයි. ඒ පරමත්ථ දේශනාව හැම කල්හිම සුවිශුද්ධයි. පරම ගම්භීරයි. වහ වහා නුවණැස පාදයි.

මේ ධර්ම ග්‍රන්ථය ඒ අභිධර්ම පිටකය පිළිබඳ සංක්ෂිප්ත කෘතියකි. එහෙත්, මෙය ප්‍රවීණ අප්‍රවීණ සැමට පරමාර්ථ ධර්ම උගැනුමට මහත් පිටිවහලකි. **බුරුම රට (මියන්මාර්හි) මහා ගන්ධායුං විහාරවාසී අතිපූජනීය භදන්ත යූ. ජනකාභිවංස මාහිමියන්** අතින් මේ පොත සම්පාදනය වී ඇත.

එහෙත්, සිංහල අපට එයින් මෙසේ ප්‍රයෝජන ගත හැකි වන්නේ **ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන අනුශාසක මහා කම්මට්ඨානාචරිය, ත්‍රිපිටකධාරී ආචාර්යෝත්තම අතිපූජනීය නාඋයනේ ශ්‍රී අරියධම්ම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ** සුවිශාරද හස්තයෙන් එය හෙළ බසට පරිවර්තනය වීම නිසා ය. උන්වහන්සේගේ සමීපවාසී උපස්ථායක පූජ්‍ය නාගපොකුණේ

අරියසීල ස්වාමීන් වහන්සේගේ කාරුණිකත්වය නිසා එය මුද්‍රණය කොට 2600 වන ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය හා සබැඳිව ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සම සැට වසර පූර්ණය සමරන මෙම අවස්ථාවේ ධර්ම දානයක් වශයෙන් පිරිනැමීමේ භාග්‍යය අපට උදාවිය.

මෙය සියලු දන් පරදවන උතුම්ම උතුම් ධර්ම දානමය පින්කමකි. ග්‍රන්ථ සම්පාදක අතිපූජනීය භදන්ත යූ. ජනකාභිවංස මාහිමියන්ට මේ පින නිවන් පිණිස වේවා. පරිවර්තක අතිපූජනීය නාඋයනේ ශ්‍රී අරියධම්ම මාහිමියන් වහන්සේට නිදුක් නිරෝගී සුව හා දීර්ඝායු ශ්‍රී ශාන්තිය පිණිස වේවා. සුව සේම උතුම් බුදුබව ලබන්නට හේතු වාසනා වේවා. අභාවප්‍රාප්ත අපගේ පියාණන් වහන්සේලාට ද, සියලු ඥාති මිත්‍රාදීන්ට ද, සගමොක් සුව පිණිස වේවා. පින්වත් නන්දා අලගියවන්න සහ ශීලා ජයසිංහ අප මෑණියන් වහන්සේලාට ද දිගාසිරි සම්පත් පිණිස වේවා. චිරනි අලගියවන්න අප ආදරණීය දියණියට ද පවතින අපල, රෝදුක් දුරු වී නිරෝගි සම්පත් ලබනු පිණිස වේවා. උත්පල අලගියවන්න අප දයාබර පුතණුවන්ට ද සියලු සෙත පිණිස වේවා. හිතාහිත මැදහත් සියලු සත්ත්වයන්ට ද සියලු හිත සෙත පිණිසම වේවා. අප සැම දෙනාටම මෙලොව සුභසිද්ධිය, පරලොව සුභසිද්ධිය හා උතුම් නිවන් සුව පිණිස මේ සියලු පින් හේතු වාසනා වේවා.

**තුනුරුවන් සරණයි!**

මෙයට,

**ලසන්ත අලගියවන්න**
**අමා ජයසිංහ අලගියවන්න**

## වීථි භාෂා ටීකාව

### නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

### වීථිනිදානය

**වීථී අන්තගතං නාථං - නත්වාන වීථී වාචනං**
**වීථියා වණ්ණයිස්සාමි - වාචෙන්තු වීථී වාචිනො**

චිත්තයන්ගේ පරම්පරාවට චිත්තවීථිය රූපයන්ගේ පරම්පරාවට රූපවීථියයි කියා ශාසනයෙහි ඉතා ප්‍රකටව භාවිතා කෙරෙන එක වචනයක් තිබේ. ඒ වීථිය නොදන්නේ නම් බොහෝ සෙයින් පාළියෙහි අටුවාවෙහි (විශේෂයෙන් පට්ඨාන පාලියෙහි) සැක ඉපදිය හැකිය. විදසුන් කමටහන ඉතා හොඳින් දියුණු කරන්නා වූ යෝගාවචරයන්ට 'අනිච්ච දුක්ඛ අනත්ත' යන තිලකුණු නුවණින් පිරිසිඳ දැනගැනීමට මේ වීථීහු වනාහි ජීවිතය වැනි වෙති.

ඒ නිසා ශාසනයේ හරය වැනි වූ ඉතාම විශේෂ කාරණය වූ වීථිය පිළිබඳව කරුණු ඉතා හොඳින් දැනගත යුතුය.

එසේ (ඉගෙන ගැනීමට) දැන ගැනීමට සුදුසු චිත්තවීථි ගැන සිතන කල්හි (විමසා බලන කල්හි) අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ඉතා කෙටි බැවින් ද පුරාණ මහ තෙරුන් වහන්සේලා සම්පූර්ණ බුරුම භාෂාවෙන් නානා ග්‍රන්ථ ලියූ නමුත් (ඒවා) ඉතාම දිග බැවින් හා අධිප්‍රාය අර්ථය නොදැක්වෙන බැවින් ද කටපාඩම් කිරීමට රුචි නැත. ඒ නිසා පුරාණ මහ තෙරුන් වහන්සේලා විසින් රචිත වීථි පොත් හා සසඳා බැලීමේ දී පැහැදීම එළවන සේ අධිප්‍රායාර්ථයක් සමඟ ඉතා දික්නොවූ, ඉතා කෙටි නොවූ මේ වීථි පාඩම ලියන ලදී.

(වීථි කාණ්ඩය ඇතුළත් භාෂා ටීකාව ඉගෙන අවසන් වී මේ වීථි පාඩම්පොත ඉගෙන ගැනීමෙන්ම චිත්ත වීථි ගැන මනා අවබෝධයක් ලැබෙන බවට සහතික කරමි. ඒ නිසා මේ වීථි පාඩම් පොත රාත්‍රී කාලයේ පුහුණු කිරීමෙන් හෝ දවල් කාලයේ බලා පුහුණු කිරීමෙන් හෝ එක විදියට පාඩම් කළ යුතුය. වීථි කාණ්ඩ සහිත භාෂා ටීකාවේ ස්වභාවාර්ථ අධිප්‍රායාර්ත්ථ විස්තර

වශයෙන් ලියා මෙහිදී වීථි පාඩම් වචන මාලාව සහ යෙදෙන්නාවූ අධිප්‍රායාර්ත්ථය පමණක්ම දක්වන ලදී.

## වීථි උදාහරණයන්හි කෙටි සලකුණු

○○○ - උ: ඨී: භංගක්‍ෂණ
භ - භවංග
තී - අතීත භවංග
න - භවංගචලන
ද - භවංගුපච්ඡේද
ප - පඤ්චද්වාරාවජ්ජන
ච - චක්ඛුවිඤ්ඤාණ
සො - සොතවිඤ්ඤාණ
ඝා - ඝානවිඤ්ඤාණ
ජි - ජිව්හාවිඤ්ඤාණ
කා - කාය විඤ්ඤාණ
සං - සම්පටිච්ඡන
ණ - සන්තීරණ
වො - වොත්ථපන
ජ - ජවන
ත - තදාරම්මණ
ආ - ආගන්තුක භවංග
ම - මනොද්වාරාවජ්ජන
ප - පරිකම්ම
උ - උපචාර
නු - අනුලෝම
ගො - ගොත්‍රභූ
වො - වොදාන
ඣා - ඣාන
භි - අභිඤ්ඤා
මා - මාර්ග
ඵ - ඵල
ටි - පටිසන්ධි
චු - චුති

### වීථිපාඩම සහ ටීකාව

'වීයන්ති ගච්ඡන්ති සත්තා එත්ථාති වීථි, වීථි වියාති වීථි'යි කියන ලද නිර්වචනානුරූපව සත්වසන්තානයෙහි නියාම වශයෙන් උපදින්නා වූ චිත්තපරම්පරාව ගමන් මාර්ගයට සමාන බැවින් වීථි නම් වේ. ඒ වීථිය ද පඤ්චද්වාර වීථි මනෝද්වාරවීථි වශයෙන් දෙවැදෑරුම් වේ. ඒ දෙක අතුරෙන් පඤ්චද්වාරවීථියද චක්ඛුද්වාරවීථි

සොතද්වාර වීථි ඝානද්වාරවීථි ජිව්හාද්වාරවීථි කායද්වාර වීථි කියා ද්වාරභේදයෙන් පස්වැදෑරුම් වේ. ඒ පස අතුරෙන් චක්ඛුද්වාරවීථිය ද අතිමහන්තාරම්මණවීථි මහන්තාරම්මණවීථි පරිත්තාරම්මණවීථි අතිපරිත්තාරම්මණවීථි කියා ආරම්මණ භේදයෙන් සතරවැදෑරුම් වේ. ඒ සතර අතරෙන් අතිමහත්තාරම්මණ වීථිය ද තදාරම්මණය අවසන් කොට ඇත්තා වූ තදාරම්මණවාරයය. ජවනය අවසන් කොට ඇත්තා වූ ජවන වාරයය කියා වාර භේදයෙන් දෙවැදෑරුම් වේ.

ඒ දෙක අතුරෙන් තදාරම්මණවාර අතිමහන්තාරම්මණ චක්ඛුද්වාරවීථිය උපදිනා ආකාරය, රූපාරම්මණ හා චක්ඛුපසාදයෝ මුලින් උපදීමේ පටන් අතීතභවංග එක්වරක් ඉක්මවා චක්‍ෂුප්‍රශාදයේ රූපාරම්මණය ආපාතගතවීමෙන් භවංගචලන භවංගුපච්ඡේද පඤ්චද්වාරාවජ්ජන චක්ඛුවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන ජවන සත්වරක් හා තදාරම්මණ දෙවරක් උපන් කාලයේ දී රූපාරම්මණ හා චක්ඛුපාසාදයන්ගේ චිත්තක්‍ෂණ සතලොසක ආයු සම්පූර්ණ වීම නිසා දෙවැනි තදාරම්මණයාගේ භංගය හා එකට නිරෝධය ඇත්තා වූ වීථිය තදාරම්මණවාර අතිමහන්තාරම්මණ චක්ඛුද්වාර වීථිය නම් වේ.

අදහසඃ- එත්ථ මේ මාර්ගයෙහි, සත්තා සත්ත්වයෝ, වීයන්ති ගච්ඡන්ති, ගමන් කරත්නුයි, ඉති ඒ නිසා, සා- ඒ මාර්ගය, වීථි-වීථි නම් වේ. මේ වචනයට අනුව වීථි ශබ්දය සත්ත්වයන්ගේ ගමනාගමන මාර්ග පරම්පරාවට කියනු ලැබේ. සත්ත්ව සන්තානයෙහි පවත්නාවූ චිත්තපරම්පරාව ඒ ගමන් මාර්ගයට සමාන වේ. සමානාකාරය වනාහිඃ- ගමන්මාර්ගය ගමනින් ගමනට මඟින් මඟට නැවත නැවත ලැබෙන්නාක් මෙන් චිත්ත පරම්පරාවත් සිතින් සිතට නැවත නැවත උපදී අයං, මේ චිත්ත පරම්පරාව වීථිවිය, ගමන් මාර්ගය වැනිනුයි, ඉති ඒ නිසා, සා- ඒ චිත්තපරම්පරාව, වීථි වීථි නම් වේ. (පූර්වාචාර්යයෝ වනාහි, ගමන් මාර්ග ගාම පරම්පරාව නොයික්මවන්නාක් මෙන් නියාම ධර්මතා අනුව උත්පත්ති ක්‍රමය නොඉක්මවීම ගමන් මාර්ගය හා ඇති සමානත්ව යැයි කියති)

තවද:- පන්ති වීථ්‍යා වළි සෙණි පාළි' යයි. නිඝන්ඩුවෙහි ආවාවූ පරම්පරාව කියන ශබ්දයන්හි වීථි ශබ්දයත් ඇතුලත් වන බැවින් මේ ස්ථානයේ දී වීථි ශබ්දය චිත්තයන්ගේ පරම්පරාව කියන්නා වූ 'අනිෂ්පන්න ප්‍රාතිපදික' පදයෙකි. ඒ නිසා වීථි චිත්ත පරම්පරාව' කියා සැම තැනදීම යෙදිය හැකිය. චිත්ත පරම්පරා චිත්තයන්ගේ පරම්පරාව නොහොත්, පරම්පරා වශයෙන් උපදින්නා වූ සිත, වීථි වීථි නම් වේ.

පඤ්චද්වාර - මනොද්වාරවීථි - චක්ඛු, සොතඝාන, ජිව්හා, කාය යන මේ දොරවල් පසට පඤ්චද්වාරයයි කියනු ලැබේ. ඒ දොරවල්පසෙහි රූපාරම්මණාදි අරමුණ පස ඨිතික්‍ෂණයේ දී ආපාතගතව උපදනාවූ චිත්තපරම්පරාවට 'පඤ්චද්වාරෙ පවත්තා වීථි' යනුවෙන් පඤ්චද්වාර වීථි යැයි කියනු ලැබේ. භවංග සංඛ්‍යාත වූ මනොද්වාරයෙහි ආපාතගත වන අරමුණ නිසා උපදනා වූ චිත්ත වීථියට 'මනොද්වාරෙ පවත්තා වීථි' යනුවෙන් මනොද්වාර වීථියයි කියනු ලැබේ.

**චක්ඛුද්වාරික අතිමහන්තාරම්මණ වීථි තදාරම්මණවාරය:-** 'චක්ඛුද්වාරේ පවත්තා වීථි' යනුවෙන් චක්‍ෂු ද්වාරයෙහි ආපාතගතවන අරමුණ නිසා උපදනා වූ චිත්ත පරම්පරාව චක්ඛුද්වාර වීථි නම් වේ. අතිමහන්තාරම්මණයක් අරමුණුකරන කල්හි ඒ චක්ඛුද්වාරවීථියම අතිමහන්තාරම්මණවීථිය නම් වේ. අලුත් එක් අරමුණක් නිසා එක චිත්තවීථියක් උපදින තැනදී ඒ වීථිය තදාරම්මණ අවසාන කොට උපන්නොත් ඒ අවසාන තදාරම්මණය ලකුණු කොට තදාරම්මණ වාරයයි. (තදාරම්මණයෙන් උපලක්‍ෂණ කොට ඇත්තා වූ චිත්තවාරයයි) ව්‍යවහාර කරනු ලැබේ. තදාරම්මණෙන උපලක්ඛිතො වාරො තදාරම්මණවාරො නම් වේ.

තදාරම්මණවාර අතිමහන්තාරම්මණ චක්ඛුද්වාරිකවීථි

උදාහරණය

භ තී න ද ප ච සං ණ වො ජ ජ

ජ ජ ජ ජ ජ ත ත භ

මේ වීථි උදාහරණයෙහි පළමුවෙන් දක්වන ලද භවංගය හා තදාරම්මණයෙන් පසු දක්වන ලද භවංගය ද මේ වීථියට ඇතුළත් නොවේ. මේ වීථිය උපදීමට මුලින් බොහෝ භවංග ඉපදෙමින් පවතින බැවින් හා මේ වීථියෙන් පසුවත් බොහෝ භවංග ඉපදීමෙන් සුදුසු පරිදි නැවතත් වීථි සිත් ඉපදිය හැකි ආකාරය දක්වනු කැමතිව වැඩිපුර භවංග සටහන් කරන ලදී. අතීත භවංග භවංග චලන භංගුපච්ඡේදයෝ ද වීථිසිත් නොවෙති. වීථි නොවන්නා වූ වීථියෙන් අන්‍ය වූ වීථිමුක්ත චිත්තයෝ වෙති. නමුත් රූපාරම්මණය ඉපදීමේ පටන් නිරෝධය දක්වා රූපයාගේ ආයුෂ චිත්තක්ෂණ සතලොසක් පමණ කාලය ගණන් ගැනීමේදී අතීතභවංගයේ පටන් ගණන්ගන්නා බැවින් ඒ භවංගයන්ද වීථියට ඇතුලත් කරන ලදහ. නමුත් පඤ්චද්වාරාවජ්ජනයපටන් තදාරම්මණය අවසන් කොට ඇත්තා වූ සිත් පමණක් වීථිසිත් යැයි දතයුතු.

මේ චක්ඛුද්වාරිකවීථියෙන් 'මම මෙනම් වස්තුවක් දකිනවාය. රතුපාටය, සුදුපාටය අසවලාය ආදී වශයෙන් නොදත හැකිය. රූපාරම්මණ සාමාන්‍යයම දැකීම්මාත්‍රය පමණක් වේ.

මේ වීථියෙන් පසුව සුදුසු පරිද්දෙන් භවාංග සිත් ඉපද අන්තරයක් දක්වා තදනුවත්තික මනොද්වාරවීථි ඉපදීමෙන් සුදු රතු කබර ආදී වශයෙන් වෙන්කොට දත හැකිය.

### ජවනවාර අතිමහන්තාරම්මණ වීථි

ජවනවාරයද ආගන්තුක භවංග පතිත වන වාරයය. ආගන්තුක භවංග පතිත නොවන වාරය වශයෙන් දෙපරිදි වේ. ඒ දෙක අතුරෙන් ආගන්තුක භවංග පතිත නොවන්නා වූ ජවනවාර අතිමහන්තාරම්මණ චක්ඛුද්වාරිකවීථිය උපදින ආකාරය: රූපාරම්මණ සහ චක්ෂුප්‍රශාදයෝ මුලින් ඉපදීමේ පටන් අතීතභවංග එක්වරක් ඉක්මවා චක්ෂුප්‍රශාදයෙහි රූපාරම්මණය ආපාතගතවීමෙන් භවංගචලන භවංගුපච්ඡේද පඤ්චද්වාරාවජ්ජන චක්ඛු විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන ජවන සත්වරක් ඉපද භවංග දෙවරක් ඉපද අවසන් වන කාලයේ දී රූපාරම්මණ හා චක්ඛුපසාදයන්ගේ ආයුෂ චිත්තක්ෂණ සතලොස් ආයු සම්පූර්ණ

වීමෙන් දෙවැනි භවංගයාගේ භංගය හා එකට නිරුද්ධවන්නා වූ වීථීය ජවනවාර අතිමහන්තාරම්මණ චක්ඛුද්වාරික වීථීය නම් වේ.

විස්තරඃ-

**ජවනවාරයඃ-** වීථි උදාහරණයෙහි තදාරම්මණ ආකාරයට තදාරම්මණ දෙවරක් නොදක්වති. මුලින් දැක්වූ තදාරම්මණවාරයෙහි හා මේ ජවනවාර වීථීන් පිළිබඳ විශේෂය නම්,

'කාමෙජවන සත්තා - ලම්බනානං නියමෙ සති
විභූතෙති මහන්තෙච - තදාරම්මණ මීරිතං' යන්නට අනුව පළමු තදාරම්මණවාරවීථීය කාමභූමික කාමසත්ව සන්තානයෙහිම උපදී. මේ වීථීය වනාහි කාමභූමික සන්තානයෙහිත් උපදී. රූපභූමික සන්තානයෙහි ද උපදී. අභිධර්මාර්ත්ථ සංග්‍රහවේ අතිමහන්තාරම්මණ වීථීය තදාරම්මණ වීථීයයි කියාම දැක්වීම වනාහි උත්කෘෂ්ඨ නිර් දේශය වශයෙන් දැක්වීමකි.

**තවත් කාරණයෙකිඃ-** උපෙක්ඛාසහගත සිතින් පිළිසිඳ ගත්තා වූ කාමපුද්ගල සන්තානයෙහි බුදුරජාණන් වහන්සේගේ ශරීර වර්ණය ආදී අතිඉෂ්ට අතිමහන්තාරම්මණයක් අරමුණු කොට දොස ජවනයක් ඉපදීමේ දී 'අතිඉට්ඨෙපන සොමනස්ස සහගතානෙව' යන කීමට අනුව තදාරම්මණ පතනය වේනම් අරමුණට අනුරූපව සොමනස්ස තදාරම්මණ යම පතනය විය යුතු නමුත් දෝසජවනය හා සෝමනස්ස තදාරම්මණයෝ ප්‍රතිපක්‍ෂ, විරුද්ධ බැවින් තදාරම්මණ පතනය නොවී මේ ජවනවාර අතිමහන්තාරම්මණ වීථීයෙන් පසු පටිසන්ධියට සමාන වූ උපෙක්‍ෂාභවංගයම පතනය වේ.

ටීකා

**ආගන්තුක භවංගය පතනය වන අතිමහන්තාරම්මණ වීථීයඃ**

සොමනස්ස සහගත සිතින් පිළිසිඳ ගත්තා වූ තීර්ත්ථකා දී පුද්ගලයන්ගේ සන්තානයෙහි බුදුරජාණන් වහන්සේගේ ශරීරවර්ණාදී වූ අතිඉෂ්ට අතිමහන්තාරම්මණයක් ආපාතගතවීමේ දී රූපාරම්මණ හා චක්ඛුපසාදයෝ එළඹී උත්පාදයේ පටන් භවංග එක්වරක්

ඉක්මවා චක්ඛුපසාදයෙහි රූපාරම්මණය ආපාතගතවීමෙන් භවංගචලන භවංගුපච්ඡේද පඤ්චද්වාරාවජ්ජන චක්ඛුවිඤ්ඤාණ සම්පටිච්ඡන

සන්තීරණ වොත්ථපන - දොසජවනය සත්වරක් හා ආගන්තුක භවංග එක්වරක් ද ඊටපසු මූලභවංග එක්වරක් පතිතාවසානයේ දී රූපාරම්මණ චක්ඛුපසාදයන්ගේ ආයුෂ සතලොස්ක්‍ෂණය සම්පූර්ණ වීමෙන් පළමු මූලභවංගයාගේ භංගය හා එකට නිරුද්ධවන්නා වූ වීථිය ආගන්තුක භවංග පතනය වන අතිමහන්තාරම්මණ වීථිය නම් වේ.

**ආගන්තුක භවංගය පතිතවන අතිමහන්තාරම්මණවීථි**

**උදාහරණය**

තී න ද ප ච සං ණ වො ජ

ජ ජ ජ ජ ජ ජ ආ භ

**ටීකා**

**මහන්තාරම්මණ වීථියෝ**

මහන්තාරම්මණ වීථිය ද ජවනවාර වශයෙන් එකක්ම වේ. අතීතභවංග දෙවරක් ඉක්මවන පළමු මහන්තාරම්මණ වීථිය, අතීතභවංග තෙවරක් ඉක්ම වන දෙවැනි මහන්තාරම්මණ වීථිය වශයෙන් දෙපරිදි වේ. ඒ දෙක අතුරෙන් එක එකෙක්හි ආගන්තුක භවංග පතිතවන වාරය ආගන්තුක භවංග පතිත නොවන වාර වශයෙන් දෙවර්ගයක් ඇත. ඒ දෙක අතුරෙන් පළමු මහන්තාරම්මණ වීථිය උපදින ආකාරය මෙසේය:

රූපාරම්මණ හා චක්ඛුපසාදයෝ එළඹී ඉපදීමේ පටන් අතීතභවංග වාර දෙකක් ඉක්මවා චක්ඛුපසාදයෙහි රූපාරම්මණය ආපාතගත වීමෙන් භවංගචලන භවංගුපච්ඡේද පඤ්චද්වාරාවජ්ජන චක්ඛුවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන ජවන සත්වරක් හා භවංග එක්වරක් පතිතාවසානයේ දී රූපාරම්මණ හා චක්ඛුපසාදයන්ගේ සතලොස් ක්‍ෂණ ආයුෂ සම්පූර්ණ වීමෙන් පළමු

භවංගයාගේ භංගය හා එකට නිරුද්ධවන්නා වූ වීථිය ආගන්තුකභවංග පතනය නොවන ප්‍රථම මහන්තාරම්මණ වීථිය නම් වේ.

**විස්තරඃ**

**ඉකිරිමහන්තාරම්මණ වීථීහුඃ**

ආගන්තුක භවංග පතිතවන වීථියෙහි ජවනය දොසජවනය ලකුණු කරන්න. සත්වැනි ජවනයෙන් පසු ආගන්තුක භවංගය පතනය වී ආගන්තුක භවංගයාගේ භංගක්‍ෂණය හා එකට රූපාරම්මණ චක්‍ෂුර්ප්‍රසාදයෝ නිරුද්ධ වෙති. අතීතභවංගවාර තුනක් ඉක්මවා ආගන්තුක භවංගය පතනය නොවන වීථියඃ ආගන්තුක භවංගය පතිතවන වීථියන්හිම සත්වැනි ජවනයාගේ භංගය හා සමඟ රූපාරම්මණ මක්‍ෂුර් ප්‍රසාදයෝ නිරුද්ධ වෙති.

**ආගන්තුකභවංග නොලැබෙන්නා වූ ප්‍රථම මහන්තාරම්මණවීථි**

***උදාහරණය***

භ තී තී න ද ප ච සං ණ වො ජ ජ

ජ ජ ජ ජ ජ භ

ඒ වීථීන්ගේ පාඩම ප්‍රථම මහන්තාරම්මණ වීථියට සමාන කොට කියන්න. වීථි උදාහරණය ද අතිමහත්තාරම්මණ වීථි නය ඇසුරු කොට ලකුණු කරන්න. ආගන්තුකභවාංගය පතනය නොවන ප්‍රථම මහන්තාරම්මණ වීථිය පමණක්ම දක්වන්නෙමි.

**ආගන්තුක භවංගය පතිතවන අතිමහත්තාරම්මණ හා මහන්තාරම්මණ වීථීන් පිළිබඳ විශේෂයඃ**

අතිමහන්තාරම්මණයෙහි අරමුණ අතිඉෂ්ට වුවහොත් පමණකි. දොසජවනයෙන් පසු සොමනස්සතදාරම්මණය පතනය නොවී ආගන්තුක භවංගය පතනය වනුයේ, අරමුණ ඉෂ්ටමද්ධ්‍යස්ථ

වුවහොත් කුශලවිපාක උපේක්‍ෂාතදාරම්මණය පතනය වේ. අනිෂ්ඨාරම්මණයක් වුවහොත් අකුශලවිපාක උපෙක්‍ෂා තදාරම්මණය පතනය වී ඉෂ්ටමධ්‍යස්ථාරම්මණ අනිෂ්ටාරම්මණයන්හි ආගන්තුක භවංගය පතනය නොවේ. මේ මහන්තාරම්මණයෙහි වනාහි සොමනස්ස සහගත පටිසන්ධියෙන් උපන්නෙක් නම් දොසජවනයෙන් පසු පටිසන්ධියට සමාන වූ සොමනස්ස භවංග පතනය නොවිය හැකිය. අතිඉෂ්ට ඉෂ්ට මධ්‍යස්ථ අනිෂ්ට කියා නියමයක් නැත. යම්කිසි අරමුණෙක්හි දොසජවනය වුවොත් ආගන්තුකභවංගය ඒකාන්තයෙන් පතිත වේ. ඊටපසු මූලසෝමනස්ස භවංගය පතිත විය හැකිය. මෙසේ අතිමහන්තාරම්මණයෙහි අතිඉෂ්ට වීමෙන් දොස ජවනයෙන් පසු ආගන්තුක භවංගය ලකුණු කළ හැකිය. මහන්තා රම්මණයෙහි යම්කිසි අරමුණෙක දොසජවනයෙන් පසු ආගන්තුකභවංගය ලකුණු කළ හැකිය. මේ ඒ වීථි දෙක පිළිබඳ විශේෂය දැක්වීමය.

(බ්‍රහ්මයන්ගේ සන්තානයෙහි දොසජවනය නොලැබෙන බැවින් මේ ආගන්තුක භවංග පතිත වන වීථීහු නොලැබෙති. පරිත්තාරම්මණ අතිපරිත්තා රම්මණ වීථීන්හි වනාහි ජවනය ද නොයිපදින බැවින් ආගන්තුක භවංග ලකුණු කිරීම අනවශ්‍යය ආගන්තුක භවංග පිළිබඳ විස්තර කථාව වීථිකාණ්ඩ භාෂාටීකාවේ තදාරම්මණ නියමකාණ්ඩයෙහි දක්වා ඇත)

### පරිත්තාරම්මණ වීථීහු

පරිත්තාරම්මණවීථිය ද වොත්ථපනවාර වශයෙන් එකක්ම වේ. අතීතභවංග වාර සතරක් ඉක්මවන ප්‍රථම පරිත්තාරම්මණ වීථිය අතීතභවංගවාර පසක් ඉක්මවන දෙවැනි පරිත්තාරම්මණ වීථිය. අතීතභවංගවාර සයක් ඉක්මවන තෙවැනි පරිත්තාරම්මණ වීථිය. අතීත භවංගවාර සතක් ඉක්මවන සතරවැනි පරිත්තාරම්මණ වීථිය අතීත භවංගවාර අටක් ඉක්මවන පස්වැනි පරිත්තාරම්මණ වීථිය අතීතභවංගවාර නවයක් ඉක්මවන සවැනි පරිත්තාරම්මණවීථිය වශයෙන් සවැදෑරුම් වේ. ඒ සය අතුරෙන් ප්‍රථම පරිත්තාරම්මණ වීථිය උපදින ආකාරය: රූපාරම්මණ හා චක්‍ෂුර් ප්‍රසාදයෝ එළඹී උත්පාදයේ පටන් අතීත භවංගවාර සතරක් ඉක්මවා චක්‍ෂුර්

ප්‍රසාදයෙහි රූපාරම්මණය ආපාතගතවීමෙන් භවංගචලන භවංගුපච්ඡේද පඤ්චද්වාරාවර්ජිත චක්ඛුර් විඥාන සංප්‍රතෘසන සන්තීරණ ව්‍යවස්ථාපන වාර තුනක් ඉපදී නම් භවංග වාර සතරක් පතිතවන කාලයේ දී රූපරම්මණ හා චක්ඛුර් ප්‍රසාදයන්ගේ සතලොස්ක්ෂණ ආයුෂ සම්පූර්ණ වීම නිසා සතරවැනි භවංගයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ වීථිය

**ප්‍රථම පරිත්තාරම්මණ වීථි**

**උදාහරණය**

තී තී තී තී න ද ප ච සං ණ වො වො වො

භ භ භ භ

**ප්‍රථම පරිත්තාරම්මණ වීථිය නම් වේ**

**විස්තර**

ඉතිරි පරිත්තාරම්මණ වීථි: අතීතභවංග වාර පසක් ඉක්මවා ව්‍යවස්ථාපන වාර තුනක් උපදී නම් භවංග වාර තුනක් වැටෙන කාලයේ දී තුන්වැනි භවංගයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ දෙවැනි පරිත්තාරම්මණ වීථියය. අතීත භවංගවාර සයක් ඉක්මවා ව්‍යවස්ථාපනවාර තුනක් උපදී නම් භවංගවාර දෙකක් පතනය වී දෙවැනි භවංගයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ තෙවැනි පරිත්තාරම්මණ වීථියය. අතීතභවංගවාර සතක් ඉක්මවා ව්‍යවස්ථාපන වාර තුනක් උපදී නම් ප්‍රථම භවංගය ඉපදී ඒ භවංගයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ සතරවැනි පරිත්තාරම්මණ වීථියය. අතීතභවංගවාර අටක් ඉක්මවා ව්‍යවස්ථාපන වාර තුනක් උපදී නම් තුන්වැනි ව්‍යවස්ථාපනයේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ පස්වැනි පරිත්තාරම්මණා වීථියය. අතීතභවංග වාර නවයක් ඉක්මවා ව්‍යවස්ථාපන වාර දෙකක් ඉපදී දෙවැනි ව්‍යවස්ථාපනයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ සයවැනි පරිත්තාරම්ණ වීථියය. යන වීථීන්ද ප්‍රථම පරිත්තාරම්මණ වීථි නයානුසාරයෙන් කියවන්න වීථි උදාහරණය ද දැනගත හැකිය.

ටීකා

**අතිපරිත්තාරම්මණ වීථි**

අතිපරිත්තාරම්මණ වීථිය ද මොඝවාර වශයෙන් එකමය. අතීතභවංගවාර දසයක් ඉක්මවන ප්‍රථම අති පරිත්තාරම්මණ වීථියය. අතීතභවංගවාර එකොළොසක් දොළොසක් තෙලෙසක් තුදුසක් පසලොසක් ඉක්මවන සයවැනි අතිපරිත්තාරම්මණ වීථිය වශයෙන් සවැදෑරුම් වේ. ඒ සය අතුරෙන් ප්‍රථම අතිපරිත්තාරම්මණ වීථිය උපදින ආකාරය මෙසේය: රූපාරම්මණ හා චක්‍ෂුර්ප්‍රසාදයෝ එළඹී උත්පාදයේ පටන් අතීතභවංගවාර දසයක් ඉක්මවා චක්‍ෂුර්ප්‍රසාදයෙහි රූපාරම්මණය ආපාතගත වීමෙන් භවංග චලනය දෙවරක් ඉපදීමෙන් පසු වීථිසිත් නොඉපදී නැවත භවංගය පහළ වී භවංගවාර පසක් උපදී අවසන්හි රූපාරම්මණ චක්‍ෂුර් ප්‍රසාදන්ගේ සතලොස්ක්‍ෂණ ආයුෂය

**ප්‍රථම අතිපරිත්තාරම්මණ වීථි**

උදාහරණය

තී තී තී තී තී තී තී තී තී තී න න

භ භ භ භ භ

සම්පූර්ණ වීම නිසා භවංග චලනයෙන් පසු පස්වැනි භවංගයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ වීථිය ප්‍රථම අතිපරිත්තාරම්මණ වීථිය නම් වේ.

විස්තරඃ-

**ඉතිරි අතිපරිත්තාරම්මණ වීථිඃ-** අතීත භවංග වාර එකොළොසක් ඉක්මවා නම් සතර වැනි භවංගයාගේ භංගය හා එකට නිරුද්ධවන්නා වූ දෙවැනි අතිපරිත්තාරම්මණ වීථියයි. අතීතභවංග වාර දොළොසක් ඉක්මවා නම් තෙවැනි භවංගයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ තෙවැනි අතිපරිත්තාරම්මණ වීථියය. අතීතභවංග වාර තෙලෙසක් ඉක්මවා නම් දෙවැනි භවංගයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ සතරවැනි

අතිපරිත්තාරම්මණ වීථියය. අතීතභවංගවාර තුදුසක් ඉක්මවා නම් ප්‍රථම භවංගයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ පස්වැනි අතිපරිත්තාරම්මණ වීථියය. අතීතභවංග වාර පසළොසක් ඉක්මවානම් දෙවැනි භවංගචලනයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ සයවැනි අතිපරිත්තාරම්මණ වීථියය යන වීථීහු ලැබෙති. වීථි උදාහරණයන්ද සටහන් කළ යුතුය.

**පඤ්චද්වාර වීථි සමූහයඃ-** පූර්වාචාර්යයන් විසින් දක්වන ලද අතිමහන්තාරම්මණ වීථි එකය. මහන්තාරම්මණ වීථි දෙකය පරිත්තාරම්මණ වීථි සයය. අතිපරිත්තාරම්මණ වීථි සයයයි චක්ෂුර්ද්වාර වීථි පසෙළොසකි. සොතද්වාරාදීයෙහිද පසළොස බැගින් ගෙන පඤ්චද්වාර වීථි සමූහය පන්සැත්තෑවක් වෙති. මේ පොතේ වනාහි තදාරම්මණ පතනය නොවන අතිමහන්තාරම්මණ ජවන වාරය හා අභිධර්මාර්ත්ථ සංග්‍රහවේම කෙලින්ම දක්වන ලද ආගන්තුක භවංග පතනය වන වාරයන් පිළිසන්වේය යන සැකය නිසා කියන ලද්දෙහි ඇතුළත් වන බැවින් අතිමහන්තාරම්මණ වීථි තුනය. මහන්තාරම්මණ වීථි සතර බැගින් ඇති බැවින් චක්‍ෂුර්ද්වාරයෙහි වීථි එකුන් විස්සය. එසේ සොත සාන ජිව්හා කාය ද්වාරයන්හි ද එකුන්විස්ස බැගින් වීථි ඇති බැවින් සියල්ල වීථි අනූපසක් ඇත.

**චිත්තස්වරූප ආරම්මණ වස්තු පිළිබඳ විස්තර**

මේ අනූපසක් පඤ්චද්වාරවීථීන්හි ලැබෙන සිත් වනාහි 'සබ්බථාපි පඤ්චද්වාරෙ චතුපඤ්ඤාස චිත්තානි කාමාවචරා නෙව'යි කියන ලද ද්වාර සංග්‍රහ වචනයට අනුව කාම සිත් පණස් සතරම වෙති. 'කාම සිත් 54 සූපණස අතුරෙන් සුදුසු පරිද්දෙන් ලැබෙන සිත් පමණක්ම ලකුණු කරන්න. ධ්‍යාන මාර්ගඵල නොවන බැවින් අපර්ණා හා සම්බන්ධ නොවේ.

අරමුණු වශයෙන් වනාහි වීථි චිත්තයන්ගේ පූරේචාරීවූ අතීතභවංග භවංගචලන භවංගුපච්ඡේද සහ වීථිචිත්තයට පසුව ලැබෙන භවංගයෝ අතීත වූ කර්ම කර්ම නිමිති ගති නිමිති යන තුන අතුරෙන් යම්කිසි එකක් අරමුණ කරති. 'ද්වාරවිමුත්තානඤ්ච

පටිසන්ධි භවංග චුති සංඛාතානං ඡබ්බධම්පි යථාසම්භවං යෙභුයෙ‍යන භවන්තරෙ ඡද්වාරගහිතං පච්චුප්පන්නමතීතං පඤ්ඤත්තිභූතං වා කම්ම කම්මනිමිත්ත ගති නිමිත්ත සම්මතං ආරම්මණං'යි කියන ලද ආරම්මණ සංග්‍රහ වචනයෙන් ලැබෙන අදහස බැලිය යුතුය.

භවංගයෙන් අන්‍ය වූ පඤ්චද්වාරාවර්ජන ආදි කොට තදාරම්මණ අවසන් කොට ඇත්තා වූ වීථිචිත්තයෝ වනාහි සුදුසු පරිද්දෙන් රූපාරම්මණාදි පඤ්චාරම්මණයන් අරමුණු කරති. ප්‍රධාන වශයෙන් වනාහි. 'චක්ඛුද්වාරිකචිත්තානං සබ්බේසම්පි රූප මෙවාරම්මණං, තඤ්ච පච්චුප්පන්නං, තථාසොතද්වාරික චිත්තාදීනම්පි සද්දාදීනි. තානිච පච්චුප්පන්නානෙව'යි කියන ලද ආරම්මණ සංග්‍රහ වචනයට අනුව චක්ෂුර්ද්වාරික වීථිචිත්තයෝ අතීතභවංග වාර දෙකක් තුනක් ආදී වශයෙන් ඉක්මවා චක්ෂුර්ද්වාරයෙහි ආපාතගතවී අනිරුද්ධ වූ ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණය අරමුණු කරති. එසේම සොතද්වාරික වීථිචිත්තයෝ ප්‍රත්‍යුත්පන්න ශබ්දාරම්මණය ද ඝ්‍රාණද්වාරික වීථිචිත්තයෝ ප්‍රත්‍යුත්පන්න ගන්ධාරම්මණයද ජිව්හාද්වාරික වීථිචිත්තයෝ ප්‍රත්‍යුත්පන්න රසාරම්මණය ද කායද්වාරික වීථිචිත්තයෝ ප්‍රත්‍යුත්පන්න ස්ප්‍රෂ්ටව්‍යාරම්මණය ද අරමුණු කරති.

පඤ්චවොකාර භූමියෙහි ලැබෙන්නා වූ චිත්තයෝ චක්ෂුරාදි වස්තු සය අතුරෙන් යම්කිසි එක එකක් ඇසුරු කොට උපදිති. ඒනිසා නිශ්‍රය වශයෙන් වනාහි ඒ ඒ විඥාණය ස්වකීය වස්තුවම ඇසුරු කරයි. ප්‍රධාන වශයෙන් වනාහි 'පඤ්චවිඤ්ඤාණධාතුයො යථාක්කමං එකන්තෙන පඤ්චප්පසාදවත්‍ථූනි නිස්සායෙව පවත්තන්ති' යන කීමට අනු චක්ෂුර්විඥානය චක්ෂුර්වස්තුව ද ශ්‍රොතවිඥානය ශ්‍රොතවස්තුව ද ඝ්‍රානවිඥානය ඝ්‍රානවස්තුව ද ජිහ්වාවිඥානය ජිහ්වාවස්තුව ද කාය විඥානය කායවස්තුවද ඇසුරු කරයි. ඒ නිශ්‍රයෙහි වනාහි ශිෂ්‍යයෝ දූ දරුවෝ ජීවත්වන්නාවූ ගුරු දෙගුරුන්ම ඇසුරුකරත්නාක් මෙන් පඤ්චවිඥානයෝ ඨිතික්‍ෂණයේ දී විද්‍යමාන වූ (අනිරුද්ධ ප්‍රත්‍යුත්පන්න යැයි කියන ලද) පඤ්චවස්තූන් ඇසුරු කරති.

ද්විපඤ්චවිඤ්ඤාණයෙන් අන්‍ය වූ අතීත භවාංග ආදී සිත් කොටස වනාහි තමාට මුලින් මුලින් උපන්නා වූ චිත්තයන් හා සහජාතව උපන් හෘදය වස්තුරූපය ඇසුරු කරති. ප්‍රධාන වශයෙන් වනාහි 'පඤ්චද්වාරවජ්ජන සම්පටිච්ඡන සංඛාතා පන මනොධාතුච (පෙ) අවසෙසා පන මනොවිඤ්ඤාණ ධාතු සංඛාතාච (පෙ) හදයං නිස්සායෙව පවත්තන්ති'යි යන්නට අනුව අතීත භවාංගය තමාට මුලින් උපන් භවංගය හා එකට උපන්නා වූ හෘදය වස්තුව ද භවංගචලන සිත අතීත භවංගය හා එකට උපන්නා වූ හෘදය වස්තුවද, භවංගුපච්ඡේද සිත භවංග චලනය හා එකට උපන් හෘදය වස්තුව ද පඤ්චද්වාරාවරජන සිත භවංගුපච්ඡේදය හා එකට උපන් හෘදයවස්තුව ද (චක්ෂුර් විඥානය වනාහි චක්ෂුර්වස්තුව ඇසුරු කරන බැවින් මෙහි දී සටහන් නොකෙරේ) සම්ප්‍රත්‍යසන සිත චක්ෂුර්විඥානය හා එකට උපන් හෘදය වස්තුවද ඇසුරු කරයි (හෘදය වස්තු රූපය කර්මජ රූපයක් වන බැවින් ප්‍රතිසන්ධික්ෂණයේ පටන් චිත්තයාගේ උද්පාද ඨිතිභංගක්ෂණයක් පාසා නිරන්තරයෙන් උපදී. ඒ නිසා චක්ෂුර්විඥාන සිත හා එකට උපදින හෘදය වස්තුවක් ද තිබිය යුතු බව සිහි කරන්න) සන්තීරණ සිත සම්පටිච්ඡන සිත හා එකට උපන්නා වූ හෘදය වස්තුවය ව්‍යවස්ථාපන සිත සන්තීරණය හා එකට උපන් හෘදය වස්තුවය ප්‍රථමජවන් සිත ව්‍යවස්ථාපනය හා එකට උපන් හෘදය වස්තුවය දෙවැනි ජවනය, පළමු ජවනය හා එකට උපන් හෘදය වස්තුවය මේ ආදී ක්‍රමයෙන් දෙවැනි තදාරම්මණ සිතට පසු භවංගය දෙවැනි තදාරම්මණය හා එකට උපන් හෘදය වස්තුව ඇසුරු කරයි.

### භූමි හා පුද්ගලයා

තදාරම්මණ සහිත වූ ද, දොසජවන පතිතවන්නා වූ ද චක්ෂුර්ද්වාරික වීථි සහ සොතද්වාරික වීථි) එකුන් විස්ස බැගින් ඇත්තා වූ ඝ්‍රාණද්වාරික ජිව්හාද්වාරික කායද්වාරික වීථීයෝය. තදාරම්මණ පතිතවන්නා වූ චක්ෂුර්ද්වාරික වීථි 1 ය. සොතද්වාරික වීථි එකය. දොසජවනය ජවනය වී ආගන්තුක භවංගය පතිතවන්නා වූ (අතිමහන්තාරම්මණ මහන්තාරම්මණ) චක්ෂුර්ද්වාරික වීථි තුනය, සොත ද්වාරික වීථි තුනය සියල්ල 65 සැටපසක් වූ වීථීයෝ

කාම භූමියෙහි පමණක්ම ලැබෙති. රූප භූමියෙහි නොඋපදිති. 'රූපලොකෙපන ඝාණාදිත්තයං නත්ථි, රූපාවචර භූමියං පටිසජවන තදාරම්මණ වජ්ජිතානි'යි කියන ලද වචනය අනුව රූප භූමියෙහි නොඋපදිය හැකි බව දැනගන්න. කිසිත් රූප ධර්මයක් නැත්තා වූ අරූප භූමියෙහි මේ සියලුම පඤ්චද්වාරිකවීථි නොලැබෙති.

චක්‍ෂුර්ද්වාරික වීථි එකුන්විස්සෙහි තදාරම්මණ හා දොසජවනය ජවනය වන වීථි 4 කෙරෙන් ඉතිරි වූ චක්‍ෂුර්ද්වාරික වීථි 15 ය. එසේ සොතද්වාරික වීථි 15 ය. යන මේ වීථි 30 වනාහි කාමරූප භූමි සංඛ්‍යාත පඤ්චවොකාර භූමි 25 විසි පහේ ලැබෙත්. මේ වචනය ස්ථාන දෙකට වෙන් කොට සිඬු කොට කාම භූමියෙහි සියලුම පඤ්චද්වාරික වීථි 95 අනූපස ලැබෙති. රූප භූමියෙහි තදාරම්මණ දොසජවන හැර චක්‍ෂුර්ද්වාරික සොතද්වාරික වීථි 30 පමණක්ම ලැබෙත් යැයි දත යුතුයි.

මාර්ගස්ථ පුද්ගලයා කෙරෙහි එකම චිත්තක්‍ෂණයක් ලැබෙන බැවින් මේ පඤ්චද්වාර වීථි නොලැබෙති. පෘථග්ජනයෝ 4 දෙනාය ඵලස්ථයෝ 4 දෙනාය යන මේ පුද්ගලයන් අට දෙනාගේ සන්තානයෙහිම ලැබෙති. (අනාගාමී හා රහත් සන්තානයෙහි දොසය පහණ ලද බැවින් ආගන්තුකභවංග පතිතය වන වීථි නොලැබිය හැකි බවද සිහිකරන්න)

වීථි චිත්තයාගේ පෙර පසු භවංගයන් විමසා බලා සටහන් කළ යුතුය. කාමභූමික පුද්ගලයාගේ වීථි චිත්තොත්පාදයේ දී කාම භවංග දශය සටහන් කරන්න. රූපී පුද්ගලයාගේ වීථිචිත්තොත්පාදයේ දී රූපභවංග පස සටහන් කරන්න. කාම භවංග දශය අතුරෙන්ද දුගති අහේතුක පුද්ගලයෙක් නම් අකුශල විපාක උපේක්‍ෂා සහගත සන්තීරණ භවංගය සටහන් කරන්න. සුගති අහේතුක පුද්ගලයෙක් නම් කුශල විපාක උපේක්‍ෂා සහගත සනතීරණ භවංගය සටහන් කරන්න. ද්විහේතුක පුද්ගලයෙක් නම් මහාවිපාක ඤාණවිප්පයුත්ත 4න් එක එකක් සටහන් කරන්න. කාමත්‍රිහේතුක හෝ ආර්ය පුද්ගලයෙක් වේ නම් මහාවිපාක ඥානසම්ප්‍රයුක්ත 4 ක් අතුරෙන් එක එකක් ලකුණු කරන්න.

ප්‍රථමධ්‍යානික රූපාවචර පුද්ගලයෙක් නම් රූප විපාක ප්‍රථමධ්‍යානය සටහන් කරන්න. මේ නය ක්‍රමයෙන් භූමිභේදයෙන් පුද්ගලභේදයෙන් කල්පනා කොට පෙර පසු භවංගයන් සටහන් කරන්න.

**මන්දායු කාදි විභාගය**

චක්ෂුර් ප්‍රසාදය කර්මජරූපයක් වන බැවින් 'ඛණෙ ඛණෙ සමුට්ඨාපෙති' යනු කීහෙයින් චිත්තයාගේ උත්පාද ඨිති භංගක්ෂණයක් පාසා නොනැවතීම උපදී. ඒ රූප ධර්මයෝ ඨිතික්ෂණයේ දී ඉතාම බලවත්යැ කීයා ඇති බැවින් චක්ෂුර්විඥාන සිත උපදින කාලයේ ඨිතික්ෂණයේ පිහිටියාවූ ඨිතියට පැමිණියා වූ චක්ෂුර්ප්‍රසාදජාති සියල්ල එකුන් පණසක් වෙති. (රූපයාගේ අයුෂ වූ කුඩාක්ෂණ එක්පණස අතුරෙන් උත්පාදක්ෂණය හා භංගක්ෂණය හැර ඨිතික්ෂණයෙහිම 49 එකුන් පණසක් වෙති. ඒ 49 වර්ගයක් වූ චක්ෂුර්ප්‍රසාද අතුරෙන් කිනම්චක්ෂුර් ප්‍රසාදයෙක්හි චක්ෂුර්විඥානය නිශ්‍රය ලබාද? 'චක්ෂුර්ප්‍රසායෙහි රූපාරම්මණය ආපාතගතවේ' යැයි කී බැවින් කවර චක්ෂුර්ප්‍රසාදයෙක්හි ආපාතගතවේද? චක්ෂුර්ද්වාරවීථියයි කී බැවින් කවරචක්ෂුර්ප්‍රසාදයක් ද්වාරකෘත්‍යය සිදු කරයිදැයි ප්‍රශ්නවෙති. පිළිතුරු මෙසේය. 49 සතලිස් නවයක් වූ චක්ෂුර්ප්‍රසාදයන් අතුරෙන් ප්‍රථම අතීත භවංගය හා එකට උපන්නා වූ චක්ෂුර් ප්‍රසාදයෙහි චක්ෂුර්විඥානය නිඃශ්‍රයලබයි. ඒ ප්‍රසාදයෙහිම චක්ෂුර්ද්වාරවීථියගේ අරම්මණය වන රූපාරම්මණය ආපාතගත වේ. ඒ ප්‍රසාදයම මේ චක්ෂුර්ද්වාරවීථියට ද්වාරකෘත්‍ය සිදුකරයි කියා දැන් ඇතැම් ආචාර්යවරයෝ මතාන්තරයක් දක්වති. ඒ වාදය පිළිබඳව මන්දායුක ආදී වශයෙන් විචාරණය කරන ලදී.

චක්ෂුර්විඥානාදි ද්විපඤ්ච විඥානයන්ගේ නිඃශ්‍රයවස්තුව වෙන් කොට මේ මන්දායුකාදි විභාගය කියන ලද බැවින් ද්විපඤ්චවිඥානය උපදින කාලයේ ඨිතික්ෂණ සමංගී වූ වස්තු රූපයන්ම වෙන්කොට විමසාගත යුතුය. ඒ වස්තුරූපයේ වනාහි අතීතභවංගය පූර්වයෙහි තෙලෙස් වැනි භවංගයාගේ භංගක්ෂණයේ පටන් පඤ්චද්වාරාවර්ජනයාගේ භංගක්ෂණය තෙක් ඒ අන්තරයෙහි ඇතුලත චිත්තයාගේ ක්ෂණයක් ක්ෂණයක් පාසා උපදන්නා වූ

වස්තුරූපයෝ වෙති. එහෙයින් තෙලෙස් වැනි භවංගයාගේ භංගයේ පටන් ආවර්ජනයාගේ භංගක්ෂය දක්වා කුඩාක්ෂණ එක එක බැගින් ගණන් ගැනීමේ දී 49 ජාතියක් ඇති බව දැන ගන්නේය. ඒ සියලුම 49 වර්ගය ද්විපඤ්චවිඥානය උපදින කාලයේ නිරෝධයට නොපැමිණ ඨිතික්ෂණ සමංගීවූවෝම වෙති.

ද්විපඤ්චවිඥානය උපදින කාලයේ එකට උපන් වස්තුරූපය. තෙලෙස්වැනි භවංගයාගේ ඨිතික්ෂණයේ දී ඉපිද පඤ්චවිඥාන උපදින කාලයේ නිරුද්ධ වන්නා වූ වස්තුරූපය. නිරුද්ධ වූ පූර්වපූර්වවස්තුරූපය. අතීත නොඋපන්නා වූ අනාගත වස්තුරූපයෝ වනාහි 'ද්විපඤ්ච විඤ්ඤාණයන්ට තිඃශ්‍රයවේදො" යැයි සැකයක් නැති බැවින් මේ මන්දායුකාදි විභාගයෙහි සටහන් කිරීමට අවශ්‍ය නැත. තවද වස්තුරූපයෝ චිත්තක්ෂණ සතලොසක් ආයු ඇති බැවින් ප්‍රකෘති ස්වභාව වශයෙන් මන්දායු මධ්‍යමායු අමන්දායු කියා විශේෂයක් නැත. නමුත් ඒ ඒ වීථියගේ ආරම්මණ ආයුෂය හා තුලනය කොට මන්දායු ආදී නාම වශයෙන් වෙන් කරන ලදී.

අතීත භවංගයේ පටන් ආපසු ගණන් කිරීමේ දී තෙලෙස් වැනි භවංගයාගේ භංගක්ෂණය පටන් ප්‍රථමභවංගයාගේ භංගක්ෂණය දක්වා ක්ෂණයක් පාසා උපදනා වූ වස්තුරූපයෝ මේ චක්ෂුර්ද්වාරික වීථියගේ අරමුණ වූ රූපාරම්මණය නිරුද්ධනොවෙද්දීම නිරුද්ධ වන බැවින් 'මන්දං ආයුං යෙසන්ති මන්දායුකානි' කියා මන්දායුක නම කියන ලදී. යෙසං - යම්වස්තුරූප කෙනෙකුන්ට, මන්දං ආයුං, ඉතාම අඩුවූ රූපාරම්මණ ආයුෂය, අත්ථි, ඇත්ද, කියා අර්ථ කියන්න. රූපාරම්මණය නිරුද්ධ නොවෙද්දීම වස්තු නිරොධවන ආකාරය මෙසේය:

අතීතභවංගයට මුලින් පළමුභවංගයාගේ භංගය හා එකට උපන්නා වූ වස්තුරූපය. දෙවැනි තදාරම්මණයාගේ ඨිතික්ෂණයේ දී නිරුද්ධ වේ. රූපාරම්මණය අනිරුද්ධව කුඩාක්ෂණ එකක් පමණ ආයුෂ ඉතිරිව තිබේ. ප්‍රථම භවංගයාගේ ඨිතිය හා එකට උපදනා වූ වස්තුරූපාදිය කුඩා ක්ෂණ 2 දෙකක් පමණ ආදි වශයෙන් ආයුෂ ඉතිරිවන ක්‍රමය පිළිවෙළින් දැනගන්න. තෙලෙස් වැනි භවංගයාගේ භංගය හා එකට උපදනා වූ වස්තුරූපය චක්ෂුර්විඥානයාගේ

ස්ථිතික්ෂණයේ දී නිරුද්ධ වේ. රූපාරම්මණය නිරුද්ධ නොවී කුඩාක්‍ෂණ 37 සත්තිසක් පමණ ඉතිරි කොට නිරුද්ධ වේ. මෙසේ මේ වීථියට සම්බන්ධවන රූපා රම්මණයට වඩා අඩු ආයුෂ ඇති බැවින් තෙලෙස්වැනි භවංගයාගේ භංගයේ පටන් ප්‍රථමභවංගයාගේ භංගය දක්වා අන්තරයෙහි උපදනා වූ සියලු ප්‍රසාදවස්තු 37 ට මන්දායුෂ්ක චක්ෂුර්ප්‍රසාද යැයි කියනු ලැබේ.

අතීත භවංගයාගේ ථිතික්ෂණයේ පටන් පඤ්චද්වාරාවර්ජනයාගේ භංගක්ෂණයට පැමිණීම තෙක් ඒ අන්තරයෙහි ක්ෂණයක් ක්ෂණයක් පාසා උපදනාවූ සියලු ප්‍රසාදවස්තුරූප එකොළොස මේ වීථියට සම්බන්ධ වන රූපාරම්මණ නිරෝධයෙන් පසු නිරුද්ධ වීමෙන් 'අමන්දං ආයු යෙසං' කියා අමන්දායුකනාමය කරන ලදී. යෙසං යම්වස්තු රූප කෙනෙකුන්ට රූපාරම්මණ ආයුෂට වඩා නොඅඩුවූ, ආයු, ආයු ජීවිතය අත්ථි - ඇත්තේ ද යයි අතීතභවංගයාගේ ථිතික්ෂණයේ දී උපදනා වූ වස්තුරූපය දෙවැනි තදාරම්මණයෙන් පසු පළමු වැනි භවංගයාගේ උත්පාදක්ෂණයේ දී නිරුද්ධ වන නිසා මේ වීථියේ රූපාරම්මණයට වඩා ආයු ඇති බව දැනගත හැකිය. ඊට පසු ලැබෙන වස්තුරූපයන් ගැනද විමසන්න.

අතීතභවංගය හා එකට උපන්නා වූ ප්‍රසාදවස්තුරූප එක ජාතිය පමණක්ම මේ වීථියට සම්බන්ධ වන රූපාරම්මණය හා එකට නිරුද්ධ වන නිසා රූපාරම්මණයට වඩා දීර්ඝායුද නැත්තා වූ මන්දායුද නැත්තා වූ සමාන මධ්‍යම ආයු ඇති බැවින් 'මජ්ඣිමං ආයු යස්සාති මජ්ඣිමායුකං' යනුවෙන් මධ්‍යමායුක නම තබන ලදී. යස්ස - යම් වස්තුරූපයකට, මජ්ඣිම මධ්‍යම ප්‍රමාණ වූ ආයු - ජීවිතය. අත්ථි ඇත්තේද යි මේ අදහස නිසා මණිසාර මඤ්ජුසාවෙහි:

සත්තතිංස මන්දායුකා
එකංව මජ්ඣිමං මතං,
අමන්දේකාදසාචෙති
විඤ්ඤාතබ්බා විභාවිනා'යි කියන ලදී.

මන්දායුකා - මන්ද්‍රයුෂ්ක ප්‍රසාද රූපයෝ, සත්තතිංස, සත්තිසක් වෙති. මජ්ඣිමං, මධ්‍යමායුෂ්ක ප්‍රසාදය එකං - එකෙක්ම යැයි කියා, මතං - දන්නා ලදී.

අමන්දා - අමන්දායුෂ්ක ප්‍රසාදයෝ, එකාදස - 11 ක් වෙති.

ඉති - මෙසේ, විභාවිනා - පැනවතා විසින් විඤ්ඤාතබ්බා, දතයුත්තාහ,

ඒ සතලිස් නවයක් වූ ප්‍රසාදවස්තුරූප අතුරෙන් තෙල මධ්‍යමායුෂ්ක ප්‍රසාදය මධ්‍යම බැවින් චක්ෂුර්ද්වාර වීථියෙහි චක්ෂුර් විඥානය. සොතද්වාරික වීථි ආදියෙහි සොතවිඥානාදි වශයෙන් විඥාන පසට නිඃශ්‍රය වීමට ඉතාම යොග්‍යවේ.

රූපාරම්මණාදී ආරම්මණ පස තෙල මධ්‍යමායුෂ්ක චක්ෂුර්ප්‍රසාදාදියෙහිම ආපාතගතවී, වීථිචිත්තපරම්පරාවට උප්පාදය පිණිස ද්වාරකෘත්‍යයත් තෙලමධ්‍යමායුෂ්ක ප්‍රසාදයම සිදු කරයි කියා අභිධම්මාවතාරටීකා මණිමඤ්ජුසා ආදීකොට දැන් කාලයේ ඇතැම් ආචාර්ය කෙනෙක් දක්වත් ලු - (මේ භාෂාටීකාවේ අදහස ප්‍රස්ථාන ත්‍රිරාශියෙහි නිඃශ්‍රයප්‍රත්‍යවර්ණණාවෙහි දී බලාගත හැකි වන්නේය.)

අතීතභවංග එකක් ඉක්මවන්නා වූ වීථිය සමඟ පමණක්ම මධ්‍යමායුෂ්ක රූපාදී අරමුණ කෙලින්ම සම්බන්ධ වේ.

සවැනි පරිත්තාරම්මණවීථි උදාහරණය

අතීතභවංග 2ක් 3ක් 4ක් ආදී වශයෙන් ඉක්මවන්නා වූ මහන්තාරම්මණ පරිත්තාරම්මණවීථීන්හි වනාහි අතීතභවංග එකක් වැඩි කළොත් මන්දායුකපක්ෂයෙහි ප්‍රසාද 3 ක් අඩු කරන්න. අමන්දායුක පක්ෂයෙහි තුනක් වැඩි කරන්න. මේ ආදී ක්‍රමයෙන් අතීතභවංග වැඩිවන තරමට මන්ද්‍රයුක පක්ෂය අඩුකරන්න. අමන්දායුක පක්ෂය වැඩිකොට ගණන් ගන්න. මධ්‍යමායුෂ්ක ප්‍රසාදවනාහි පළමුවැනි අතීතභවංගය හා සමානව උපන්නා වූ ප්‍රසාදයම වේ.

මැදවීථීන්හි අඩු වැඩිකම දත හැකිය. අතිපරිත්තාරම්මණවීථියෙහි චක්‍ෂුර්විඥානය පමණවත් නොයිපදින බැවින් ඒ චක්‍ෂුර්විඥානයාගේ නිඃශ්‍රයප්‍රසාද වස්ථුව සටහන් කිරීමට අවශ්‍ය නැත. සොතද්වාරවීථී ආදියෙහිද මේ ක්‍රමයෙන් විමසාගත හැකිය. මේ මන්දායුකාදිය විමසන තැන සංකෙත වර්ණණාවේ අන්කරුනක්ද දැක්වේ. කැමති නම් බලන්න.

පඤ්චද්වාරවීථී සමාප්තයි

### කාමජවන මනොද්වාර වීථී

මනොද්වාර වීථියද කාමජවනවාර අර්ජණාජවනවාර වශයෙන් දෙපරිදි වේ. ඒ දෙක අතුරෙන් කාමජවනවාරය ද සුද්ධමනොද්වාරවීථී තදනුවත්තක මනොද්වාර වීථී වශයෙන් දෙකක් වේ. ඒ දෙක අතුරෙන් සුද්ධමනොද්‍වාරවීථිය ද තදාරම්මණවාර ජවනවාර වශයෙන් දෙපරිදි වේ.

**තදාරම්මණ වාරයඃ-** ඒ දෙක අතුරෙන් තදාරම්මණවාරය ද විභූතාරම්මණ වශයෙන් එකක්ම වේ. ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපාරම්මණයඃ- අතීතානාගත නිෂ්පන්න රූප හා ත්‍රෛකාලික කාමචිත්ත චෛතසිකාරම්මණය වශයෙන් දෙවැදෑරුම් වේ. ඒ දෙක අතුරෙන් ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපය ද අතීතභවංගවාර එකක් ඉක්මවා ආපාතගතවන අරමුණය, අතීතභවංගවාර දෙකක් තුනක් සතරක් පසක් ඉක්මවා ආපාතගත වන අරමුණ වශයෙන් පසක් වේ. ඒ පස අතුරෙන් ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපයෝ ඉපදීමෙන් පසු අතීතභවාංගවාර එකක් ඉක්මවා මනොද්වාරයෙහි ප්‍රකටව ආපාතගතවීමේ දී භවංගචලන භවංගුපච්ඡේද මනොද්‍වාරාවර්ජන ජවන සත්වරක් හා තදාරම්මණ දෙවරක් ඉපදීමෙන් පසු සතරවැනි භවංගයේ දී නිෂ්පන්නරූප අටලොස සතලොස් ක්‍ෂණ ආයු සම්පූර්ණ කළ බැවින් සතරවැනි භවංගයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ වීථිය තදාරම්මණවාර ප්‍රථම විභූතාරම්මණවීථිය නම් වේ. එසේම තදාරම්මණවාර ද්විතීය තෘතීය චතුර්ථ පඤ්චම වීථී වශයෙන් පස් වර්ගයක් වූ විභූතාරම්මණ වීථිහු වෙති අතීතානාගත වූ නිෂ්පන්න රූප හා කාමචිත්ත

චෛතසිකයන් එකළුකක් මනෝද්වාරයෙහි ප්‍රකටව ආපාතගතවීමේ දී වනාහි අතීතභවංග නොලැබී භවංගචලන භවංගුපච්ඡේද මනෝද්වාරාවර්ජන ජවන සත්වරක් හා තදාරම්මණ දෙවරක් ඉපදීමෙන් පසු සුදුසු පරිදි භවංග පතනය වේ.

**කාමජවන මනෝද්වාරවීථි**

සුද්ධ මනෝද්වාරවීථි තදනුවත්තක මනෝද්වාරවීථි පඤ්චද්වාරයනට අනුවර්තනය නොවී කෙවල සුද්ධමනොදවාරයෙහි ආපාතගත වන අරමුණක් අරමුණු කරන්නා වූ වීථිය සුද්ධමනෝද්වාරවීථිය නම් වේ. සුද්ධිකමනෝද්වාර වීථියැයි ද කියනු ලැබේ. සීනු ඝණ්ඨා ආදියකට තට්ටු කරන කල්හි පළමු නාදය අවසන් වූ පසු 'අනුරාවය'යි කියන ලද ශබ්ද පරම්පරාව බොහෝ වේලාවක් පවතින්නාක් මෙන් එක එක ජාතියක පඤ්චද්වාර වීථි ඉපදීමෙන් පසු ඒ වීථියේ අරමුණම නැවත අල්ලාගන්නා වූ මනෝද්වාරවීථියොද ආරම්මණයාගේ බලවත්කම අනුව බොහෝ සෙයින් උපදින්නාහ. ඒ වීථීන්ට 'තදනුවත්තක මනෝද්වාරවීථි' යැයි කියනු ලැබේ. 'තං - ඒ පඤ්චද්වාරවීථියට, අනුවත්තති - අනුකූලවේ. ඉති, ඒ නිසා තදනුවත්තිකා - තදනුවර්තතික නම් වේ.

(වීථි යන ස්ත්‍රීලිංගය අපේක්‍ෂා කොට උපාසිකාපදය මෙන් තදනුවත්තිකා යැයි කියති. අනුබද්ධිකාවීථි යැයි ද කියනු ලැබේ.)

**තදාරම්මණ වාරඃ** මේ තදාරම්මණවාරයේ 'විභූතෙති මහන්තෙව තදාරම්මණමීරිතං' කියන ලද වචනයට අනුව විභූතාරම්මණ එකක් පමණක් ඇත. මේ තදාරම්මණවාරය පිණ්ඩිස සත්තරසායුකව ලැබෙන්නා වූ රූපයන් වෙන් කිරීමේ දී විඥප්ති ලක්‍ෂණ රූපයන් කෙරෙන් ඉතිරිව දෙවිසි රූපයන් පූර්වාචාර්යයෝ වෙන් කළහ. නමුත් සියලු අනිෂ්පන්න රූපයෝ රූප කාණ්ඩයෙහි දක්වන ලද ආකාරයට සුද්ධපරමාර්ථ නොවෙති. තදාරම්මණකෘත්‍යය ඇත්තා වූ මහාවිපාක සහ සන්තීරණයෝ වනාහි සුද්ධපරමාර්ථයන්ම අරමුණු කරත්. ඒ නිසා නිෂ්පන්න රූප අටලොස පමණක්ම මේ

පොත වෙන්කොට දෙයි. තදාරම්මණ චිත්තයෝ කාම ආරම්මණයන් අරමුණු කරන බැවින් අතීත අනාගත නිෂ්පන්න රූපයන් හා ත්‍රෛකාලයට සුදුසු පරිදි ලැබෙන්නා වූ ත්‍රෛකාලික කාමචිත්ත චෛතසිකයන් අරමුණු කරන සයවැනි විභූතාරම්මණ වීථියද මේ තදාරම්මණවාරයෙහි දක්වන ලදී.

**දෙවෙනි විභූතාරම්මණ වීථි ආදිය**

ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපයන් ඉපදීමෙන් පසු අතීතභවංගවාර දෙකක් ඉක්මවා මනොද්වාරයෙහි ප්‍රකටව ආපාතගතවීමේ දී භවංගචලන භවංගුපච්ඡේද මනොද්වාරාවර්ජන ජවන සත්වරක් හා තදාරම්මණ දෙවරක් ඉපදීමෙන් පසු තුන්වැනි භවංගයේදී නිෂ්පන්න රූප අටලොස සතලොස්ක්‍ෂණ ආයු සම්පූර්ණකරන බැවින් තුන්වැනි භවංගයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ වීථිය තදාරම්මණවාර දෙවැනි විභූතාරම්මණවීථිය නම්. මේ නය ඇසුරු කොට තෙවැනි සතරවැනි වීථීන් ද දැනගන්න. මේ වීථීන්හි තදාරම්මණ දෙවරක් පතිත විය යුතු නිසා අතීත භවංග පසකට වඩා නොඉක්ම විය යුතුය. අතීතානාගත නිෂ්පන්න රූපයන් හා ත්‍රෛකාලික කාමචිත්ත චෛතසිකයන් එක එකක් ආපාත ගතවීමේ දී වනාහි ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණයක් නොවන බැවින් අතීතභවංග සටහන් කිරීමට අවශ්‍ය නැත. සප්තරසායුක වශයෙන් ගණන් ගන්නා අරමුණු නොවන බැවින් මෙනම් චිත්තයාගේ භංගය හා එකට නිරුද්ධ වේ යැයි අරමුණු නිරුද්ධ වන ක්‍ෂණය ද දැක්වීමට අවශ්‍ය නැත.

**තදාරම්මණවාර ප්‍රථම විභූතාරම්මණ වීථි උදාහරණය**

**තදාරම්මණවාර සවැනි විභූතාරම්මණ වීථි උදාහරණය**

**ජවනවාර ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපාරම්මණ**

ජවනවාරය ද විභූතාරම්මණය අවිභූතාරම්මණය වශයෙන් දෙපරිදි වේ. ඒ දෙක අතුරෙන් විභූතාරම්මණයද පච්චුප්පන්න නිෂ්පන්න රූපාරම්මණය. ඉතිරි ආරම්මණය වශයෙන් දෙපරිදි වේ. ඒ දෙක අතුරෙන් ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපාරම්මණය ද

අතීතභවංගවාර එකක් ඉක්මවා ආපාතගත වන අරමුණය. අතීතභවංගවාර දෙකක් තුනක් සතරක් පසක් සයක් සතක් ඉක්මවා ආපාතගත වන අරමුණ වශයෙන් සත්වැදෑරුම් වේ. ඒ සත අතුරෙන් ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූප අටලොස උත්පාදනයෙන් පසු අතීතභවංග වාර එකක් ඉක්මවා මනොද්වාරයෙහි ප්‍රකටව අරමුණුවීමේ දී භවංගචලන භවංගුපච්ඡේද මනොද්වාරාවර්ජන ජවන සත්වරක් ඉපදීමෙන් පසු සත්වැනි භවංගයේ දී නිෂ්පන්න රූපයන්ගේ සතලොස්ක්‍ෂණ ආයුෂ සම්පූර්ණවීමෙන් සත්වැනි භවංගයාගේ භංගය හා එකට නිරුද්ධ වන්නා වූ වීථිය ජවනවාර ප්‍රථම විභූතාරම්මණ වීථිය නම්වේ. එසේම ජවනවාර ද්‍රුතිය තතිය චතුත්ථ පඤ්චම ඡට්ඨම සත්තම වශයෙන් සත්වර්ගයක් වූ විභූතාරම්මණ වීථියද, ඒ ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූප අටලොස පැහැදිලි නැතිව ආපාතගත වීමේ දී සත්වර්ගයක් වූ අවිභූතාරම්මණ වීථිය ද සුදුසු පරිද්දෙන් ලැබෙති.

ජවනවාර ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපාරම්මණය

ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපාරම්මණයන් ආපාතගතවීමේ දී බ්‍රහ්මසන්තානයෙහි උපදී නම් විභූතාරම්මණයක්ම වුවත් තදාරම්මණපතනය නොවේ. කාමභූමික සන්තානයෙහි උපන්නේ නමුත් එක එක හේතු නිසා තදාරම්මණ පතනය නොවන විභූතාරම්මණ වීථී ඇතිවිය හැකි බව 'කාමෙජවන සත්තා ලම්බනානං නියමෙසති' යන ගාථා විස්තර කළ භාෂාටීකාවේ දක්වන ලදී. ඒ නිසා ජවනවාරයෙහි විභූතාරම්මණය අවිභූතාරම්මණය කියා අරමුණ දෙකම ලැබිය හැකිය.

ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපයෝ සතලොෂ්ක්‍ෂණ ආයු ඇති බැවින් මෙනම් තැන පටන් ආපාතගත වී මෙනම් චිත්තයකගේ භංගය හා එකට නිරුද්ධ වේ යැයි දැක්විය හැකි බැවින් පාඩමෙහි අතීතභවංග වෙන වෙනම ඉක්මවන ආකාරයේ උදාහරණ දක්වා පෙන්නා දෙන ලදී. ජවනවාර සතක් ජවනය වන බැවින් අතීත

භවංග වාර සතකට වඩා ඉක්මවීම නුසුදුසුය. ඒ නිසා මේ ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපය අරමුණු කරන ජවනවාර වීථීන් විභූතාරම්මණවීථි 7 ය. අවිභූතාරම්මණවීථි සතයැයි නියම කරන ලදී. වීථි උදාහරණය තදාරම්මණ වාරයට අනුව අතීතභවංග සුදුසු ක්‍රමයට වැඩි කොට තදාරම්මණ දෙක නොතබා ලැබෙන පරිදි බොහෝ භවංගයන්ම සටහන් කළ යුතුය.

## අරමුණු දෙකටම අතීතභවංග ලැබිය හැකි ආකාරය

අතීතභවංගවාර බොහෝ ගණනක් ඉක්මවා ආපාතගත වීමෙන් පඤ්චද්වාරික වීථීන් වැනි දුබලවූම අරමුණට අවිභූතාරම්මණය යැයි කියන්නේ නේද? එසේ නම් කුමක් හෙයින් විභූතාරම්මණ අවිභූතාරම්මණ දෙකේදීම අතීතභවංග ඉක්මවන අයුරු සමවිය හැකි දැයි පැනයක් වේ. පිළිතුරු මෙසේය. මනොද්වාර වීථීන්හි දී ආරම්මණයේ ශක්තිය ප්‍රධාන නොවේ. චිත්ත ශක්තියම ප්‍රධාන වේ. අතීතභවංග කොතෙක් ඉක්මවා ආපාතගත වන්නේ නමුත් චිත්ත ශක්තිය බලවත්ව තිබේ නම් විභූතාරම්මණත්වයෙන්ම ආපාතගත වේ. යෝගාවචර කෙනෙක් ප්‍රත්‍යුත්පන්න පෘථුවි ධාතුව අරමුණු කොට කර්මස්ථාන භාවනාව ආරම්භ කරන කාලයේ කර්මස්ථාන අප්‍රගුණ බැවින් අවිභූතාරම්මණත්වයෙන් අතීතභවංගවාර එකක් දෙකක් ආදී වශයෙන් ඉක්මවා ආපාතගත වී කමටහන් වැඩීමෙන් සිත බොහෝ දියුණු වූ කල්හි විභූතාරම්මණත්වයෙන් ආපාතගත වන්නේය. නමුත් ආපාතයේ දී ඇතැම් විටෙක අතීතභවංග වාර එකක් දෙකක් තුනක් ආදී වශයෙන් සුදුසු පරිද්දෙන් ඉක්මවා ආපාතගත වන්නේය. ඒ නිසා විභූත අවිභූත අරමුණු දෙකේදීම අතීතභවංග ඉක්මවන ආකාරය සමාන විය හැකිය.

## අතීතභවංග ලකුණු කරන කාලය ආකාරය

ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණ එක එකක් අරමුණු කොට උදයව්‍යයඤාණ භංගඤාණ උපදින කාලයේ කුඩාක්‍ෂණ එක්වරක් නොඉක්මවා උත්පාදක්‍ෂණයෙහි ද, බොහෝ ක්‍ෂණයක් ඉක්මීමෙන් පසු භංගක්‍ෂණයට පැමිණීමෙන් ද, මනොද්වාරයෙහි ආපාතගත වේ. උපදින ක්‍ෂණයේ දීම ආපාතගත වන්නේ නම් කුඩා චිත්තක්‍ෂණ

එකක් දෙකක් මහචිත්තක්‍ෂණයක් හා කුඩා චිත්තක්‍ෂණ එකක් දෙකක් ආදී වශයෙන් මහාචිත්තක්‍ෂණ කුඩා චිත්තක්‍ෂණ බොහෝ සෙයින් ඉක්මවාද ආපාතගත වන්නේමය. ඒ නිසා අතීතභවංගවාර එකක් ඉක්මවීමෙන් දෙකක් ඉක්මවීමෙන් ආදී වශයෙන් මහාචිත්තක්‍ෂණ ඉක්මවමින් ආපාතගත වන ආකාරය දැක්වීම පලක් නැත. නමුත් පූර්වාචාර්යෝ වීථි පාඩමට අනුව හැකි තරම් මෙනෙහි කොට අතීත භවංගයන් ලකුණු කළහ.

## ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපයෙන් අන්‍ය ආරම්මණයෝ

ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපයකෙරෙන් ඉතිරි වූ චිත්ත චෛතසික රූප නිබ්බාන පඤ්ඤත්ති අරමුණු අතුරෙන් යම්කිසි එකඑකක් ඉතාම ප්‍රකටව ආපාතගත වීමේ දී භවංගචලන භවංගුපච්ඡේද මනොද්වාරාවජ්ජන ජවන සත්වරක් යැයි කියන ලද විභූතාරම්මණ වීථියය. නිබ්බානාරම්මණය කෙරෙන් ඉතිරි වූ අරමුණු අතුරෙන් යම්කිසි එක එකක් අප්‍රකටව ආපාතගත වීමේ දී භවංග චලන භවංගුපච්ඡේද මනොද්වාරාවජ්ජන හා ජවන සත්වරක් යැයි කියන ලද අවිභූතාරම්මණ වීථියය යන වීථි උපදිති.

## ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්න රූපයෙන් අන්‍ය වූ අරමුණු

අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ චිත්තචෛතසිකයෝය. අතීතානාගත නිෂ්පන්න රූප හා අනිෂ්පන්න රූපයෝය. නිබ්බානය පඤ්ඤත්තිය යන මේ අරමුණු අතුරෙන් එක එකක් ආපාතගතවීමේ දී අතීතභවංගය ද සටහන් නොකරන්න. මේ නම් සිතක් හා එකට නිරුද්ධ වේ යැයි විමසීමක් ද අවශ්‍ය නැත. ඒ නිසා වීථි භේදයක් නැත. ප්‍රකට අරමුණක් වුවහොත් විභූතාරම්මණ කියාද අප්‍රකට වුවහොත් අවිභූතාරම්මණ යැයි ද අරමුණු වශයෙන් දෙකක් පමණක්ම ලැබෙති.

මේ වීථීන්ගේ ජවන සත්වරක් යැයි කී වචනය ද ප්‍රකෘතියෙන් ලැබෙන, බොහෝ සෙයින් ලැබෙන ආකාරය දක්වන වචනයකැයි දත යුතුය. යමකප්‍රාතිහාර්ය දක්වන කාල ආදියේ දී ධ්‍යානාංගයන් ආවර්ජනා කරන ප්‍රත්‍යවේක්‍ෂාවීථි මේ ජවනවාර මනොද්වාරවීථිම වෙති. ඒ කාලයේ දී ජවනවාර සතරක් හෝ පසක්ම වෙති.

වැළිදු මේ ජවනවාරයෙහි ආගන්තුක භවංගපතිත වන්නා වූ විභූතාරම්මණ අවිභූතාරම්මණ වීථි ද ලැබිය හැකිය. ඒ වීථීන්ගේ ආරම්මණ සහිත දොසජවනය ජවනාකාරය තදාරම්මණවාර භාෂාටීකාවේ විස්තර කර තිබේ.

### අබ්‍යාකතවාර සොප්නවීථි

සිහිනේ දී දකින්නාක් මෙන් අසන්නාක් මෙන් එක එක අවිභූතාරම්මණයක් ආපාතගත වීමේ දී භවංගචලන භවංගුපච්ඡේද මනෝද්වාරාවජ්ජන වාර දෙකක් තුනක් ඉපදීමෙන් පසු සුදුසු පරිදි භවංග පතනය වේ.

### අව්‍යාකෘතවාර ස්වප්න වීථි

නින්දට වැටුනු කල්හි කිසිත් වීථි සිතක් පහළ නොවේ. භවංග සිත් පමණක්ම පවතී. එහෙත් නින්දේ දී ලේ ධාතුක්ෂොභාදිය නිසා අලුත් අරමුණක් එළඹීමෙන් සිහින පෙනේ. නමුත් සිහින පෙනීමේ දී අත් පා සෙලවීම් දෙඩීම් කායවිඤ්ඤත්ති සහිතවම සිදුවෙන බැව් පෙනේ. ඒ විඤ්ඤප්තිය කාමජවන අභිඥාචිත්තයන්ටම උපදවිය හැකිය. ඒ නිසා තදාරම්මණවාර ජවනවාර ස්වප්නවීථි ද තිබිය යුතුය. ඒ වීථීහු වනාහි මුලින් දක්වන ලද වීථීන්හි ඇතුළත් වෙති. මේ අබ්‍යාකතවාර සොප්නවීථියෙහි වනාහි ජවන් සිත් නැත. සියල්ලම අව්‍යාකෘත සූත්ම වෙති. ඒ නිසා 'සුපිනෙනේව දිට්ඨංවියමෙති කථනකාලෙපි අබ්‍යාකතොයෙව'යි ඤාණවිභංගට්ඨකථාවේ කියන ලදී. මනොද්වාරාවර්ජන දෙවරක් තුන් වරක් උපදීම උපදින බැව් වනාහි මූලටීකා වචනයයි. නමුත් මූලටීකාචාර්යයෝ මේ අව්‍යාකෘත වීථියට රුචි නැත.

### සුද්ධ මනොද්වාර වීථි සමූහය

මෙකී ක්‍රමයෙන් පච්චුප්පන්න නිප්ඵන්න රූපය අරමුණු කරන තදාරම්මණවාර විභූතාරම්මණ වීථි පසය. අතීත අනාගත නිප්ඵන්න රූප හා තෙකාලික කාමචිත චෛතසිකයන් අරමුණු කරන තදාරම්මණවාර විභූතාරම්මණ වීථි එකය. එසේම පච්චුප්පන්න නිප්ඵන්න රූප අරමුණු කරන ජවනවාර විභූතාරම්මණ වීථි සතය.

අවිභූතාරම්මණ වීථි සතය. සෙසු අරමුණු අරමුණු කරන විභූතාරම්මණ වීථියය අවිභූතාරම්මණ වීථිය අබ්‍යාකතවීථිය වශයෙන් සුද්ධ මනොද්වාර සමූහය තෙවිස්සකි.

**චිත්තස්වරූප හා ආරම්මණ වස්තු**

කාමජවන වාරයට අනුව මේ තෙවිස්සක් වූ මනොද්වාර වීථීන්හි ලකුණු කරන ලද සිත් කොටස වනාහි දෙපස්විඤ්ඤාණ දසය හා මනොධාතුත්‍රිකය හැර ඉතිරි කාම සිත් සතළිස් එක වෙති. 'විත්‍ථාරෙන පනෙකචත්තාලීස විභාවයෙ' යන සංග්‍රහ වචනයට අනුව ලැබේ.

තදාරම්මණ පතනය වන විභූතාරම්මණ වීථියෙහි භවංගයෙන් අන්‍ය වූ (ඉතිරි වූ) චිත්තයන්ගේ අරමුණු වනාහි පච්චුප්පන්න නිප්ඵන්න රූපය ද අරමුණු කරති. පච්චුප්පන්න අතීත අනාගත ත්‍රෛකාලික වූ ද කාම චිත්තචෛතසික හා අතීත අනාගත නිප්පන්න රූපය ද අරමුණු කරති.

ඉතිරි ජවනවාර විභූතාරම්මණ අවිභූතාරම්මණ වීථිචිත්තයෝ වනාහි විශේෂයක් නොමැතිව චිත්ත චෛතසික රූප නිබ්බාන පඤ්ඤත්ති සියල්ලම අරමුණු කරති. ප්‍රකටව ආපාතගතවී නම් විභූතාරම්මණ වීථියගේ අරමුණය අප්‍රකටව ආපාතගත වී නම් අවිභූතාරම්මණ වීථියගේ අරමුණය කියා විශේෂය මෙපමනෙකි. පච්චුප්පන්න නිප්ඵන්න රූපයක් වේනම් (ලැබේ නම්) අතීතභවංග පතනය කොට සෙසු ආරම්මණයන්හි දී අතීතභවංග පතනය නොවීමම ද විශේෂයකි. වීථි සන්තතිය නැවතත් සිහි කරන්න.

නිර්වාණය වනාහි විභූතාරම්මණ වීථියකගේම අරමුණකි. නිස්සය වස්තු වනාහි පඤ්චද්වාර වීථි ක්‍රමයටමය.

භූමි හා පුද්ගලයෝ - තදාරම්මණ පතිතවන විභූතාරම්මණ වීථීහු කාම භූමියෙහිම උපදිත්, ඉතිරි ජවනවාර විභූතාරම්මණ අවිභූතාරම්මණ වීථීහු වනාහි අසඤ්ඤසත්වය හැර සියලු භූමි තිසේම සුදුසු පරිදි ලැබෙත්.

පුද්ගලයන්ගේ වශයෙන්ද පුහුදුන් සතර දෙනාය ඵලස්ථ සතර දෙනාය යන මේ අට දෙනා කෙරෙහි උපදිත්. (අව්‍යාකතවාර ස්වප්නවීථි සිත් වනාහි මනුෂ්‍ය භූමියේ පුථුජ්ජන සොතාපන්න සකෘදාගාමීන්ගේ සන්තානවලම උපදිත්, අනාගාමි රහතන් වහන්සේලා හා දිව්‍ය බ්‍රහ්මයෝ සිහින නොදකින්නාහ)

**පූර්වාචාර්ය මතය හා මේ පොතේ මතය**

වීථි පිළිබඳ පොත් ලියූ පූර්වාචාර්යයෝ 'යදි විභූතමාරම්මණං ආපාතං ආගච්ඡති' යනාදී අභිධර්මාර්ථ සංග්‍රහ වචන මාත්‍රයම ප්‍රමාණ කොට විභූතාරම්මණයක් වුවහොත් ඒකාන්තයෙන් තදාරම්මණ පතනය වේ යැයි අදහස් කළහ. මහග්ගත ලොකුත්තර චිත්ත චෛතසික හා නිබ්බාන පඤ්ඤත්ති අරමුණු කිරීමේ දී කාමධර්ම නොවන බැවින් තදාරම්මණ පතනය නොවේ. තදාරම්මණ පතනය නොවූවොත් ඒ අරමුණු අවිභූතාරම්මණමය කියා අදහස් කරති.' ඒ කීමට අනුව නම් බ්‍රහ්මයන්ගේ සන්තානයෙහි තදාරම්මණපතනය නොවිය හැකි තැනදී ඉතාම ප්‍රකටව ආපාතගතවීම ඇත්තා වූ විභූතාරම්මණ වීථි පහළවීමට ඉඩක් නැත.

ඒකාන්තයෙන් චිත්තය ප්‍රභාස්වර වූ බ්‍රහ්මයන් කෙරෙහි කාම පුද්ගලයන්ට වඩා වැඩි වශයෙන් විභූතාරම්මණ ලැබෙති.

වැළිදු නිබ්බානය අවිභූතාරම්මණයෙහි තැබීම ගැන ඉතාම කල්පනාකාරී විය යුතුය. නිබ්බානය අරමුණු කළ හැක්කා වූ කාමජවන වීථි සිත් වනාහි ඉතාම ශක්ති සම්පන්න වූ ප්‍රත්‍යවේක්ෂා චිත්තයෝය. ඒ සිත්වලිනුත් නිබ්බානය නොපැහැදිළිව දැනගන්නේ නොවේ. පැහැදිළිවම දැනගන්නේ වෙයි. මාර්ගඵල සිත් ඉපදීමෙන් පසු තදනන්තරව ඉතාම ප්‍රකටව දැන ගන්නේ වෙයි. මාර්ගවීථි ඵලවීථි නොපැමිණි කල්හි ද නිබ්බානය අරමුණු කළ නොහැකිය. එහෙයින් නිබ්බානය විභූතාරම්මණයක්මය.

මහග්ගත ලොකුත්තර චිත්ත චෛතසික හා පඤ්ඤත්ති අරමුණු අවිභූතාරම්මණයෙහි ලා ඇතුළත් කිරීම ගැන ද කල්පනාකාරී විය යුතුය.

ධ්‍යානයකට සමවැදීමෙන් පසු ඒ ධ්‍යානාංගයන් ආවර්ජනා කිරීමේ දී හා මාර්ගඵලවීථී සිත් ඉපදීමෙන් පසු ඒ මාර්ගපලයන් ආවර්ජනා කිරීමේ දී ද පඨවිකසිණ පඤ්ඤත්තිය අරමුණු කොට කමටහන මුදුන් පැමිණ කාමජවන් ජවනය වන කල්හිද ඒ ආරම්මණයෝ කිමෙක්ද අප්‍රකට වන්නාහු ද ප්‍රකට වන්නාහුමය. ඉතාම ප්‍රකට වූ විභූතාරම්මණයෝමය. ඒ නිසා නිබ්බානය වනාහි එක විභූතාරම්මණයෙකි. අවශේෂ වූ චිත්ත චෛතසික රූප පඤ්ඤත්ති අරමුණු වනාහි විභූත අවිභූත අරමුණු දෙකටම අයිතිය කියා දත යුතුය.

**තදනුවත්තිකවීථි**

තදනුවත්තිකවීථිය ද චක්ඛුද්වාරික වීථියට අනුවර්තනය වන වීථියය සොතඝාන ජිව්හා කායද්වාරික වීථියට අනුවර්තනය වන වීථිය වශයෙන් පස්වැදෑරුම් වේ. ඒ පස අතුරෙන් චක්ඛුද්වාර වීථියට අනුවර්තනය වන වීථියද අතීතග්‍රහණවීථිය සමූහග්‍රහණවීථිය අර්ථග්‍රහණ වීථිය නාමග්‍රහණවීථිය වශයෙන් සතරවැදෑරුම් වේ. ඒ සතර අතුරෙන් අතීතග්‍රහණවීථිය උපදින ආකාරය: චක්ඛුද්වාර වීථියට අනන්තරව සුදුසු පරිදි භවංග පතනයෙන් පසු ඒ චක්ඛුද්වාරික වීථියගේ අරමුණ වූ අතීත රූපාරම්මණය මනොද්වාරයෙහි ආපාත ගතවීමේ දී භවංචලන භවංගුපච්ඡේද මනොද්වාරවර්ජන හා ජවන් සතක්ද (විභූතාරම්මණයක් නම් තදාරම්මණ දෙකක් හා අවිභූතාරම්මණයක් නම් තදාරම්මණ පතනය නොවී) සුදුසු පරිදි භවංගපතනය වේ. ඊට පසු රූපාරම්මණයන් පිඬුකොට අරමුණු කරන්නා වූ සමූහග්‍රහණ වීථිය ද රූපාරම්මණයේ පිහිටි අර්ථ ද්‍රව්‍යය අරමුණු කරන අර්ථග්‍රහණ වීථිය ද බොහෝ සේ ව්‍යවහාර කරන නාම පඤ්ඤත්තිය අරමුණු කරන්නා වූ නාමග්‍රහණ වීථිය ද යන වීථීහු සුදුසු පරිදි උපදිත් ඝාන ජිව්හා කායද්වාරික වීථි පිළිබඳ තදනුවර්තක වීථීහුද මේ ක්‍රමයට ලැබෙති.

සොතද්වාරික වීථියට අනුවර්තනය වන වීථිය වනාහි අතීතග්‍රහණ සමූහග්‍රහණවීථීන්ට අනන්තරයෙහි පළමුකොට නාමග්‍රහණවීථිය උපදීමෙන් පසු අර්ථග්‍රහණවීථිය පහළ වේ.

තදනුවත්තික මනොද්වාර වීථිඃ

අතීත සමූහ අර්ථද්‍රව්‍ය නාමප්‍රඥප්ති යන කීමට අනුව පළමු කොට පච්චුප්පන්න රූප අරමුණ අරමුණ කරන්නා වූ චක්ඛුද්වාරික වීථිය උපදීමෙන් පසු සුදුසු පරිද්දෙන් භවංග සිත් උපදීමෙන් (පසු) නිරුද්ධවූවා වූ අතීතරූපාරම්මණය අරමුණු කොට අතීතග්‍රහණ මනොද්වාරිකවීථිය උපදී. මේ මනෝද්වාර වීථියේ අරමුණ වනාහි විභූතාරම්මණ අවිභූතාරම්මණ දෙවිධියෙන්ම ලැබේ. (අතීත, අතීතාරම්මණය, ගහණ, අරමුණු කිරීම් වශයෙන් ගන්නාවූ, වීථි, වීථිය, අතීතග්‍රහණවීථි නම් වේ.

එක මිනිසෙකු දැකීමේ දී චක්ඛුද්වාරික වීථි එකය. අතීතග්‍රහණ වීථිඑකය යන මේ වීථි යුගලයෙන් මිනිස් සිරුර සම්පූර්ණව දැකීමට නොහැකිය. සිරස පෙදෙස පටන් දකීනම් හිසේ පෙදෙසක වූ රූපාරම්මණය අරමුණු කිරීමෙන් පසු ඒ සිරසේ ප්‍රධාන කොටස් වෙන වෙනම අරමුණු කරන්නා වූ චක්ඛුද්වාරික වීථි අතීතග්‍රහණ වීථි යුගලය බොහෝ වාර ගණනක් ඉපදීමෙන් පසු බලන්නා වූ සියලුම සිරසේ කොටස් පිඩුකොට අරමුණු කරන්නා වූ සමූහග්‍රහණ මනොද්වාරිකවීථිය උපදී. මේ වීථිය ද අතීතරූපාරම්මණය වන කාමධර්මය අරමුණු කරන බැවින් විභූතාරම්මණයක් වී නම් තදාරම්මණය පතනය විය හැකිය. 'රූපාරම්මණ සමූහය' යන වචනය ද පඤ්ඤත්තියක් නොවේ. කොටස් වශයෙන් වෙන් වූ රූපාරම්මණය වෙන් කිරීමෙන් සමූහය කියා ද නොලැබේ. ඒ නිසා රූපාරම්මණ සමූහය යනු පරමාර්ථයක්මය. (සමූහ, අරමුණු සමූහය, ගහණ, ගන්නා වූ වීථිය, සමූහග්‍රහණ වීථි නම් වේ)

ඒ සමූහ ග්‍රහණ වීථීහු ද භවංග අන්තර කොට බොහෝ වාර ගණනක් ඉපදීමෙන් පසු ඒ රූපරම්මණය පිහිටි හිස පිළිබඳ අර්ථ ද්‍රව්‍යය දැනගන්නා වූ අර්ථග්‍රහණ මනෝද්වාර වීථීහු බොහෝ සේ උපදිත්. මේ සිරස පිළිබඳ අර්ථ ද්‍රව්‍ය අරමුණු කිරීමේ දී අර්ථ ද්‍රව්‍යය පඤ්ඤත්ති වන බැවින් විභූතාරම්මණ හෝ වේවා අවිභූතාරම්මණ හෝ වේවා තදාරම්මණ පතනය නොවේ.

ජවනවාර මනොද්වාරික වීථිහුම ලැබෙති. (අත්ථ, අර්ථය, ද්‍රව්‍යය, ගහණ, ගන්නාවූ වීථිය අර්ථ ග්‍රහණ වීථිය නම් වේ.) ඊටපසු ඒ අර්ථද්‍රව්‍යයන්ගේ ලෝකව්‍යවහාරයට අනුව 'හිස' යන නාමය දැනගන්නා වූ නාමග්‍රහණ වීථිය ද බොහෝ වාර ගණනක් උපදී (නාමය යනු පරමාර්ථ ධර්මයක් නොවේ. යම්කිසිවකු විසින් ආදිකොට පනවන ලද්දා වූ ප්‍රඥප්තියම ගෙන නාම පඤ්ඤත්ති යැයි කියන ලදී. ඒ නිසා නාමග්‍රහණ වීථියෙහිද විභූතාරම්මණයක් හෝ වේවා අවිභූතාරම්මණයක් හෝ වේවා තදාරම්මණ පතනයට අවසර නැත. (නාම, නාමපඤ්ඤත්තිය, ගහණවීථි, ගන්නාවීථිය, නාමග්‍රහණවීථි නම් වේ.)

මෙසේ හිස ගැන නාමග්‍රහණය තෙක් වීථිරැස බොහෝ සේ පතනය වී හිසෙන් යට ගෙල අත ඇඟ ආදී ශරීරාංග කොටසුත් දකින්නා වූ වීථි රැසින් වෙන වෙනම දැන ගැනීමෙන් පසු මුළු මිනිස් සිරුර දැනගන්නා වූ චක්ඛුද්වාරිකවීථි ආදිකොට නාමග්‍රහණ වීථි අවසන් කොට ඇති වීථීන් නිසා මනුෂ්‍ය ද්‍රව්‍යය මිනිසාය යන නාම පඤ්ඤත්තිය ඉතා හොඳට දැනගන්නේ වේ.

අර්ථය කුඩාවී නම් කුඩා වශයෙන් ද අර්ථය මහත්වී නම් මහත් වශයෙන් ද වීථීන් ගැන අඩු වැඩි විශේෂය කියා, කියන ලද අර්ථද්‍රව්‍යය හා නාමප්‍රඥපතීන් දැනගත හැකි ආකාරය ද විස්තර කොට බලන්න. අර්ථග්‍රහණවීථිය උපදීමෙන් පසු තදනන්තරව මුලින් ප්‍රසිද්ධ නාමය දැනගන්නා වූ නාමග්‍රහණ වීථිය උපදී. ප්‍රකෘතියෙන්ම (මුලින්ම) මිනිසාට 'මිනිසා යැයි කියන' නාමය නොදන්නා වූ කුඩා ළදරුවන්ට වනාහි නාමග්‍රහණ වීථිය පහළවීමට නොහැකිය. යම්කිසි වස්තුවකට කියන නාමය නොදන්නවුන්ට නාමග්‍රහණ වීථි නොලැබිය හැකි බව දත යුතුය.

ඇතැම් ආචාර්යයෝ වනාහි අර්ථ ග්‍රහණ නාමග්‍රහණ වීථීන්ද පඤ්චද්වාරික වීථියයේ අරමුණට අනුරූප කොට නොගනිත්. රූපාදී ආරම්මණයන්ගේ අර්ථ නාම ප්‍රඥාප්තීන් අරමුණු කරන බැවින් තදනුවර්තික වීථිය නොකියති. සුද්ධ මනොද්වාරික වීථි කියාම කැමති වෙති. මේ පොතේ වනාහි, ආරම්මණ භේදය ඇත්තේ

නමුත් පඤ්චද්වාරික වීථීන්ට සම්බන්ධව උපදනාවූ මනොද්වාරික වීථීන් තදනුවත්තික වීථීයයි කියනු කැමතිය. සියලු පඤ්චද්වාරික වීථි උපන්නත් අර්ථග්‍රහණ නාමග්‍රහණ වීථීහු ලැබෙත් යැයි කිව නොහැකිය. ඇතැම් අවස්ථාවක දී අතීතග්‍රහණ වීථි මාත්‍රයෙන්ම වීථි සන්තතිය සිඳීයාම ඇතැයි සිතමි.

ඝානද්වාරික වීථි ආදියට අනුවර්තනය වන්නා වූ තදනුවත්තික වීථීහු අරමුණු ගන්නා අයුරු මෙසේය. ගන්ධාරම්මණයෙහි සමූහ ග්‍රහණවීථිය පරම්පරා වශයෙන් ගන්නා ලද ගන්ධ සමූහය අරමුණු කරයි. අර්ථග්‍රහණ වීථිය ගන්ධයාගේ පිහිටි ද්‍රව්‍ය අරමුණු කරයි. නාමග්‍රහණ වීථිය 'සැන් සුවඳය' සඳුන් තෙල් සුවඳය' ආදී නාමය අරමුණු කරයි.

රසාරම්මණයෙහි සමූහග්‍රහණ වීථිය පිළිවෙළින් ගන්නා ලද රස සමූහය ද, අර්ථ ග්‍රහණවීථිය රසය පිහිටි කෑම් පීම් ද්‍රව්‍යය ද නාමග්‍රහණ වීථිය 'බත් රසයය, හොඳි රසයය' ආදී නාමය අරමුණු කරයි.

ඵොට්ඨබ්බාරම්මණයෙහි සමූහග්‍රහණ වීථිය පරම්පරා වශයෙන් ස්පර්ශ කරන ලද ඵොට්ඨබ්බ රූසද අර්ථග්‍රහණ වීථිය ඵොට්ඨබ්බාරම්මණය පිහිටි පලස් කම්බලාදි වස්තු ද්‍රව්‍යය ද නාමග්‍රහණ වීථිය පලසය කම්බලය ආදි නාමය අරමුණු කරයි.

**සොතද්වාරිකානුවර්තික වීථීහු:**

යම්කිසිවෙක් 'ගො' යන ශබ්දය කියනු අසන කල්හි එම පච්චුපන්න ශබ්දාරම්මණය අරමුණු කොට සොතද්වාරික වීථිය ඉපදීමෙන් පසු සුදුසු පරිදි භවංග අන්තර කොට අතීත වූ ශබ්දාරම්මණය අරමුණු කරන අතීතග්‍රහණ වීථියයි කියන ලද මනොද්වාරික වීථිය උපදී. මේ වීථි යුගලය වනාහි බොහෝ වාර ගණනක් පුනපුනා උපදී යයි කල්පනා කටයුතුය.

**විස්තර කරමි:**

එක අක්ෂරයකගේ ශබ්දය කෙටි ශබ්දයක් වී නම් එක අසුරුසනක කාලය වේ. දීර්ඝ ශබ්දයක් වී නම් අසුරුසන් දෙකක

පමණ කාලය වේ. එක අසුරුසනක් පමණ කාලයේ දී වනාහි 'එකච්ඡරක්ඛණෙ හි කොටිසතසහස්ස සඞ්ඛා උප්පජ්ජන්ති' යනු හෙයින් කෙළ ලක්ෂයක් පමණ සිත් උපදිය හැකිය. එනිසා 'ගො' යන එකම දීර්ඝ ශබ්දයෙහි මතුමතු උපදනා වූ පච්චුප්පන්න ශබ්දාරම්මණ රාශිය අරමුණු කරන්නා වූ සොතද්වාරික වීථිසමූහය ද, සුදුසු පරිදි භවංග අන්තර කොට අතීත ශබ්දාරම්මණය අරමුණු කරන්නා වූ අතීතග්‍රහණ වීථිසමූහය ද පුනපුනා උපදී යැයි සිතන්න.

මේ එක අකුරෙහි වූ සියලු ශබ්ද සමූහය අරමුණු කරන සමූහග්‍රහණ වීථිය පහළවීමට ඉඩක් නැත. අතීතග්‍රහණ වීථියට අනතුරුව 'ගො'යන නාමපඤ්ඤත්තිය අරමුණු කරන නාමග්‍රහණවීථි බොහෝ වාරයක් උපදී. සොතද්වාරික වීථි අතීතග්‍රහණවීථි උපන්කල්හි ශබ්දසාමාන්‍යය පමණක්ම අසා දතහැකිය. 'ගො' යනුවෙන් හොඳට නියමාකාරයෙන් දත නොහැකිය. මේ නාම ග්‍රහණවීථිය පතිත කාලයේදී 'ගො' යනු කියන වග නියමාකාරයෙන් දැනගනී. නාමග්‍රහණවීථියට අනතුරුව 'ගො' යන ශබ්දයාගේ අර්ථයයි කියන ලද ගවද්‍රව්‍ය අරමුණු කරන අර්ථග්‍රහණ වීථිය උපදී. (මේ ශබ්දාරම්මණ තදනුවර්තිකයේ නාමග්‍රහණ වීථිය මුලින් ද අර්ථග්‍රහණවීථිය පසුවත් උපදන වග සිහියේ තබන්න)

**සද්දං පඨම චිත්තේනා තීතං දුතිය චෙතසා,**
**නාමං තතිය චිත්තෙන - අත්ථං චතුත්ථ චෙතසා**

සද්දං - පච්චුප්පන්න සද්දාරම්මණය, පඨමචිත්තෙන ප්‍රථම සොතද්වාරික වීථිචිත්තයෙන්, අතීතං - අතීත සද්දාරම්මණය දැනගනී. දුතියචෙතසා, දුතිය මනොද්වාරික චිත්තයෙන්, ජානාති, දැනගනී. නාමං නාමපඤ්ඤත්තිය, තතියචිත්තෙන, තෙවෙනි මනොද්වාරික චිත්තයෙන් දැනගනී. අත්ථං අර්ථ ද්‍රව්‍ය පඤ්ඤත්තිය, චතුත්ථචෙතසා, සිවුවැනි මනොද්වාරිකචිත්තයෙන් දැනගනී.

අකුරු දෙකක් තුනක් ආදි වශයෙන් ඇත්තා වූ ශබ්දාරම්මණය අරමුණු කිරීමේ දී වනාහි සමූහග්‍රහණ වීථිය ලැබේ.

පැහැදිලි කරමි: 'බුද්ධ' කියා යමෙක් කියන කල්හි 'බුද්' යි කියවෙන විට පච්චුප්පන්න සද්දාරම්මණය අරමුණු කරන සොතද්වාරික වීථියය. අනතුරුව නිරුද්ධ වූ අතීත සද්දාරම්මණය අරමුණු කරන අතීතග්‍රහණවීථියය යන මේ වීථි යුගලය බොහෝ වාර ගණනක් උපදී. ඉන්පසු 'ධ' යනු උසුරුවන කල්හිද ඒ වීථි යුගලය බොහෝ වාරයක් උපදී. ඉන්පසු අනතුරුව නිරුද්ධ වූ 'බුද්, ධ' යන ශබ්ද දෙක පිඬු කොට අරමුණු කරන සමූහ ග්‍රහණවීථිය බොහෝ වාරයක් උපදී. මේ ක්‍රමයෙන් අකුරු තුනක් ඇත්තා වූ 'සබ්බඤ්ඤූ' ශබ්දයෙහි සොතද්වාරිකවීථි අතීතග්‍රහණවීථි දෙක 'සබ්' යනු අරමුණු කොට බොහෝ වාරයක් ද 'බඤ්' යනු අරමුණු කොට බොහෝ වාරයක්ද 'ඤූ' යනු නිසා බොහෝ වාරයක් ද උපදීමෙන් පසු 'සබ්'බඤ්'ඤූ' යන ශබ්ද තුන පිඬුකොට අරමුණු කරන සමූහ ග්‍රහණවීථිය බොහෝ වාර ගණනක් උපදී මෙසේ අකුරු එකකට වැඩිනම් වීථි යුගල යුගල වැඩිකොට ගණන් ගත යුතුය. මේ සමූහග්‍රහණ වීථි උපන් පසු 'බුද්ධ' කියන්නා වූ ද සබ්බඤ්ඤූ කියන්නා වූ ද නාමපඤ්ඤත්තිය අරමුණු කරන නාමග්‍රහණවීථි බොහෝ වාර ගණනක් උපදී. ඉන්පසු බුද්ධය සබ්බඤ්ඤූය යන ශබ්දයන්ගේ අර්ථය වන බුදුරජාණන් වහන්සේ නමැති අර්ථප්‍රඥප්තිය අරමුණු කරන අර්ථග්‍රහණවීථිය උපදී.

නාමග්‍රහණවීථිය උපන් පසු මේ 'ගො' යන නාමය ඇති ශබ්දය ගව අර්ථයට (ගවයාට) කියන්නේ යැයි මුලදී ඇති කරගෙන තිබෙන ලකුණු අනුව ගව අර්ථය දැනගන්නා වූ අර්ථ ග්‍රහණවීථිය ඉපදිය හැකිය. දෙමළ භාෂාව නොදන්නේ නම් දෙමළ ශබ්දයන් අසා දැනගන්නා වූ නාමග්‍රහණවීථීහු කොපමණ උපන්නත් කවර අර්ථයක්වත් නිවැරැදිව නොදත හැකිය. එසේ නොදත හැකි නිසා පසුව අර්ථග්‍රහණ වීථීහු නොලැබෙතියි කියා දැනගන්න. ඒ ගැන ශබ්දාර්ථභේද චින්තාවෙහි,

**සොතාලම්බනමාපන්නො - සංකෙ තෙන වවත්ථිතො**
**අත්ථස්සඤාපකොසද්දො - නාසන්තෙ කාරණද්වයේ**

යනු කියන ලදී.

සොතලම්බනං, සොතද්වාරික වීථියගේ ආරම්මණොත්පාදයට, ආපන්නො. සංකෙතේන. මේ ශබ්දය මේ අර්ථයට කියා යැයි යන සැලකුම් වශයෙන් වචත්පීතො (පැමිණියා වූ හෝ වේවා) මුලදී දැනගන්නා ලද හෝ වේවා, සද්දො, ශබ්දය තෙම, අත්ථස්ස, අර්ථද්‍රව්‍ය සංඛ්‍යාත අත්‍ථපඤ්ඤත්තිය, ඤාපකො, හගවන්නේය. කාරණද්වයෙ, කණෙහිලා ඇසීමය. මුලදී සලකුණු කොට දන්නා දෙයක් වීමය යන කරුණු දෙක, අසන්තෙ, නැතිනම්, න ඤාපකො, අර්ථය නොහගවන්නේය.

පාලි ශබ්දය සිංහලයන් ඇසීමේ දී පාලි නාමය අරමුණු කරන නාමග්‍රහණවීථියට අනතුරුව සිංහල භාෂාවෙන් 'ගවයා' කියන සිංහල නාමයට පෙරලා අරමුණු කරන, නාමග්‍රහණ වීථියක් ඉපදිය යුතුය. එසේම අනුන්ගේ භාෂාවක් අසන කල්හි තමාගේ භාෂාවේ නාමයට පෙරල පෙරලා දැනගන්නා වූ නාමග්‍රහණ වීථි වැඩිවාර ගණනක් පතනය විය හැකි බවද සිහි කළ යුතුය. මේ වනාහි දැන ගැනීම පිණිස කෙටි හැඳින්වීමකි. ආචාර්යවරයෝ වනාහි, නාමග්‍රහණවීථි හා අර්ථ ග්‍රහණවීථි අන්තරයෙහි 'මේ ශබ්දය මේ අර්ථයට කියති'යි මුලින් සලකන ලද සංකෙතපඤ්ඤත්තිය අරමුණු කරන්නා වූ සංකෙත ග්‍රහණවීථිය - ඒ සංකෙතය හා දැන් පවත්නා ශබ්දයට සම්බන්ධ වූ සම්බන්ධ ග්‍රහණවීථිය, 'මේ ශබ්දය මා විසින් සලකුණු කරන ලද ගව අර්ථයටම කියතියි කියා තීරණය කරන විනිශ්චය වීථීන් ද ඇතුළත් කරන කැමැති වෙති. රූපාරම්මණ තදනුවත්තික වීථියෙහිද අර්ථ හා නාමග්‍රහණවීථි අතරෙහි මේ වීථීහු බොහෝ සේ පතනය විය යුතුය. එහෙත් ඒ සියල්ල සියලු පුද්ගලයන් කෙරෙහි ඉපදීමට නොහැකිය. ඇතැම් ඤාණවන්තයන් කෙරෙහි වනාහි ඇතැම්කලෙක ඉපදිය හැකිය.

# පට්ඨාන ත්‍රී රාශි භාෂා ටීකාවේ

## සිංහල අනුවාදය 1

**"නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස"**

## ත්‍රිරාශි නිදාන කථාව

**පට්ඨානනයඃ**

පට්ඨාන ශබ්දයෙහි 'ප' උපසර්ග පදය නානාප්‍රකාර (නානාවිධ) සංඛ්‍යාත අර්ථය (අර්ථයන්) කියයි. ඨාන ශබ්දය පච්චය ශබ්දයට පරියාය වී කාරණ සංඛ්‍යාත අර්ථය කියයි. හේතුව යනු, ඵලයාගේ උත්පාදයට උපකාර වන ප්‍රත්‍යය ශක්තිය හා ශක්තිමත් ධර්ම රාශියමැයි. 'නානප්පකාරානි ඨානානි එත්ථාති පට්ඨානං' එත්‍ථ, මේ ග්‍රන්‍ථයෙහි, නානප්පකාරානි, නානාප්‍රකාර වූ, ඨානානි, කාරණ සංඛ්‍යාත වූ ප්‍රත්‍යය ශක්ති හා ශක්තිමත් ධර්මයෝ, (සන්ති ඇත්තාහුය; දෙසන ලදහ) ඉති, එහෙයින් ප්‍රත්‍යය ශක්ති ශක්තිමත් ධර්ම රාශිය වදාරා ඇති බැවින්, තං, මේ ග්‍රන්ථය, පට්ඨානං, පට්ඨාන නම් වේ.

**විස්තර කරන්නෙමිඃ** හේතු සය අතුරෙන් එකම මොහ හේතුවෙහි හේතු ශක්තිය ය. අධිපති ශක්තියය සහජාත ශක්තිය මේ ආදී වශයෙන් ඇත්තා වූ ශක්තීන්ගේ වශයෙන් බොහෝ ශක්තීහු ඇත්තාහ. මෙසේ එක එක ධර්මයකට කියන ලද බොහෝ වූ ශක්තීහුද පට්ඨාන පාළියෙහි දේශනා කරන ලදහ. එකම හේතු ප්‍රත්‍යයෙහි ධර්ම වශයෙන් හේතු සයම වෙති. මෙසේ ධර්ම වශයෙන් බොහෝ වූ ශක්තිමත් ප්‍රත්‍යය ධර්ම රැසක් ද පට්ඨාන පාළියෙහි දේසනා කරන ලද්දේ ය. ඒ පට්ඨාන ග්‍රන්ථයෙහි ආවා වූ "මෙනම් ධර්මය මෙනම් ධර්මයට මෙනම් ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ යැයි අවබෝධය දෙන වචන ක්‍රමය පට්ඨාන නය නම් වේ. (සතිමන්ත බන්‍ධුමන්ත කීවා සේ ශක්තිය ඇත්තා වූ ධර්මයෝ සක්ති මන්තයයි කියනු ලැබෙත්.

**ත්‍රිරාශියඃ** පට්ඨාන නයෙහි ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න ප්‍රත්‍යනීක යැයි කියන ත්‍රි රාශිය ප්‍රමාණ වේ. මේ ත්‍රි රාශිය දන්නේ නම්, පට්ඨාන පාළිය ගැන අවබෝධය සුකර වේ. ඒ ත්‍රි රාශිය පිඬුකොට දක්වන 'ත්‍රි රාශිය' නම් වූ බුරුම ස්වරූප පොතට බුරුම අටුවාව යැයි කීම සුදුසු ය. එහෙයින් ත්‍රිරාශිය පිළිබඳ ස්වරූපාර්ථය ප්‍රධාන කොට සංග්‍රහ වචනයට අනුරූපව විස්තර කරන්නෙමි. මේ පට්ඨාන නය විස්තරයෙහි ත්‍රිරාශි ස්වරූපාර්ථයෝ අතිශයින් ප්‍රකට වන්නාහුය.

**ප්‍රත්‍යයඃ** පච්චය පදයෙහි පති+අය කියා පද සිඳිය යුතුයි. පති ශබ්දය 'නිසා' යන අර්ථය කියයි. අය ශබ්දය වනාහි 'ඉපදවීම' යන අර්ථය කියයි. 'පටිච්ච ඵලං අයති එතස්මාති = පච්චයො, එතස්මා - මේ හේතුවෙන්, ඵලං, ඵල නමැති ප්‍රත්‍යොත්පන්න ධර්මය, පටිච්ච, නිසා, අයති, උපදවයි පවත්වයි. ඉති, එහෙයින්, සෝ, ඒ හේතු වූ ධර්මය, පච්චයො, පච්චය නම් වේ. මේ විග්‍රහවෙහි ඵල, ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ට ඉපද පැවැත්මට හේතුවන ධර්මයන්ට ප්‍රත්‍යය කියා කියනු ලැබේ යයි දත යුතු.

(හේතු ධර්මයෙන් තොරව ඵලධර්මයන්ට ඉපදිය නොහැකි බැවින් 'පටිච්ච හේතු ධර්මයන් නිසා' යයි කීය)

මේ පච්චය ශබ්දය අභිධයාර්ථ ශබ්දාර්ථ වශයෙන් 'හේතුව' 'කාරණය' යන අර්ථය කියයි. ලක්ෂණාර්ථ වශයෙන් 'උපකාර' කියන අර්ථය කියයි. නූපන්නා වූ ඵල ධර්මයාගේ උත්පාද යටත් අන්‍ය හේතුවකින් උපදවන ලද ඵල ධර්මයකට ස්ථිතික්ෂණයේ දී 'පැවැත්වීමටත්' අනුබල දීමටත් උපකාර යයි කියති.

**උපමාවක්ඃ** ධනවතෙක් දුගියෙකුට රැකියාවක් දීමත් ලැබුණා වූ රැකියාවෙන් ඉවත් නොකර පැවැත්වීමටත් අනුග්‍රහයයි ලෝකයේ කියන්නාක් මෙනි.

**ප්‍රත්‍යයොත්පන්න හා ප්‍රත්‍යනීක**

"පච්චයතො හේතු ධර්මය නිසා උප්පන්නං, උපන්නා වූ ධර්ම" යන උපකාරක ප්‍රත්‍යය නිසා උපදනාවූ පල ධර්මයට

ප්‍රත්‍යයොත්පන්න යයි කියනු ලැබේ. ප්‍රත්‍යනීක යන පදය වනාහි පච්චනීක යයි පාළියෙහි ආවාවූ පදයය. පච්චනික පදය "පති+අනීක" කියා පද සිඳිය යුතු. පති ශබ්දය විරුද්ධාර්ථය කියයි. අනීක ශබ්දය හස්ථානීක (ඇත් සමූහය) යන තැන මෙන් සමූහ සංඛ්‍යාත අර්ථය කියයි. එ හෙයින් ප්‍රත්‍යයොත්පන්නයට ඇතුළත් නොවී, ප්‍රත්‍යයෝත්පන්නයට විරුද්ධ ධර්ම සමූහයට පච්චනික යයි කියනු ලැබේ.

ඇතැම් ඇදුරු කෙනෙක් ප්‍රත්‍ය ධර්මයාගේ උපකාරය නොලැබ ප්‍රත්‍ය ධර්මය හා විරුද්ධව උපදන බැවින් ප්‍රත්‍යනික යයි කියනු ලැබේ යයි අදහසක් කියති. ඔවුන් කියන ක්‍රමයට වන්නේ නම් මෝහමූලද්වයෙහි මෝහය හේතු ප්‍රත්‍යයෙහි ඇතුළත් වීමෙන් පසු ප්‍රත්‍යනිකයෙහි ද ඇතුළත් වේ. එවිට ඒ මෝහමූලද්වයෙහි මෝහය 'තමාම තමාගේ සතුරා වන ප්‍රත්‍යනීකය වේ' ඒ නිසා ඇතැම් ඇදුරු වචනය හොඳින් විමසිය යුතුය.

"කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති හේතු පච්චයා (පෙ) නහෙතු පච්චයා" ආදී වශයෙන් පාළියෙහිම "හේතු ප්‍රත්‍යය නිසා උපදනා වූ ප්‍රත්‍යයොත්පන්න ධර්මය, හේතු ප්‍රත්‍යය නිසා නොඋපදනා වූ ප්‍රත්‍යනීක ධර්ම යයි" ඉතා පැහැදිලිව ප්‍රත්‍යයොත්පන්නයා හා ප්‍රත්‍යනීකය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දේශනා කොට වදාරා ඇති බැවින් ප්‍රත්‍යයොත්පන්නයාගේ විරුද්ධ ධර්ම රැසට (ප්‍රත්‍යයොත්පන්නයෙහි ඇතුළත් නොවී ප්‍රත්‍යයොත්පන්නයට විරුද්ධ ධර්ම සමූහයට) ප්‍රත්‍යනීක යයි කියන බව නිසැකව අවබෝධ කරගත යුතුයි.

ආරාධනාවඃ පටිච්චසමුප්පාද නය ක්‍රමයෙන් හේතුඵල සම්බන්ධය දල වශයෙන් දැන ගැනීමෙන් පසු පට්ඨාන නයට පැමිණි කල්හි හේතුඵල සම්බන්ධයෙහි මෙනම් ධර්මය මේනම් ධර්මයට මෙනම් ශක්තියෙන් උපකාර වේ යයි සියුම් වශයෙන් දැන ගන්නා බැවින් "කල්ප සම්භාර වූ මහා අවකාස ලෝකය හා සත්ත්වයන්ගේ නාමරූප ස්කන්ධ ශරීරය මවන්නා වූ දෙවියෙක් නැත (සර්වබලධාරී දෙවියෙක් නැත) ස්කන්ධ ශරීරයන්හි සියල්ල කරන්නා වූ හෝ

විඳින්නා වූ කෙනෙක් ජීවාත්මයක් නැත" යන සම්‍යක් දෘෂ්ටිය පැහැදිලිව නිර්මලව අනාත්මතාව ඉතාම ප්‍රකටව අවබෝධ වන්නේය. ඒ නිසා දැන් කියන පට්ඨාන නය ත්‍රී රාශියෙහි ශක්ති පමණින් ඤාණය යොදවා ප්‍රීතියෙන් උත්සාහවත් විය යුතුය.

ප්‍රශ්නඃ

1. පට්ඨාන නම කීමට හේතු කරුණු දක්වා පට්ඨාන පදය විග්‍රහ කරන්න.
2. පච්චය පදය විග්‍රහ කොට පච්චය ශබ්දයාගේ ශබ්ධාර්ථ ලක්‍ෂණාර්ථ දෙක දක්වන්න.
3. 'පච්චයො' උපකාර යයි කීතැන කුමකට උපකාර වේ යයි කියන්නේ ද?
4. 'පච්චයුප්පන්න' පදය විග්‍රහ කොට, පච්චයුප්පන්න නම් ධර්මයන් සැකෙවින් දක්වන්න.
5. ප්‍රත්‍යනීත යනු කුමන ධර්මයක් ද, කිනම් පාලියකින් ගෙන ප්‍රත්‍යනීකයි කියනු ලැබේ ද?

**හේතුප්‍රත්‍ය ත්‍රිරාශ්‍රියඃ** හේතුපච්චයො යන ප්‍රත්‍යයොද්දේශයෙහි ස්වරූපයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයුත්පන්න ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙති. ඒ තුන අතුරෙන් ලෝභ දෝස මෝහ අලෝභ අදෝස අමෝහ යන මේ හේතු ප්‍රත්‍ය ධර්මයෝ සයදෙන හේතු ප්‍රත්‍ය ඇත්තා වූ ධර්මයෝ නම් වෙති. සහෙතුක සිත් එක් සැත්තෑවය, මොහමූල ද්වයෙහි මොහ වර්ජිත චෛතසික දෙපණස්සය, සහේතුක චිත්තජරූපයෝය. සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය. යන මේ ධර්මයෝ හේතුප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයුප්පන්න ධර්මයෝ නම් වෙති. අහේතුක සිත් අටලොසය. ඡන්ද වර්ජ්ජිත අන්‍යසමාන දොළසය මෝහමූලද්වයෙහි මෝහය, අහේතුක චිත්තජරූපයෝය, අහේතුක පටිසන්ධිකර්මජරූපයෝය.

බාහිර රූපයෝය ආහාරජ රූපයෝය. උතුජරූපයෝය, අසඤ්ඤසත්වකර්මජ රූපයෝය. පවත්තිකර්මජ රූපයෝය යන මේ ධර්මයෝ හේතුප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝ නම් වෙති.

**හේතුපච්චයො:** හේතුප්‍රත්‍ය යන්නෙහි, ශක්තිමන්ත වූ හේතු සය ද, ඒ හේතු සයෙහි ශක්තිය ද ලැබේ. පැහැදිළි කරන්නෙමි. ලොකු ගස්වල මුදුන් මුල් තිබේ. ඒ මුදුන් මුල්වලින් සම්පූර්ණ ගස නොවැටී ස්ථිරව පිහිටා දියුණුවට පත්වේ. ඒ මුදුන් මුලෙහි සම්පූර්ණ ගස නොවැටී ස්ථිරව පිහිටා දියුණුවට පත්කළ හැකි ශක්ති විශේෂයක් ඇත්තාක් මෙන්, ලෝභාදී හේතු සයෙහි ද සම්ප්‍රයුක්ත ධර්මයන් ස්ථිරව පිහිටුවිය හැකි ශක්ති විශේෂයක් ඇත. විස්තර කරන්නෙමි. යම්කිසි ඉෂ්ටාරම්මණයෙක්හි ලෝභ නමැති මූලය උපන්නේ නම් සියලුම සම්ප්‍රයුක්ත ධර්මයෝ ඒ අරමුණෙහි ශක්තිමත් වෙති. ලෝභ මූලය ශක්තිමත් වූ පමණට සම්ප්‍රයුක්ත ධර්මයෝ ශක්තිමත්ව උපදිති. ලෝභමූලය බලවත් වීමෙන් චේතනාව බලවත්වීම නිසා අනාගත විපාක දෙන කාලයේ දී ද බොහෝ දුක් විපාක ලෝභය මුල් වූ බලවත් කර්මය විසින් හොඳටම ලබාදෙයි. දෝසාදිය මුල් වූ තන්හි ද මේ නය ක්‍රමය මැයි. මෙසේ මුදුන් මුලකට බඳුවූ සම්බන්ධ අරමුණෙහි සම්ප්‍රයුක්ත ධර්මයන් ස්ථිරව පිහිටුවීමට සමර්ථ වූ ශක්ති විශේෂය හේතු ශක්තිය නම් වේ. මේ ශක්ති විශේෂයෙන් උපකාර නොලබන්නාවූ අහේතුක චිත්තයෝ වනාහි මුල් නැති බැවින් සුළඟට කම්පා වෙන්නා වූ දියසෙවෙල මෙන් සම්බන්ධ අරමුණෙහි සම්බන්ධ කෘත්‍යයෙහි ස්ථිරව පිහිටිය නොහැකිය.

මුදුන් මුල තම ගස - යහතින් තිර කරන ලෙස
නම් රූ දමුත් සහදෑ - තර කරන සැත් හේතු නම්

**රූපයනට උපකාරවන ආකාරය:**

හේතු සය සහජාත චිත්තචෛතසිකයන්ට හා චිත්තජ රූප පටිසන්ධිකර්මජ රූපයනට උපකාරක වන බැවින් සම්බන්ධි අරමුණෙහි ශක්තිමත්ව සහජාත චිත්ත චෛතසිකයන්ට අනුග්‍රහ කරන්නාසේ රූපයන්ටත් ස්ථිරව පිහිටීමට උපකාර කළ හැකි නොවේද, පිළිතුරු මෙසේය. රූපයෝ අනාරම්මණික බැවින්

සම්බන්ධී අරමුණෙහි බලවත් වීමට රූප ධර්මයන්ට උපකාර විය නොහැකිය. හේතු ශක්තියෙහි ඇත්තා වූ ධර්මයන් හා එකට උපදනා බැවින් පමණක්ම හේතුප්‍රත්‍යයොත්පන්න ධර්මයන් කෙරෙහි රූප ධර්මයෝ ඇතුලත් වෙති.

**උපමාවක්:** එක් පොහොසත් (බලවත්) මිනිසෙක් ගෙදර හා ගෙවැස්සන් පාලනය කිරීමේ දී ඒ පුරුෂයා නිසා ගෙදර අඹුදරුවෝ යහතින් බලවත් වූයේ නමුත් ගෙදර විශේෂ බලයක් නොලබයි. නමුත් ඔහුගේ පාලනය නිසා ගෙයද ඊට ඇතුළත් වන්නාක් මෙනි. (ගෙදර ප්‍රධානියා මෙන් හේතු ධර්මයෝද, අඹුදරුවන් මෙන් සහජාත චිත්ත චෛතසිකයෝ ද, ගෙය මෙන් චිත්තජ රූප පටිසන්ධි කර්මජරූපයෝ සැසඳෙති. සහජාත කම්ම ඉන්ද්‍රිය. ධ්‍යාන මග්ග ප්‍රත්‍යයෝ රූපයන්ට උපකාර වීමේදීත් මේ ක්‍රමය මැයි.)

**නව නය ක්‍රමයක්:** එක රූපා රම්මණයෙක්හි ලෝභ උපදින විට දැසත් ඒ රූපාරම්මණයෙහි තදින් ඇද ගනී. එමෙන් රූපාරම්මණයෙහි දැස තදින් ඇදගෙන සියලු ශරීරය උපදවීමට ලෝභ හේතුව චිත්තජ රූපයන්ට හේතු ශක්තියෙන් උපකාර කරමින්ම උපදී. දෝස හේතුව උපකාර වීමේ දී කෙනෙකු කෙරෙහි මුළු සිරුර ගසනාකාරයෙන්ද රෞද්‍රාකාරයෙන් ද (රූපඋපදී) මෝහ හේතුව උපකාරවීමේ දී මෝඩයකුගේ ආකාරයෙන් (රූප උපදී) අලෝභාදි හේතු උපකාරවීමේ දී ඉටු අනිටු ආදි ආරම්මණයන්හි ඇලුම් ගැටුම් ආදියත් නැත. දෝසයත් නොයිපද ඤාණය නිසා මුළු සිරුර සැහැල්ලු සන්සිඳුනු ආදි ආකාරයෙන් ද සහජාත චිත්ත චෛතසික රූපයන්ට උපකාර වෙමින් උපදිති. (සහජාතාදීහු උපකාර කිරීමේ දී ද සුදුසු පරිදි කල්පනා කටයුතුය)

**විග්‍රහ:** "හිනොති පතිට්ඨාති එත්ථාතිහෙතු" එත්ථ, මේ ධර්යෙහි, හිනොති පතිට්ඨාති - ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝ පිහිටත්, ඉති ඒ නිසා හෙතු, හේතුනම් වේ, මෙතැන හෙතු ශබ්දය 'කාරණ' නම් වූ අර්ථය නොකියයි. සම්බන්ධඵල ධර්මයාගේ පිහිටීමට ප්‍රධානව උපකාර නමැති 'මූල' අර්ථය කියයි. "හේතුච සො පච්චයො චාති හෙතු පච්චයො" හේතුච, හේතු වූයෙත් සො, ඔහුමය. පච්චයොච, ප්‍රත්‍යය (උපකාර) වූයෙත් ඔහුය.

ඉති ඒ නිසා, හේතු පච්චයො, හේතුපච්චය නම්වේ. මේ විග්‍රහවෙහි ශක්තිමන්ත නම් වූ හේතු සය පමණක්ම ප්‍රධානව ලැබෙති. නමුත් මිනිසාය මිනිසාගේ ශක්තියයි කී තන්හි මිනිසා යනු එක ශරීරයකි. මිනිසාගේ ශක්තිය යනු ඔහුගේ චිත්ත ශක්ති යැයි කියා පදරුත් ගත්තා සේ, මෙහි දී හේතු ශක්තිය හා ශක්තිමන්ත ප්‍රත්‍යය ධර්මයන් වෙන් කරනු නොලැබේ. ලෝභය යනු ආශාකරන ස්වභාවයකි. ලෝභයේ හේතු ශක්තිය ද සම්බන්ධ අරමුණෙහි ස්ථිරව පිහිටන්නා වූ ආශා කිරීමේ ස්වභාව මැයි. මෙසේ ශක්තිය හා ශක්තිමන්ත ධර්මයන් වෙන්කිරීමක් නොලැබෙන බැවින් "හේතුච සො පච්චයොච"යි කියන ලද විග්‍රහවෙහි ශක්තිමන්ත ධර්මයන් මුඛ්‍ය වශයෙන් කීවේ නමුත් ඒ ධර්මයන්ගේ හේතු ශක්ති විශේෂයම ස්වරූපාර්ථවෙති. ඒ එසේමය, කුසලාධම්මා අකුසලාධම්මා ආදී වශයෙන් ඇත්තා වූ ධම්මසංගණී මාතෘකා උද්දේශයෙහි ස්වරූප ධර්මය ප්‍රධාන කොට දක්වන්නා සේ මේ හේතුපච්චයො ආරම්මණ පච්චයො ආදී උද්දේශයෙහි ස්වරූප ධර්මයන් ප්‍රධාන කොට දක්වන්නේ නොවේ. ඒ ඒ ධර්මයන්ගේ උපකාරක ශක්ති ඇත්තා වූ ශක්ති විශේෂයම ප්‍රධාන කොට දක්වනු ලැබේ. ඒ නිසා ප්‍රත්‍ය ක්‍රමයෙහි ශක්තියම ප්‍රධානාර්ථය කටයුතුය.

(පට්ඨානමූලටීකා වචනය) ඉධාපි වා "හේතුච සෝ පච්චයොචාති" ධම්මෙනෙව ධම්මසත්තිං දස්සෙති. නහි හේතුපච්චයො චාති ආදිකො උද්දේසෝ කුසලාදි උද්දේසොවිය ධම්මප්පධානො අථබො ධම්මානං උපකාරප්පධානොති"

පච්චයුද්දෙස (පච්චය = ප්‍රත්‍යයන්ගේ+උද්දේස = සංඛෙප ස්වරූප දැක්වෙන පාලිය) පට්ඨාන පාලියෙහි "හේතුපච්චයො ආරම්මණ පච්චයො - පෙ - අවිගත පච්චයො"යි සූවිසූ ප්‍රත්‍ය ස්වරූප මාත්‍රයක්ම දැක්වෙන පාලිය පච්චයුද්දෙස නම් වේ. ඊට පසු හේතු හෙතු සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානඤ්ච රූපානං හේතු පච්චයෙන පච්චයො" ආදී වශයෙන් විස්තර දැක්වෙන පාලිය පච්චයනිද්දේස පාලිනම් වේ. මේ ත්‍රිරාශිපොතෙහි පච්චයුද්දේසය මුල්කොට දක්වන ලද බැවින් "හේතු පච්චයො යන ප්‍රත්‍යයොද්දෙසයෙහි" යයි දක්වන ලදී."

ස්වරූපයෝ-පෙ-තෙවැදෑරුම් වෙති: හේතු පච්චයො යන ප්‍රත්‍යයොද්දෙශයෙහි ප්‍රත්‍යය, ප්‍රත්‍යයොත්පන්නය. ප්‍රත්‍ය නීකයන තුනම නොලැබිය හැකිය. හේතු සයයි කියන ලද ප්‍රත්‍ය ධර්ම කොටස පමණක්ම ලැබෙති. නමුත් ඒ ප්‍රත්‍යයන් හා සම්බන්ධ වී උපකාර ලබන්නා වූ ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝද උපකාර නොලබන්නා වූ ප්‍රත්‍යනීක ධර්මයෝද එකගොඩට කියන ලද බැවින් "හේතු පච්චයොයි කියන ලද ප්‍රත්‍යයොද්දේශයෙහි ස්වරූපයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නය ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙත්" යැයි කියන ලදී. ප්‍රධාන වශයෙන් නම් "හේතුපච්චයොයි කියන ලද ප්‍රත්‍ය යොද්දෙශය කීමේ දී ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නය ප්‍රත්‍යනීක යන තුන අවබෝධවේ යැයි කියනු ලැබේ.

ප්‍රත්‍යයෙහි ඇත්තා වූ ධර්මයෝ නම් වෙති, තීන්ත කුඩුවෙහි කටු පෑන දමා ඇතැයි කීවොත් තීන්ත කුඩුවෙහි කටුපෑන ඇත යන අදහස ගන්නේ යම් සේද එසේ ඒ ඒ ප්‍රත්‍ය ශක්තියට ඇතුල් කොට තැබුවාක්මෙන් ප්‍රත්‍ය ශක්ති ඇත්තා වූ ධර්මයන්ට ප්‍රත්‍යයෙහි ඇත්තා වූ ධර්යෝ යැයි කියති.

ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ, (මේ හේතුප්‍රත්‍යයෙහි ප්‍රත්‍ය ධර්ම රැස පැහැදිළිය) ප්‍රත්‍යයොත්පන්නයෙහි මෝහමූලද්වයෙහි මෝහය වර්ජිත කළේ නමුත් ලෝභමූල දෝසමූලයන්හි යෙදෙන්නා වූ මෝහය ඇති බැවින් චෛතසික දෙපණස යැයි කීය. චිත්තජ රූපයෝද සහේතුක චිත්තයන් නිසා උපදින රූපයෝය. අහේතුක චිත්තයන් නිසා උපදින රූපයෝය යන දෙකොටස අතුරෙන් අහේතුක චිත්තජ රූපයන් වර්ජිත කොට "සහේතුක චිත්තජ රූපයයි" කීය. කර්මජ රූපය ද පටිසන්ධි කාලයේ උපදින කර්මජරූපයෝය. පවත්ති කාලයේ උපදින කර්මජ රූපයෝය යන දෙක අතුරෙන් පවත්ති කර්මජ රූප වර්ජිත කරන බැවින් ද, පටිසන්ධි කර්මජ රූප අතුරෙන් ද, සහේතුක පටිසන්ධි සිත් හා උපදනාවූ කර්මජ රූපයෝය. අහේතුක පටිසන්ධි සිත් හා උපදනා වූ කර්මජ රූපයෝය යන දෙකොටස අතුරෙන් අහේතුක පටිසන්ධි කර්මජ රූපයන් වර්ජිත වන බැවින් ද, "සහේතුක කර්මජරූප" යයි කීය. (අහේතුක චිත්තජ රූප හා අහේතුක පටිසන්ධි කර්මජ

රූපයෝ හේතු ධර්ම සය හා සහජාතව නොඋපදනා බැවින් ප්‍රත්‍යනීකයෙහි ඇතුළත් වන්නාහ. පවත්ති කර්මජ රූපයන් ගැන කරුණු දක්වන තැන විස්තර ප්‍රකට වන්නේය)

ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න උපදනාකාරය: ප්‍රත්‍යය ප්‍රත්‍යයුප්පන්න උපදින විට හෙතු ධර්ම සයම සහේතු සිත් චෛතසික චිත්ත රූප පටිසන්ධි කර්මජ රූපයනට නිකරුණේ එකවරටම උපකාර වන්නේ නැත. එකට උපදනා වූ ධර්මයන්ටම උපකාර වෙති. චෛතසික සම්ප්‍රයෝගය හොඳට දන්නේ නම් ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නයන් උපදනාකාරය අවබෝධකර ගැනීමට පහසුය. ඒ නිසා ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න උපදින ක්‍රමය සවිස්තරව නොදක්වා නයමාත්‍රය පමණක්ම දක්වන්නෙමි. ආචාර්යවරයන්ගෙන් චිත්තයන් හා යෙදෙන ක්‍රමයන් විචාරා දත යුතුයි.

ලෝභ මූල ප්‍රථම චිත්තයෙහි සම්ප්‍රයෝග චෛතසික 19. එකුන්විස්සකි. ඒ ලෝභමූල ප්‍රථම චිත්තයෙහි ඇත්තා වූ ලෝභය ප්‍රත්‍ය නම්. ලෝභය හා යෙදෙන චිත්තචෛතසිකයෝද ලෝභමූල ප්‍රථම සිත නිසා උපදින චිත්තජ රූපයෝද ප්‍රත්‍යයොත්පන්නයෝය. ඒ සිතෙහි ඇත්තා වූ මෝහය ප්‍රත්‍ය නම්. මෝහය හා යෙදෙන සිත් චෛතසිකයෝ හා චිත්තජ රූපයෝ ප්‍රත්‍යයෝත්පන්නයෝය. (ලෝභය ප්‍රත්‍යය වන විට මෝහය ප්‍රත්‍යයොත්පන්න වේ. මෝහය ප්‍රත්‍යය වන විට ලෝභය ප්‍රත්‍යයෝත්පන්න වේ යයි ප්‍රත්‍යයන් මාරුවී උපකාරවන අයුරු සිහිකරන්න)

මහාකුශල් ප්‍රථම චිත්තයෙහි නියතයෝගී චෛතසික 33 තෙතිසකි. ඒ ප්‍රථම මහා කුශල් සිතෙහි ඇත්තා වූ ආලොභය ප්‍රත්‍යය නම්. අලෝභය හා යෙදෙන්නා වූ චිත්තචෛතසිකයෝ ද ප්‍රථම මහාකුශල සිත නිසා උපදනා වූ චිත්තජ රූපයෝද ප්‍රත්‍යයෝත්පන්නයෝය. (අදෝස අමෝහයන්ද මේ නය ක්‍රමයෙන් කියන්න. මේ ප්‍රථම සිතෙහි අලොභ අදෝස අමෝහ හේතු ධර්ම තුන ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් මාරුවී ඔවුනොවුන්ට උපකාර වෙති. විරති අප්‍රමාණයන් සම්ප්‍රයෝග වන කල්හිද යෙදෙන චෛතසික ධර්මයන් ප්‍රත්‍යයොත්පන්න ධර්මයන් කෙරෙහි ඇතුලත් කොට කියන්න)

පටිසන්ධික්‍ෂණය ඇතිව මහාවිපාක ප්‍රථම චිත්තය හා චෛතසික 33 තෙතිස උපදින කාලයඃ ඒ ප්‍රථම මහා විපාක සිතෙහි අලෝභය ප්‍රත්‍යය නම්. අලෝභය හා සහජාත වන චිත්ත චෛතසික හා සහජාත කර්මජරූපයෝ ප්‍රත්‍යයොත්පන්නයෝ වෙති (අදොස අමෝහයන්ද මාරුකර ප්‍රත්‍යයන් දක්වන්න. අරූපභූමියෙහි උපදනා වූ හේතු රූපයන්ට උපකාර නොවන බැව් ද සිහිකරන්න)

**ප්‍රත්‍යනීකයඃ** හේතු ධර්මයන් හා එකට ඉපදීමක් නැති ධර්මයන්ට හේතු ශක්තියෙන් උපකාර නොලැබෙන බැවින් ඔවුන් හේතුප්‍රත්‍යනීකියෙහි ඇතුළත් කරති. 'පච්චනීය' පට්ඨානපාලියෙහි වදාරා ඇති ක්‍රමයට මේ ප්‍රත්‍යනීකයෙහි රූපධර්ම පමණක්ම වෙන වෙනම නම් වශයෙන් වෙන්කොට දැක්වෙති. එහි (ඒ ප්‍රත්‍යනීකයෙහි) අහේතුක චිත්ත චෛතසික අහේතුක චිත්තරූප අහේතුක පටිසන්ධි කර්මජරූපයන් අවබෝධය. බාහිර රූප යනු සත්ත්ව සන්තානයෙන් පිටත වූ වන, පර්වතාදියෙහි ඇති අනින්ද්‍රිය බද්ධ උතුජරූපයෝය. ආහාරජරූප යනු සත්ත්වසන්තානයෙහි අනුභවකරන ආහාරයෙන් ජනිත වන්නා වූ රූපයෝය. උතුජරූප යනු ද සත්ත්ව සන්තානයෙහි සෘතුවෙන් උපදනා වූ රූපයෝය. මේ උතුජ රූපයට ඉන්ද්‍රිය බද්ධ උතුජ රූපයයි කියනු ලැබේ. (ජීවිතින්ද්‍රිය හා අසම්බන්ධ වූ අවිඤ්ඤාණක රූපයට අනින්ද්‍රියබද්ධ කියාද, ජීවිතින්ද්‍රිය සම්බන්ධ වූ සවිඤ්ඤාණක රූපයට ඉන්ද්‍රිය බද්ධ රූප යැයිද කියනු ලැබේ)

(මූලටීකාව) බාහියන්ති එතෙන අනින්ද්‍රියබද්ධ රූපං දස්සේති. පුන ආහාර සමුට්ඨානං උතුසමුට්ඨානන්ති එතෙහි සබ්බං ඉන්ද්‍රිය බද්ධං ආහාර උතුසමුට්ඨානරූපං"

අසඤ්ඤසත්ත්ව කර්මජරූප යනු අසඤ්ඤසත්ත්ව බ්‍රහ්මසන්තානයෙහි පූර්වකර්මයෙන් පටිසන්ධි පවත්ති කාලයන්හි උපදනා රූපයෝය. (අසඤ්ඤසත්ත්ව උතුජරූප වනාහි ඉන්ද්‍රිය බද්ධ උතුජ රූපයන්හි ඇතුළත් වෙති) ප්‍රවෘත්ති කර්මජරූප යනු කාම භූමියෙහි හා රූප භූමියෙහි සත්ත්ව සන්තානයන්හි පටිසන්ධි චිත්තයාගේ ඨීතික්‍ෂණයේ පටන් ප්‍රවෘත්ති කාලයෙහි ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා උපදනා වූ කර්මජ රූපයෝය. (අසඤ්ඤ සත්ත්ව

කර්මජ රූපයෝ වනාහි වෙන් කරන ලද මේ ප්‍රවෘත්ති කර්මජ රූපයන්හි ඇතුළත් නොකට යුතුය. ප්‍රතිසන්ධි කර්මජරූපයෝ චිත්තය හා එකට ඉපදීම් පිහිටීම් වශයෙන් සහජාත හේතුන්ගේ උපකාරය ලබති. ප්‍රවෘත්ති කර්මජ රූපයෝ වනාහි සිත හා සම්බන්ධයක් නැත්තාහ. පූර්ව වූ කර්මයම සම්බන්ධය වේ. ඒ නිසා කර්ම ශක්තිය ඇතිතාක්ම සිත නැතත් නිරෝධයට සමවත් කාලයේ දී ඒ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ උපදිති. ඒ නිසා ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ප්‍රත්‍යයොත්පන්නයෙහි ඇතුළත් නොවී ප්‍රත්‍යනීක වන්නාහ.

(පට්ඨාන පච්චය නිද්දේස අට්ඨකථාව) පටිසන්ධියංහි කම්මජ රූපානං චිත්තපටිබද්ධා පවත්ති. චිත්ත වසේන උප්පජ්ජන්තිච තිට්ඨන්තිච /පෙ) පවත්තියං පන තෙසං චිත්තෙ විජ්ජමානෙපි කම්ම පටිබද්ධාව පවත්ති නචිත්තපටිබද්ධා. අවිජ්ජමානෙචාපි චිත්තෙ නිරෝධං සමාපන්නානං උප්පජ්ජතියෙව.

අභ්‍යාස ප්‍රශ්නඃ

1. හේතුශක්තිය උපමාවක් හා ගලපා දක්වන්න.
2. හේතු ධර්මයො රූපයන්ට උපකාර වන ක්‍රම දෙකක් දක්වන්න.
3. හේතු යන්නෙහි කාරණාර්ථය, මූලාර්ථය යන දෙකෙන් කුමන අර්ථයක් ගන්නේද?
4. හේතු පච්චයො යනාදියෙහි ශක්ති, ශක්තිමන්ත දෙක අතුරෙන් කුමක් ප්‍රධාන වශයෙන් ගන්නා ලද්දේද?
5. කිනම් පාලියකට පච්චයුද්දේශය කියා කියනු ලැබේද?
6. "ප්‍රත්‍යය ඇත්තා වූ ධර්මයෝ" යන්නෙහි "ඇත්තාවූ" යන වචනයේ අභිධෙය්‍යාර්ථය පැහැදිලි කරන්න.
7. දෝසමූල ප්‍රථම චිත්තයෙහි චෛතසික හා චිත්තජ රූපයන්ද ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න වන ආකාරය දක්වන්න.
8. රූප විපාක ප්‍රථම චිත්ත චෛතසිකයන් හා පටිසන්ධිකර්මජ රූපයන් ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න වන ක්‍රමය දක්වන්න.

9. ඉතිරි රූපයන් එක් රැසක් කොට ප්‍රත්‍යනීක නොකොට කුමක් හෙයින් බාහිර රූප ආහාරජරූප ආදී වශයෙන් වෙන් වෙන් කොට කියන ලදද.
10. බාහිර රූප හා උතුජරූපයන් වෙන් කොට දක්වන්න.
11. කුමක් හෙයින් ප්‍රවෘත්ති කර්මජරූපයෝ ප්‍රත්‍යයොත්පන්නයෙහි ඇතුලත් නොවී ප්‍රත්‍යනීක වන්නා හුද?

**ආරම්මණප්‍රත්‍යය ත්‍රිරාශිය**

ආරම්මණ පච්චයො යන ප්‍රත්‍යයොද්දෙශයෙහි ස්වරූපයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නය, ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙති. ඔවුනතුරෙන් ප්‍රත්‍යුත්පන්න අතීත අනාගත වූ සිත් එකුන් අනූවය (89) චෛතසික දෙපණසය. අටවිසි රූපය කාලවිමුක්ත වූ නිබ්බාන පඤ්ඤත්තිය යන මේ අරමුණු සය ආරම්මණ ප්‍රත්‍යයේ ඇත්තා වූ ප්‍රත්‍යධර්මයෝ නම් වෙති. එකුන් අනූ චිත්තය දෙපණස් චෛතසිකය යන මේ ධර්මයෝ ආරම්මණ ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝ නම් වෙති. චිත්තජරූප පටිසන්ධි කර්මජ රූප බාහිර රූප ආහාරජරූප උතුජරූප අසඤ්ඤ සත්ත්ව කර්මජරූප ප්‍රවෘත්ති කර්මජරූප යන මේ ධර්මයෝ ආරම්මණ ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝ නම් වෙති.

ආරම්මණපච්චයො ආරම්මණ පදය හා ආල ම්බන පද ස්වභාවාර්ථ වශයෙන් සමාන නමුත් ශබ්දාර්ථ වශයෙන් විශේෂයක් ඇත. ඒ දෙපදයෙහි විග්‍රයව ආරම්මණ සංග්‍රහයෙහි දක්වා ඇත.

ආරම්මණ ශබ්දය 'ඉතා රමණීය' නමැති අර්ථයට කියයි. වවන ලද නානා ගෙඩි මල් ඇති අරම් උයන් ඉතාම රමණීය 'සිත් අලවන' බැවින් ඒ උයන්හි ඉතා රමණීය 'සිත් අලවන' ශක්ති විශේෂයක් ඇත්තාක් මෙන් රූපාදි ආරම්මණයන්ගේ ද චිත්තචෛතසිකයන් ඇලුම් කරවන ශක්ති විශේෂයක් ඇත. ඒ නිසාම යම්කිසි ඒ සිතකට අරමුණකින් වෙන්ව ඉපදිය නොහැකිය. මෙසේ චිත්ත චෛතසිකයන් ඉවත් නොකොට රමණය කරවන ශක්ති විශේෂය ආරම්මණ ශක්තිය නම්.

**පාඩම් කළ යුතු:**

උයනෙක්හි සිත්කළු - බවමෙන් තමා වෙත නම්
පුන පුනා එළවන - සැත්වේය ආරම්මණ,

ආලම්බණ ශබ්දය වනාහි 'අල්වා ගැනීම' යන අර්ථයට කියයි. දුබල කෙනෙකුට දඬුවක් සැරයටියක් හෝ ලණුවක් අල්වාගෙන නැගිටීමට සිටීමට ඒ සැරයටිය හෝ ලණුවෙහි එල්බී ගැනීමට ශක්ති විශේෂයක් ඇතිවක් මෙන් ආරම්මණයන්හිද චිත්ත චෛතසිකයන්ට එල්ලී ගැනීමට හැකි වූ ශක්ති විශේෂයක් ඇත. ඒ නිසා මොනම චිත්තයකට චෛතසිකයකට යම්කිසි අරමුණකින් තොරව නොඉපදිය හැකිය. මෙසේ චිත්ත චෛතසිකයන්ට එල්ලී ගැනීමට උපකාරවන ශක්ති විශේෂය ආලම්බන ශක්තිය නම්.

**පාඩම් කටයුතු:**

දුබලකු යටි රැහැන් - එල් බී නැගෙනු මෙන් සිත්
එල්බෙන සොබා සැත් - ආලම්බනම් දනු වෙසෙස්

(සැරයටිය අන්‍ය සම්බන්ධයක් නැති තනි වන්නාක් මෙන් නාම පඤ්ඤත්ති නිබ්බාන ආරම්මණයෝද ඔවුනොවුන් සම්බන්ධ වූ ධර්මයෝ නොවෙත්. ලනුව යනු රූපාරම්මණයෝද රූපකලාප සමූහයකගේ සම්බන්ධවීමෙන් ලැබෙති. ඒ නිසා නාමාරම්මණ හා පඤ්ඤත්ති නිබ්බානයෝද දඬුවකට සැරයටියකට සමය. රූපාරම්මණය වනාහි ලනුව හා සමවේ යැයි ග්‍රන්ථයන්හි කියා තිබේ.)

ප්‍රත්‍යය:- ප්‍රත්‍ය ධර්මයෙහි "පච්චුප්පන්න අතීත අනාගත වූ" යන වචනය චිත්ත චෛතසික රූපයන් හා සම්බන්ධ වේ. "කාලවිමුක්ත වූ" යන වචනය නිබ්බාන පඤ්ඤත්තින් හා සම්බන්ධ වේ. චිත්ත චෛතසික රූපාරම්මණයෝ වර්තමාන අතීත අනාගත තුන්කාලයෙහි සුදුසු පරිදි ලැබෙන අරමුණු වෙති. නිබ්බාන පඤ්ඤති අරමුණු වනාහි ඒ තුන්කාලයෙන් මුක්ත වූ බැවින් කාල විමුක්ත නම් වූ අරමුණු යහ. කාලවිමුක්ත වන ආකාරය ආරම්මණ සංග්‍රහයෙහි දක්වා ඇත. "ආරම්මණ සය ප්‍රත්‍යධර්මයෝය" යන

තැන වනාහි අටවිසි රූපය අතුරෙන් රූප සද්ද ගන්ධ රස ඓාට්ඨබ්බ රූප පස රූපාරම්මණාදි අරමුණු පස වෙති. ඉතිරි රූපයන් හා චිත්ත චෛතසික ප්‍රඥප්තීහු වනාහි ධර්මාරම්මණය වෙති. ඒ නිසා චිත්ත චෛතසික රූප නිබ්බාන පඤ්ඤත්තියන කොටස් පසටම අරමුණු සය යයි කියති. ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝ පැහැදිළි කරන ලදහ.

**ප්‍රත්‍යනීකඃ-** ප්‍රත්‍යනීක ධර්මයෝ වනාහි අරමුණක් නොගත හැකි බැවින් අනාරම්මණික නම් ලත් සියලු රූපයෝය. ඒ සියලු රූපයන් එක් සමූහයක් කොට නොකියා "චිත්තජරූප පටිසන්ධි කර්මජරූප" යනාදී වශයෙන් වෙන් කොට කීම ප්‍රත්‍යනීක පාලියෙහි ආක්‍රමයට කීමකි.

ප්‍රත්‍යය, ප්‍රත්‍යයොත්පන්න වන ආකාරයඃ "චක්ඛුද්වාරික වීථිය උපදින කල්හි පච්චුප්පන්න රූපාරම්මණය ප්‍රත්‍යය වේ. ඒ රූප අරමුණ අරමුණු කරන පඤ්ච ද්වාරාවජ්ජනාදි වූ චක්ඛුද්වාරික වීථි චිත්ත චෛතසිකයෝ ප්‍රත්‍යයොත්පන්න වෙති" මේ ආදි වශයෙන් වීථි ස්වරූපයෙහි ආරම්මණ දැක්වූ ක්‍රමයට ඒ ඒ අරමුණ අරමුණු කරන්නා වූ වීථි චිත්තචෛතසිකයෝ ප්‍රත්‍යයෝත්පන්නයෝය. ඒ වීථියගේ අරමුණ ආරම්මණ ප්‍රත්‍යය වේ යැයි වෙන් කොට දතයුතුය."

**අභ්‍යාස ප්‍රශ්නඃ**

1. ආරමණ, ආලම්බන, දෙපදයේ අර්ථයන් වෙන වෙනම දක්වා අරමුණු සයේ ආරම්මණ ශක්තිය ආලම්බන ශක්තීන්ද දක්වන්න.
2. චිත්ත චෛතසික රූප නිබ්බාන පඤ්ඤත්තීන් අරමුණු සය වශයෙන් වෙන්කර දක්වන්න.
3. සොතද්වාරිකවීථිය ලියා ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න වන අයුරු දක්වන්න.
4. අතීත රූපාරම්මණය අරමුණු කරන කාමජවන මනොද්වාරික වීථියක් ලියා ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න වන අයුරු දක්වන්න.

## ආරම්මණාධිපති ත්‍රිරාශිය

අධිපති පච්චයො යන ප්‍රත්‍යයොද්දේශයෙහි අධිපති ප්‍රත්‍යය ආරම්මණාධිපති සහජාතාධිපති වශයෙන් දෙවැදෑරුම් වේ. ඒ දෙක අතුරෙන් ආරම්මණාධිපති ස්වරූපයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වේ. ඒ තුන අතුරෙන් ගරුකොට ගන්නා ලද වර්තමාන අතීත අනාගත ඉෂ්ඨ වූ නිෂ්පන්න රූප අටලොසය - දෝසමූල දෙසිතය මෝහමූල දෙසිතය දුක්ඛ සහගත කාය විඤ්ඤාණය 'යනමොවුන්' වර්ජිත කොට ඇති සිත් 84 ය. දොස ඉස්සා මච්ජරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිතකොට ඇති චෛතසික 47 ය. කාලවිමුක්ත වූ නිබ්බානය යන මේ අරමුණු සය ප්‍රත්‍ය ධර්මයෝ නම් වූ ආරම්මණාධිපති ප්‍රත්‍යය ඇත්තා වූ ධර්මයෝ නම් වෙති. ගරු කොට ගන්නා වූ ලෝභමූල සිත් 8 ය. මහා කුසල් සිත් 8 ය. මහාක්‍රියා ඤාණසම්පයුත්ත සිත් 4 ය. ලොකුත්තර සිත් 8 ය. දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා අප්පමඤ්ඤාවන් වර්ජිත කොට ඇති චෛතසික 45 ය යන මේ ධර්මයෝ ආරම්මණාධිපති ප්‍රත්‍යයේ ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝ නම් වෙති. ගරුකොට අරමුණු නොකිරීමේ දී ලෞකික සිත් 81 එක් අසූවය. චෛතසික දෙපණසය. චිත්තජ රූපයෝය. බාහිර රූපයෝය. ආහාරජ රූපයෝය. උතුජ රූපයෝය. අසඤ්ඤසත්ත්වකර්මජ රූපයෝය. පවත්තිකර්මජ රූපයෝය යන මේ ධර්මයෝ ආරම්මණාධිපති ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීක ධර්මයෝ නම් වෙති.

**ආරම්මණාධිපතිඃ-** තමා හා සම්බන්ධ ආරම්මණික ධර්මයන්ට ඊශ්වරභාවයෙන් පැවැතිය හැකි ශක්තිය ආරම්මණාධිපති ප්‍රත්‍යය නම් වේ. පැහැදිලි කරන්නෙමි. රූපාරම්මණය සාමාන්‍ය රූපාරම්මණය, ඉතා ලක්‍ෂණ රූපාරම්මණ කියා දෙකක් ඇත. සාමාන්‍ය රූපාරම්මණයෙහි ආරම්මණ ශක්තිය මාත්‍රයක් ඇත. ආරම්මණාධිපති ශක්තිය නැත. ඉතා ලක්‍ෂණ රූපාරම්මණයෙහි වනාහි ආරම්මණ ශක්තිය ආරම්මණාධිපති ශක්තිය යන දෙකම ඇත. ආරම්මණාධිපති ශක්තිය ඇත්තා වූ රූපාරම්මණය තමා අරමුණු කරන ආම්මණික ලෝභ මූල සිතට ඊශ්වරත්වයෙන් ඇලුම් කටයුතු බවට පත්වේ. අරමුණු නොකර 'නොබලා' නොසිටිය

හැකිවේ පභාවතී රූපාරම්මණයාගේ ආරම්මණාධිපති ශක්තිය නිසා බෝසත් කුස රජතුමා යොදුන් සියයක් දුර මග එක් දිනකින් පිය ගමණින් ගියේය. ගුත්තිල වීණා ඇදුරුතුමාගේ වීණා ශබ්දය නමැති ශබ්ද ආරම්මණාධිපති ශක්තිය නිසා වෛශ්‍යාවක් සීමැදුරු කවුළුවෙකින් පැන්නාය. මේ ආදී වශයෙන් සාමාන්‍ය අරමුණට වඩා ඊශ්වර භාවයෙන් යුත් ශක්ති විශේෂය ඇත්තා වූ අරමුණ ආරම්මණාධිපති ශක්තිය ඇත්තා වු අරමුණ නම් වේ. ඒ නිසා ප්‍රත්‍යධර්මයෙහි "ඉතා ගරුකොට අරමුණු කරනු ලබන්නාවූ" යැයි ද ප්‍රත්‍යයොත්පන්නයෙහි "ඉතා ගරුකොට අරමුණු කරන්නා වූ" යැයි ද කීය. ඉතාම ගරු කටයුතු අරමුණු දම් ප්‍රත්‍ය නම්. ඉතාම ගරු කළ අරමුණු ඇත්තා වූ චිත්ත චෛතසික ධර්මයෝ ප්‍රත්‍යයොත්පන්නයෝ කර්මයයි දත යුතු.

**පාඩම් කළයුතුː**

"නානාරමුණු මත්වලට වැඩි යුත් ඉසුරු
නම් ගරු කොට රමණ අධිපති වේ රමුණු සැත්"

**ප්‍රත්‍යයඃ-** "වර්තමාන අතීත අනාගත"යි කියන ලද විශේෂණය රූප චිත්ත චෛතසිකයන්හි සම්බන්ධකරනු. 'ඉෂ්ට වූ'යි කී විශේෂණය ද නිෂ්පන්න රූපයන් කෙරෙහි සම්බන්ධකරනු. අටවිසි රූපයන් අතුරෙන් අනිෂ්පන්න රූප දශය පරමාර්ථව නොලැබේ. ප්‍රඥප්ති ස්වභාව මාත්‍රයක්ම වන බැවින් ඉතා ගරු වශයෙන් අරමුණු නොවෙති. නිෂ්පන්න රූප අතුරෙන්ද අනිට්ඨාරම්මණ වූ නිෂ්පන්න රූපය ඉතා ගරු වශයෙන් අරමුණු නොවේ. ඒ නිසා "ඉෂ්ට වූ නිෂ්පන්න රූප අටලොස" යැයි කීය. චිත්තයන් අතුරෙන් දෝසමූල මෝහමූල දුක්ඛසහගත කාය විඤ්ඤාත්ති චිත්තයෝ වනාහි ඉතා ගරුකොට අරමුණු කළ හැකි චිත්තයෝ නොවෙති. ඒ නිසා සම්ප්‍රයුක්ත දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡාවන් හා එකට උපදින චිත්තයෝ අත්හරින ලදහ. (මේ ත්‍රිරාශියෙහි කියන ලද ක්‍රමයෙන් මෙනම් ආරම්මණික සිත මෙනම් අරමුණ ඉතා ගරුකොට අරමුණු කරයි කියා වෙන්කොට නොදත හැකිය. ඒ නිසා අටුවා වචනයට අනුව ආචාර්යවරයන් විසින් කියා ඇති කාව්‍ය වශයෙන් සම්බන්ධ අරමුණු සහ ආරම්මණික චිත්තයන්ද වෙන්කොට දතයුතුයි.

**පාඩම් කටයුතු:**

1. "දො මො දුකින් සහගිය - සිතහැර ලොවී සෙසු සිත් (76) - චතුජ ඉටු නිපන් රූ යන - මෙසැම ලොමුල් සිත ගරු කෙරේ
2. සතලොස් පින් ලොවී සිත් - ගරු කෙරෙත් මාකුසල් අට - තම තම මඟ පලනිවන් - ගරුකරති නැණයුත් අට.
3. අමාමහ නිවනත් - ලොවිතුරු උතුම් සිත් අට, ගරු කෙරෙතියි වදාළෝ - සැසී මුනි තිලොනා.

ලෝභමූල සිත /පෙ/ ගරුකර අරමුණු කරයි

ලෝභමූල සිත් අට, දෝසමූල මෝහමූල දුක්ඛ සහගත කායවිඤ්ඤාණ සිත් වර්ජිත කොට ඇති ලෞකික සිත් 76 සසැත්තෑවය. ඒ සිත් හා යෙදෙන 47 සත් සාළිසක්වූ චෛතසිකය ඉෂ්ට වූ චතුසමුට්ඨානික නිෂ්පන්න රූප අටලොස යන මොවුන් ගරු වශයෙන් අරමුණු කරත්, (ගරු කරයි කීවේ නමුත් ශ්‍රද්ධාව විසින් ගරු කිරීම නොවේ. ආශා කිරීම් වශයෙන් පමණක්ම යයි කියන ලදී. චතුජඉෂ්ටරූප යනු කම්ම චිත්ත උතු ආහාර යන සමුට්ඨාන සතර (4) නිසා සුදුසු පරිදි උපදනා වූ ඉෂ්ටාරම්මණ නිපන් රූපයෝය. මෙතැන ඉෂ්ට යනු ස්වභාව ඉෂ්ටයට වඩා පරිකල්පිත ඉෂ්ටාරම්මණය ද ගනු ලැබේ. "තමාගේ ආසනය සිංහාසනයය" කීවාසේ සුද්ධ ඉෂ්ටනූනත් යමෙක් සිතීම් වශයෙන් ඉෂ්ටාරම්මණයි සිතා ඉතා ගරු වශයෙන් ගන්නා බව සිහිකරන්න) මේ කථාවට අනුව "ඉතා ලක්‍ෂණ රූපාරම්මණය අරමුණු කොට ඉතාම ගරුකොට ගන්නා වූ චක්ඛුද්වාරික මනොද්වාරික වීථිය උපදීමේ දී රූපාරම්මණය ආරම්මණාධිපති ප්‍රත්‍යය වේ. ලෝභ ජවනය ආරම්මණාධිපති ප්‍රත්‍යයගේ ප්‍රත්‍යයෝත්පනනය. තමාගේ ලෞකික ධ්‍යානය ගරුකොට ආශා කිරීමේ දී ලෞකික ධ්‍යාන චිත්තචෛතසිකයෝ ආරම්මණාධිපති ප්‍රත්‍ය වෙති. ලෝභජවනය ආරම්මණාධිපති ප්‍රත්‍යයගේ ප්‍රත්‍යයෝත්පන්න වෙති" යනාදී වශයෙන් දත යුතුයි.

**කාම කුශල් සිත් අට ලෝකීය කුශල් සතලොස අරමුණු කරන ක්‍රමය:** මහා කුශල් සිත් අට ලෞකික කුශල් සිත් සතලොස

ගරුකොට අරමුණු කරති. තමාගේ කුශලය හෝවේවා, අනුන්ගේ කුශලය හෝ වේවා මෙනෙහි කොට අරමුණු කිරීමේ දී ද, තමාගේ ධ්‍යාන කුශලයන් බලවත්ව කැමතිතාක් මෙනෙහි කරන ප්‍රත්‍ය වේක්ෂා කුශල්සිත් පහළවන කාලයේ දී ද ලෞකික කුශලාරම්මණය ආරම්මණාධිපති ප්‍රත්‍යය නම්. ඉතා ගරුකොට අරමුණු කරන්නා වූ මහා කුශලජවන චිත්තචෛතසිකයෝ තෙතිස ආරම්මණාධිපති ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයො නම්. (විරති චේතනාව වීතික්කමිතබ්බ ධර්මයන් අරමුණු කරයි. අප්පමඤ්ඤා වනාහි ප්‍රඥප්තිය පමණක් අරමුණු කරයි. ලෞකික කුශල ධර්මයෝ විතික්කමිතබ්බ හෝ පඤ්ඤත්ති ධර්ම හෝ නොවන බැවින් විරති අප්පමඤ්ඤා වර්ජිතකොට චෛතසික තෙතිසයැයි කියන ලදී. එසේ අප්පමඤ්ඤාවන්ගේ අරමුණ වන සත්ත්ව ප්‍රඥප්තිය ගරු කරනු ලබන අරමුණු කෙරෙහි ඇතුළත් නොවන බැවින් ප්‍රත්‍යයෝතප්නනයෙහි අප්පමඤ්ඤා කිසි සේත් ඇතුළත් නොවන්නාහ.

**ඥාණසම්ප්‍රයුක්ත කුශලක්‍රියා අට ලොව්තුරු දහම් අරමුණු කරන සැටි:-** ඥාණ සම්ප්‍රයුක්ත මහා කුශල මහා ක්‍රියා සිත් අට තම තමා ලඟ ඇත්තා වූ ලෝකුත්තර ධර්ම නවය ඉතාම ගරු වශයෙන් අරමුණු කරති. සොතාපන්න පුද්ගලයාගේ ඥාණසම්ප්‍රයුක්ත මහා කුශලය (ප්‍රත්‍යවෙක්ෂාවීථි උපදිනා කාලයේ හා සමාපත්තියට සමවදින කාලයේ) තමාගේ සෝවාන් මාර්ගය ඵලය නිර්වාණය, ඉතා ගරු කොට අරමුණු කරයි. අන්‍යයන්ගේ මාර්ගඵල නිර්වාණය වනාහි සාමාන්‍ය වශයෙන්ම අරමුණු කරයි. තමන්ගේ සකදාගාමී අනාගාමී මගපළ නිවන් හිද මේ නය ක්‍රමය මැයි, රහතන් වහන්සේ ගේ ඥාණ සම්පයුක්ත මහාක්‍රියා සිත තමන් සතු අර්හත් මාර්ගඵල නිර්වාණයන් ගරු කොට අරමුණු කරයි. ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්නයන් වන ආකාරය අවබෝධ කර ගැනීම පහසුය.

ලොව්තුරු සිත් අට (8) නිවන අරමුණු කරති. ලොව්තුරු සිත් ද අමෘත මහා නිර්වාණය ඉතා ගරු කොට අරමුණු කරත්, මෙහිදී ද අනුන්ගේ නිවන තමාගේ මගපලවලින් කිසිසේත් අරමුණු නොකළ හැකි බැවින් තමාගේ මගපල තමාගේම නිර්වාණය

අරමුණු කරන්නේ යැයි දත යුතුයි. "නිර්වාණය ආරම්මණාධිපති ප්‍රත්‍යය වේ. තමාගේ මගපල සිත් විරති හා එකට යෙදෙන සතිස් (36) චෛතසිකයෝ ආරම්මණාධිපතිගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ" යයි දතයුතු මේ ලොව්තුරා සිත් නිවන නියතයෙන් අරමුණු කරන බැවින් නියතයෙන් ප්‍රත්‍යයෝත්පන්න වෙති. ප්‍රත්‍යනිකයෙහි ඇතුලත් නොවෙත්.

ප්‍රත්‍යනීකය - "ගරුකොට අරමුණු කිරීමේ දී අරමුණු නොකිරීමේ දී" යන තැන. 'අරමුණු කිරීමේ දී' යන වචනය අනේකාන්තික, අනියත බැවින් කියන ලද වචනයකි. අරමුණු නොකිරීමේ දී යන වචනය ඒකාන්තිකය. නියත බැවින් කියන ලද වචනයකි. ඒ නිසා "ගරුකොට අරමුණු කිරීමේ දී යන වචනයෙන් ලෝභමූල සිත් 8 ය. මහාකුශල් සිත් 8 ය. ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් 4 ය යන මේ ධර්ම කොටස දැක්වෙති. මේ ධර්මයන්ට කියන ලද ආරම්මණයන් ගරු වශයෙන් අරමුණු කරන කාලයක් ද ඇත. කියන ලද අරමුණු හෝ වේවා අන්‍ය අරමුණු හෝ වේවා ගරු කොට නොගෙන සාමාන්‍ය වශයෙන් අරමුණු කරන කාලයක්ද ඇත. ගරුකොට අරමුණු කරන කාලයේ ප්‍රත්‍යයොත්පන්න වෙති. ගරුකොට අරමුණු නොකරන කාලයේ දී ප්‍රත්‍යනීකයන් කෙරෙහි ඇතුලත් වෙති. 'ගරුකොට අරමුණු නොකිරීමේ දී' යන වචනයෙන් ගරු වශයෙන් අරමුණු කළ යුතු නොවන්නා වූ (ලෝභමූල 8, මහාකුශල 8, ඥාණසම්ප්‍රයුක්ත මහාක්‍රියා 4 මෙයින් අන්‍ය වූ) ලෞකික සිත් දැක්වෙති. රූපධර්මයෝ වනාහි අනාරම්මණිකයෝ බැවින් ගරුකොට අරමුණු කරද්ද නොකරත් දැයි සැකයක් නැත.

අභ්‍යාස ප්‍රශ්නඃ

1. රූප අරමුණෙහි ආරම්මණ ශක්තිය ආරම්මණාධිපති ශක්තිය යන දෙක වෙන් කොට දක්වන්න.
2. "ගරුකොට අරමුණු කරනු ලබන - ගරුකොට අරමුණු කරන" යන වචනවල අදහස පැහැදිළි කරන්න.
3. "පච්චුප්පන්න අතීත අනාගත" යන විශේෂණය හා 'ඉෂ්ට වූ' යන විශේෂණ පදයන් කොතැනක සම්බන්ධ වෙත්ද.

4. ප්‍රත්‍ය ධර්මයන්හි අනිෂ්පන්න රූපයන් කුමක් නිසා නොදක්වන ලදද,
5. ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් අතුරෙන් මෙනම් ධර්මය විසින් මෙනම් අරමුණ ගරුකරනු ලැබේ යැයි කාව්‍යයට අනුව වෙන්කර දක්වන්න.
6. යෝගාවචරයා තමාගේ ධ්‍යානසිත බලවත්සේ මෙනෙහි කිරීමේදී ආරම්මණාධිපති ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න වන ආකාරය දක්වන්න.
7. අභිඤ්ඤා සිතින් අනුන්ගේ මාර්ගඵල නිර්වාණයන් ගරු කොට අරමුණ කළ හැකිද? නොකළ හැකි නම් කාව්‍ය පදයෙහි කිනම් වචනයට කියවේද?
8. "ගරුකොට අරමුණු කිරීමේ දී අරමුණු නොකිරීමේ දී" යන වචනවල අදහස දක්වන්න.
9. ප්‍රත්‍යනීකයෙහි "ගරුකොට අරමුණු නොකිරීමේ දී" යන වචනය කොතැනක සම්බන්ධ වේද (කරුණු කියා විස්තර කරනු)
10. ලෝභමූල චිත්තය යම්කිසි රූපාරම්මණයක් "ගරුකිරීමේ දී ප්‍රත්‍යයෝත්පන්න ප්‍රත්‍යනීක දෙක අතුරෙන් කුමකට ඇතුලත් වේද? ගරුනොකරන කල්හි කුමක් හි ඇතුළත් වේද?"

**සහජාතාධිපති ත්‍රිරාශියඃ-** සහජාතාධිපතිපතියෙහි ස්වරූපාර්ථයෝ ප්‍රත්‍යය, ප්‍රත්‍යයොත්පන්නය, ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙති. ඒ තුන අතරෙන් අධිපති ප්‍රත්‍යවන කල්හි මොමූහ දෙසිත හා හසිතුප්පාද සිත වර්ජිත කොට ඇති සාධිපතිජවන 52 දෙපණසක් වූ නාම ස්කන්ධයෙහි ඇති ඡන්ද විරිය, වීමංස, සාධිපති ජවන දෙපණසය (52) යයි කියන ලද චිත්තයන්ගේ වශයෙන් අධිපති ධර්ම තුන (3) හෝ සතර (4) අතුරෙන් එක එකක් යන මේ ධර්මයෝ සහජාතාධිපති ප්‍රත්‍යය ඇත්තා වූ ධර්මයෝ නම් වෙති. අධිප්‍රත්‍යය ලැබෙන කල්හි අධිපති ධර්මයන් හැර සාධිපති ජවන දෙපණසය (52) විචිකිච්ඡාව හැර චෛතසික එක් පණස (51) ය. සාධිපති චිත්තජ රූපයෝය යන මේ ධර්මයෝ සහජාතාධිපති ප්‍රත්‍යය සම්බන්ධී ප්‍රත්‍යයොත්පන්න වූ ධර්මයෝ නම් වෙති. අධිපති ප්‍රත්‍යය

නොලැබෙන කල්හි කාම සිත් සිවුපණස (54) ය. මහග්ගත විපාක නවය (9) ය. චෛතසික දෙපණසය අධිපති ප්‍රත්‍යය ලැබෙන කල්හි සාධිපති ජවන දෙපණස (52) වූ නාමස්කන්ධයෙහි ඇත්තා වූ අධිපති ධර්ම තුන (3) හෝ සතර (4) අතුරෙන් එකඑකක්ය. නිරාධිපති චිත්තජ රූපයෝය. පටිසන්ධි කර්මජ රූපයෝය. බාහිර රූපයෝය ආහාරජ රූපයෝය. උතුජ රූපයෝය. අසඤ්ඤසත්ත්ව කර්මජ රූපයෝය. ප්‍රවෘත්ති කර්මජ රූපයෝය යන මේ ධර්ම සහජාතාධිපති ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යනීක වූ ධර්මයෝ නම් වෙති.

**සහජාතාධිපති:-** ආරම්මණාධිපතියට උපමාව ආරම්මණ ස්වරූපයට අනුව සැරයටි ලනු උපමාවමය. මේ සහජාතාධිපති ස්වභාවයට චනාහි සක්විති වශයෙන් උපමා දක්වති. මේ ග්‍රන්ථයෙහි චනාහි තමාගේ රටෙහි වෙන රජෙක් නැති ස්වර්ශ්වර වූ අධිරාජයකු වශයෙන් උපමා දක්වන ලදී. අධිරාජයා චනාහි තම රටෙහි සියලු රාජකෘත්‍යයෙහි අධීශ්වර වන්නේ යම් සේද (වන්නාක් මෙන්) එසේ සහජාත චිත්තචෛතසික නාමස්කන්ධයන් අතුරෙන් එකක් ප්‍රධාන වී සහජාත චිත්ත චෛතසිකයන්ට අධිපති විය හැක්කා වූ ශක්තිය සහජාතාධිපති ශක්තිය නම් වේ. පැහැදිළි කරන්නෙමි. බෝසත් සුමේධ තාපසතුමන්ට දීපංකර බුදුරජාණන් වහන්සේ හමු වූ කාලයේ බුදු වීමේ කැමැත්ත බලවත් සේ පහළ වූයේය. මුලුමහත් සක්වළ ගිනි අඟුරු රාශියකින් පිරී ඇති විට දකුණු 'සක්වළ' පර්වතයේ සිට ගිනි අඟුරු රැස නොසලකා එය මැඩ සූරභාවයෙන් පැනගොස් උතුරු දෙස පව්වට පැමිණෙන කාලයේ බුදුවන්නේ යැයි කියන්නේ නම් ඒසා විශාල ගිනි අඟුරුගොඩ නොසලකා ශූරභාවයෙන් මැඩගෙන වහාම පැනගොස් බුදුබව ලැබීමට අදහස් විය. එමෙන් ඡන්දය බලවත් වී මහාකුශල් සිත් උපදින කල්හි එකට උපදින ධර්මයෝ ඡන්දයට අනුවර්තනයව ඡන්දය ප්‍රධාන තැන පිහිටුවා උපදිත්. පඤ්ඤා විරිය චිත්තයන්ද ඒ ක්‍ෂණයේ දී සම්බන්ධ කෘත්‍යයෙහි ඡන්දයට අනුව උපදින්නාහ. මහෞෂධ ජාතකයෙහි ප්‍රශ්න ව්‍යාකරණයෙහි දී පඤ්ඤාව අධිපති වී ඇත. මහාජනක ජාතකයෙහි රුවල් නැව බිඳී මුහුදේ පිහිනන වේලාවේ දී විරිය අධිපති වී ඇත. ඒ ඒ කෘත්‍යයෙහි දී චිත්තය අධිපති වී ඇති ආකාරය විස්තර තැන්වලින් බලාගන්න. මෙසේ එකට උපදින

ධර්මයන්ට ඊශ්වර වශයෙන් එකක් ප්‍රධාන වන්නා වූ ශක්ති විශේෂය සහජාතාධිපති ශක්තිය නම් වේ.

සිය රටෙහි අදිරද - සැම රද කිසෙහි අධිපති
නම් හට එසේ සහදෑ - ඉසුරුවන සැත්වේය අධිපති

එක එකක්ම අධිපතිවීමට හේතුව සමුච්චය ස්වරූප භාෂාටීකාවෙහි "අධිපති එකොව ලබ්භති" යන වාක්‍යයෙහි විස්තර කොට තිබේ" මෙසේය,

ද්විහේතුක තිහේතුක ජවනෙස්වේව යථා සම්භවං අධිපති එකොට ලබ්භති.

ද්විහේතුක තිහේතුක ජවනෙස්වේව - ලෞකික විපාකචිත්තයෝ පූර්වකර්මය නිසා උපදනා නිසා ව්‍යාපාරයක් 'උනන්දුවක්' ඇති සිත් නොවෙත්. ව්‍යාපාරයක් නැතිනම් කුමක් නිසා අධිපති නාමයෙන් කියනු ලැබේ දැයි ප්‍රශ්නයකි. ඵලසිත් වනාහි මාර්ග අනුරූපව ක්ලේශ උණුසුම නැවත සන්සිඳවන බැවින් පටිප්පස්සම්භන ව්‍යාපරය ඇත්තාහු වෙති. ඒ නිසා ජවනයන්හිම අධිපති ලැබෙති. ජවනයන් අතුරෙනුත් අහේතුක ජවනයක් වන (හසිතොත්පාදය) හා එකහේතුක වන (මෝහමූල) දෙසිතද, "ඡන්ද ඇතිනම් කුමක් හෙයින් විචිකිච්ඡා සහගත සිත අධිපති නොවන්නේ ද, කුමක් හෙයින් හසිතොත්පාදය අධිපති නොවන්නේ ද," පූර්වාභිසඞ්ඛාර වශයෙන් ශක්තිමත් වීමට උපකාර ලැබෙන සුදුසු ජවනයන් නොවන නිසාය. එසේ ශක්තිමත් වීමට උපකාර නොලැබේ නම් කුමකින් අධිපති විය හැකි ද. ඒ නිසා ඒක හේතුක ජවන අහේතුක ජවනයන්හි අධිපති නොලැබී, ද්විහේතුක ත්‍රිහේතුක ජවනයන්හිම අධිපති ලැබීම සුදුසුය. (අකුසල පද අනුටීකාව)

යථා සම්භවං එකොව - ද්විහේතුක ජවනයන්හි අධිපති වන්නා වූ ධර්මයෝ චිත්ත ඡන්ද විරිය කියා තුනක් (3) වෙති. ත්‍රිහේතුක ජවනයන්හි පඤ්ඤාවත් සමඟ සතර (4) කි. එහෙත් තම රටෙහි අදිරජවරු එකෙකුම වන්නාක් මෙන් එකට උපදින චිත්ත චෛතසිකයන් අතුරෙන් ද අධිපති වන්නා වූ ධර්ම එකක්ම වේ. ඒ තුන (3) හෝ සතර (4) අතුරෙන් කුමන ධර්මය අධිපති

වන්නේ ද... ශක්තිමත් ධර්මය අධිපති වන්නේය. කුමන ධර්මයක් ශක්තිමත් වන්නාහුද, වාසනානුරූපව පූර්වාභිසංඛාර බලයෙන් යුක්ත වූ ධර්මය ශක්තිමත් වීමට සුදුසු වේ.

**විස්තර කරන්නෙමි:** ඇතැමෙක් පෙර ආත්ම වාසනානුරූපව 'අච්චායික' නොවරදවා වහා කළ යුතු කෘත්‍යයෙහි දී 'චිත්තවතො කිං නාම නසිජ්ඣති' සිතේ ශක්තිය ඇත්තේ නම් කුමක් ද සිදු නොකළ හැක්කේ යැයි සිතම විග්‍රහකරත්. නගා සිටුවති. මේ වනාහි, මුලින් සිත සකස් කිරීම නමැති පූර්වාභිසංඛාරය වේ. ඒ පූර්වාභිසංඛාරය නිසා පසුපස චිත්තචෛතසිකයන් උපදිනා කාලයේ දී සිත අධිපති වේ. ඇතැමෙක් වනාහි "ඡන්දවතො කිංනාම නසිජ්ඣති" ඡන්දය ඇත්තේ නම් සිදු නොකළ හැක්කේ කුමක්දැ'යි ඡන්දය මුල් කරති. ඇතැමෙක් "විරියවතො කිංනාම නසිජ්ඣති" උත්සාහය ඇත්තේ නම් ඒකාන්තයෙන් සමෘද්ධවන්නේ යැයි වීර්යයම ප්‍රධාන කරති. තව කෙනෙක් වනාහි "පඤ්ඤවතො කිං නාම නසිජ්ඣති" ඤාණය ඇත්තේ නම් කුමක් සිදු නොකළ හැකි දැයි නිරන්තරයෙන් ඤාණයම දියුණු කරයි. (පිහිට කර ගනියි) ඒ සියල්ලම පූර්වාභිසංඛාරම වෙති. ඒ පූර්වාභිසංඛාරය නිසා පසු පසු සිත් උපදිනා කල්හි ඒ ඒ ධර්මයට ශක්තිය ලැබේ. ඒ ශක්තිමත් ධර්ම එක එකක්ම අධිපති වන බැවින් "යථා සම්භවං එකොව" "සුදුසු පරිදිව ලැබෙන ධර්ම එක එකක්ම අධිපති වන්නේ යයි" කියන ලදී. (පූර්වාභිසංඛාරය නිසා පසු පසු සිත්හි එකෙකක් අධිපති වන්නේ යයි යන වචනයද වාසනා බලය නොලැබීම ගැන කී වචනයකි. සම්බන්ධ කෘත්‍යයෙහි ඡන්ද චිත්ත වීරිය වීමංසන" එක එකක් ශක්තිමත්ව ඇත්තේ නම් පූර්වාභිසංඛාර නොලැබත් අධිපති විය හැකිය. මහබෝසත්වරු පැමිණි කාලයේ පහළ කරන ශක්තිමත් ඡන්දාදීන් උපදනාකාරය කල්පනා කර දැනගන්න)

මූලික අධ්‍යාපනය උපකාර ලැබීමේ දී දියුණු වන සැටි: සමුච්චය කාණ්ඩ භාෂාටීකාවෙහි දක්වන ලද ආකාරයට "චිත්තවතො කිං නාම නසිජ්ඣති" ආදී වශයෙන් පූර්වාභිසංඛාර වශයෙන් උපකාර ලබන්නා වූ ධර්ම යෝ පමණක්ම අධිපති විය හැකි නම් ඵස්ස වේදනාදි ධර්මයෝද එසේ උපකාර දෙන බැවින් අධිපති වීමට

නොහැකි දැයි ප්‍රකාශනයකි. පිළිතුරු උපකාර කිරීමෙන් දියුණු කරවීම සෑම ධර්මයක්හිම නැත. මුලින්ම (ප්‍රකෘතියෙන්ම) දියුණුවීමට සුදුසු අධ්‍යාපනය ඇත්තේ නම් පමණකි. උපකාර නිසා දියුණු විය හැකි වනුයේ. අධිපති වීම පිණිස උසස්වීම ද සාමාන්‍ය උපකාරයකින් ශක්තියකින් නොකළ හැකි උපමාවක් - ප්‍රකෘතියෙන්ම නිදාගන්නාසුළු පුද්ගලයාය, මන්ද පුද්ගලයාය, අනුන්ගේ උපකාරය ගරු නොකරන පුද්ගලයාය යන මොවුහු අන්‍යයන්ගේ අනුග්‍රහය නිසා (විශේෂ වශයෙන්) ප්‍රකට වශයෙන් (බලවත්) ශක්ති සම්පන්න නොවන්නාහ. ස්වල්ප වශයෙන්ම දියුණුවුවත් ප්‍රකට වශයෙන් දියුණුවක් නොලැබේ. එසේම ඵස්ස වේදනා සඤ්ඤා චේතනාදිහු පූර්වාභිසංඛාර වශයෙන් උපකාර දුන්නේ නමුත් ඵස්සයේ ඵස්ස ශක්තිය, වෙදනා සඤ්ඤාවන්ගේ විඳීම් ශක්තිය, හැඳිනීම් ශක්තිය ප්‍රකටව (තිබෙන පමණට වඩා) දියුණුවීමක් නැත. චේතනා සංඛ්‍යාත ධර්මය උවත් අනුන්ගේ කැමැත්තට අනුව ශක්තිය දියුණුවන්නේ නැත. ඡන්ද චිත්ත විරිය වීමංසයන්ගේ ශක්තියෙන් චේතනාවද ශක්තිමත් වේ යයි කියා තිබේ. ප්‍රකෘතියෙන් (මුලින්) උසස් අධ්‍යාපනය ලැබූවහු වනාහි උපකාර දෙන්නේ නම් වහාම දියුණුවට ශක්තිය ලැබේ. එසේ ප්‍රකෘතියෙන්ම අධ්‍යාපනය ඇත්තා වූ ඡන්දාදීහු පූර්වාභි සංඛාරයෙන් උදවු දෙන්නාහු නම් අධිපතිවීම නිසා පැහැදිළි වශයෙන් ශක්තිය දියුණු විය හැකිය. එසේ පූර්වාභිසංඛාර නිසා දියුණුව හෝ පිරිහීම දෙකම නැත්තා වු දෙකෙන්ම වෙන්කරන ලද ඵස්සාදී ධර්මයන්ට අධිපති නොකියා ඡන්දාදීහුම අධිපති භාවයෙන් කියන ලදහ.

ප්‍රත්‍යයඃ- "අධිපති වනක්ෂණයේ දී" යන වචනය මෝහ මූල හසිතෝත්පාදයෙන් අන්‍ය වූ කාමජවනයන් සඳහා කීමකි. කාමජවන නාමස්කන්ධයෙහි ඇත්තා වූ ඡන්ද විරිය වීමංස සහ කාමජවන චිත්තය යන මොවුහු ඒ ඒ ක්ෂණයේ දී අධිපති ශක්තිය ඇත්තෝ වෙති. ඒ නිසා අධිපති ඇත්තා වූ ක්ෂණයේ දී අධිපතිප්‍රත්‍යය වී, අධිපති නොවන්නා වූ ක්ෂණයේ දී අධිපතිප්‍රත්‍යය නොවෙති. 'නියතයෙන් අධිපති ඇත්තා වූ" යන වචනය වනාහි අපර්ණාජවන පිළිබඳ කීමකි. අපර්ණා ජවන නාමස්කන්ධයෙහි ඇත්තාවූ ඡන්ද විරිය වීමංස චිත්තයන් අතුරෙන් එකඑකක් නියතයෙන් අධිපති වන්නාහ.

"සාධිපති ජවන 52 දෙපණසක් වූ නාමස්කන්ධයෙහි ඇත්තා වූ ඡන්ද වීරිය වීමංස" යයි කී තැන අධිපති හා එකට උපදනා ජවනයට "සාධිපති ජවනය"යි කියනු ලැබේ. ඒ ජවනය යනු චිත්ත චෛතසික සංඛ්‍යාත වූ සතර නාමස්කන්ධ වන බැවින් "සාධිපති ජවන දෙපණස (52) වූ නාමස්කන්ධයෝ" යැයි කීහ. ඒ වචනයෙහි සාධිපති ජවන දෙපණසෙහි ඇත්තා වූ ඡන්දවීරිය වීමංස වශයෙන් අධිපති ධර්ම 3 පමණක්ම ලැබෙති. චිත්තාධිපතිය ඇතුළත් නොවේ. ඒ නිසා සාධිපති ජවන /52/ දෙපනස නමැති සිත්" යයි අනුසන්ධිය දක්වති. අධිපති ධර්ම තුන (3) හෝ හතර (4) අතුරෙන් එක එකක්යි කීතැන තුනක් (3) යි කීම වීමංසාධිපති නොලැබිය හැකි අකුශල ජවන ඤාණවිප්පයුත්ත ජවනයන් සඳහාය. සතර (4) යයි කීවේ වීමාසාධිපතිය ඇත්තා වූ ත්‍රිහේතුක ජවනය සඳහාය (ජවනයෝම අධිපතිවීමට යුතුකම හා මෝහ මූල හසිතෝත්පාද ජවනයන් අත්හැරීම ගැන සමුච්චය කාණ්ඩ භාෂා ටීකාවේ දක්වන ලදී)

ප්‍රත්‍යයොත්පන්නඃ- "අධිපතිප්‍රත්‍යය ලැබෙන ක්‍ෂණයේ නියත ක්‍ෂණයේ" යන කථාව සාධිපති ජවන දෙපණස (52) ය, චෛතසික එක්පණස (51) ය, සාධිපති චිත්තජ රූපය" යන කීම හා සම්බන්ධ කරනු, ඒ දෙක අතුරෙන් "ලැබෙනක්‍ෂණය" යනු ප්‍රත්‍යයෙන් උපකාර ලබන ක්‍ෂණයය. "ලැබෙනක්‍ෂණය" යන වචනය කාම ජවන චිත්ත චෛතසික චිත්තජ රූපයන් සඳහා කියන ලදී. "නියත ක්‍ෂණය" යනු උපකාර නියතයෙන් ලැබෙන ක්‍ෂණයය. මේ "නියත ක්‍ෂණය" යන වචනය අපර්ණාජවන චිත්ත චෛතසික චිත්තජ රූපයන් සඳහා කියන ලදී. "අධිපති ධර්මයන් වර්ජිත සාධිපති ජවන් දෙපණස (52) ය චෛතසික එක් පණස (51)ය" යි කී තැන ඡන්දය අධිපතිවන ක්‍ෂණයේ දී ඡන්දය ප්‍රත්‍යයොත්පන්නයෙහි ඇතුළත් නොවන බැවින් වර්ජිත වේ. වීරිය වීමංස චිත්තයෝද අධිපති වනක්‍ෂණයේ දී ප්‍රත්‍යයොත්පන්න යෙහි ඇතුළත් නොවිය හැකි බැවින් බැහැර වෙති. එසේ අධිපතිවන ක්‍ෂණයේ දී ප්‍රත්‍යයෝත්පන්න නොවී බැහැරවුවත් අධිපති නොවන ක්‍ෂණයේ දී ප්‍රත්‍යයෝත්පන්නයෙහි ඇතුළත් වන බැවින් ස්වරූප ගැනීමේ දී අඩු නොකොට 'සාධිපති ජවන 52 දෙපණසය - විචිකිච්ඡා වර්ජිත චෛතසික එක්පණස යැයි කියනු ලැබේ. විචිකිච්ඡාව වනාහි තමා

යෙදෙන මෝහ මූලද්වය ඇතුළත් නොවන බැවින් බැහැර කරන ලදී.

(මෙසේ අධිපතිප්‍රත්‍යය ඇත්තා වූ ක්‍ෂණයේ දී ප්‍රත්‍යයෝත්පන්න නොවී බැහැරවන බැවින් ඇතැම් ත්‍රිරාශි පොත්වල "අධිපති ප්‍රත්‍යය ලැබෙන්නා වූ ක්‍ෂණය, නියතයෙන් ලැබෙන්නා ක්‍ෂණය"යි නොකියා, "අධිපති ප්‍රත්‍යය ඇත්තා වූ ක්‍ෂණයෙහි නියතයෙන් ඇත්තා වූ ක්‍ෂණයෙහි අධිපති ධර්මයන් වර්ජිත වූ" යයි තව ක්‍රමයක් දක්වා තිබේ. ඒ නය ක්‍රමයට ගැලපෙන අභිධෙයාර්ථයක් ලැබුනේ වී නමුත් "අධිපති ලැබෙන ක්‍ෂණයෙහි නියතයෙන් ලැබෙන ක්‍ෂණයෙහි" යනුම ස්වභාවාර්ථය වේ) සාධිපති චිත්තජ රූප යනු අධිපති ලබන්නා වූ සිත් නිසා උපදින රූපයෝය.

**ප්‍රත්‍යනීකයෝ:-** "අධිපති ප්‍රත්‍ය නොලැබෙන ක්‍ෂණයේ දී" යන වචනය අධිපති ප්‍රත්‍යය ලැබිය යුතු ලෝභ මූල, දෝස මූල, මහාකුසල, මහාක්‍රියා ජවනයන් හා ඒ ජවනයන් සමඟ යෙදෙන්නා වූ චෛතසිකයන් සඳහා කියන ලදී. ඒ ධර්මයෝ අධිපති ප්‍රත්‍යය ලැබෙන කල්හි ප්‍රත්‍යයෝත්පන්න වී අධිපති නොලැබෙන කල්හි මේ ප්‍රත්‍යනීකයෙහි ඇතුළත් වෙති. "නියතයෙන් නොලැබෙන්නා වූ ක්‍ෂණයෙදී" යන වචනය වනාහි අධිපතිප්‍රත්‍යය කිසිසේත් නොලැබිය හැකි වූ මෝහමූල සිත්ය, අහේතුක ක්‍රියාය. කාම විපාකය, මහත්ගත විපාකය යන මේ සිත් හා ඔවුන් සමඟ යෙදෙන්නා වූ චෛතසිකයන් සඳහා කියන ලදී. ඒ ධර්මයෝ ප්‍රත්‍යනීකයෙහි නියතයෙන් ඇතුලත් වෙති.

"අධිපති ප්‍රත්‍යය ඇත්තා වූ, නියතයෙන් ඇත්තා වූ ක්‍ෂණයේ දී සාධිපති ජවන 52 දෙපණස වූ නාමස්කන්ධයෙහි ලැබෙන්නා වූ අධිපති ධර්ම තුන (3) හෝ සතර (4) අතුරෙන් එකෙකක්" යනු වනාහි ප්‍රත්‍යය ලැබෙන කල්හි ප්‍රත්‍යය ඇත්තා වූ ධර්මයන්ම දක්වන වචනයකි. ලෝභමූල ප්‍රථම සිතෙහි ඡන්දය ප්‍රත්‍යයොත්පන්නයෙහි ඇතුළත් නොවිය හැකි බැවින් ප්‍රත්‍යනීකයෙහි ඇතුළත් වේ. මේ ආදී වශයෙන් ප්‍රත්‍යය ඇත්තා වූ ධර්ම එකෙකක් ප්‍රත්‍යනීකයෙහි

ඇතුළත් වේ යයි දතයුතු. "නිරාධිපති චිත්තජ රූප" යනු අධිපති නොලැබෙන්නා වූ සිත නිසා උපදින රූපයෝය."

**ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න වන අයුරු:-**

ලෝභ මූල ප්‍රථම සිතෙහි චෛතසික එකුන් විස්ස (19) ක් යෙදෙති. චිත්තය බලවත් වන කල්හි උපන් සිත අධිපති ප්‍රත්‍යය වේ. ඡන්ද වීර්යයන් හා එකට උපදනා චෛතසික දහ නවය (19) සහ චිත්තජ රූපයෝ ප්‍රත්‍යයෝත්පන්නයෝය. (මෙහිදී ප්‍රත්‍යය ඇත්තා වූ සිත ප්‍රත්‍යනීකයෙහි ඇතුළත් වේ.) ඡන්දය බලවත් වීමේ දී ඡන්දාධිපති වන ආකාරයද, වීර්යය බලවත් වීමේ දී වීරිය අධිපති වන ආකාරයත් ද විස්තර කොට දත යුතුය. ඥාණය හා යෙදෙන්නා වූ මහා කුශල ආදියෙහි ද ඥාණය බලවත් වීමේ දී වීමංසාධිපති ප්‍රත්‍යය වන ආකාරය ද දැනගන්න. ප්‍රත්‍යය ඇත්තා වූ එක එක ධර්මය ප්‍රත්‍යනීකයෙහි නියතයෙන් ඇතුළත් වෙති.

**අභ්‍යාස ප්‍රශ්න:**

1. සහජාතාධිපති ප්‍රත්‍යයේ ශක්තිය උපමාවක් සමඟ දක්වන්න.
2. මුහුදේ පීනීමේ දී මහාජනක බෝසතාණන්ගේ සිතෙහි විරියාධිපති ඇත්තා වූ ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න දක්වනු.
3. ප්‍රත්‍ය ධර්මයෙහි "ඇත්තා වූ" "නියමයෙන් ඇත්තා වූ" යන දෙපදයේ අභිප්‍රාව දක්වා ඒ දෙපදයට සම්බන්ධ ධර්ම කොටස ද දක්වන්න.
4. සාධිපති ජවන යන වචනයේ අදහස දක්වනු.
5. "අධිපති ප්‍රත්‍යය ලැබෙන ක්‍ෂණය නිත්‍යයෙන් ලැබෙන ක්‍ෂණය" යන ප්‍රත්‍යයොත්පන්න වචනයේ "ලැබෙන නිත්‍යයෙන් ලැබෙන" මේවායේ අභිප්‍රාව වෙන් කොට, මේ දෙපදයට සම්බන්ධ ධර්ම කොටස ද වෙන්කොට දක්වනු.
6. ප්‍රත්‍යනීකයෙහි "අධිපති ප්‍රත්‍යය නොලැබෙන නිත්‍යයෙන් නොලැබෙන ක්‍ෂණයේ දී" යන වචන දෙකට සම්බන්ධ ධර්ම රාශිය වෙන් කොට කියන්න.

7. ඉගෙනීමට බලවත් ඡන්දය ඇති පුද්ගලයාගේ මහා කුශල ප්‍රථම චිත්තචෛතසික දක්වා, ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න වන ආකාරය දක්වතොත් ඡන්දය ප්‍රත්‍යනීකයෙහි ඇතුලත් කිරීම සුදුසු ද නොවේ දැයි ද දක්වනු.

**අනන්තරප්‍රත්‍යත්‍රිරාශියඃ-**

අනන්තරප්‍රත්‍යය යන ප්‍රත්‍යයොද්දේශයෙහි ස්වරූපාර්ථයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්නය ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙති. ඒ තුන අතුරෙන් රහතන් වහන්සේලාගේ චුති සිත හැර පූර්ව පූර්ව වූ සිත් එකුන් අනූව (89) ය. චෛතසික දෙපණසය යන මේ ධර්මයෝ අනන්තර ප්‍රත්‍ය ඇත්තා වූ (වන්නා වූ) ධර්මයෝ නම් වෙති. රහතන් වහන්සේගේ චුතිසිත හා පසු පසු වූ සිත් එකුන් අනූව (89) ය. චෛතසික දෙපණසය (52) යන මේ ධර්මයෝ අනන්තර ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ නම් වෙති. චිත්තරූප, පටිසන්ධි කර්මජ රූප බාහිර රූප ආහාරජරූප උතුජ රූප අසඤ්ඤ සත්ත්ව කර්මජරූප පවත්තිකර්මජ රූප යන මේ ධර්මයෝ අනන්තර ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීක ධර්මයෝ නම් වෙති.

**සමනන්තර ප්‍රත්‍යය ද මීට සමානය**

**අනන්තර පච්චයොඃ-** අනන්තර යන්නෙහි අන්තර ශබ්දය අන්තර කාලයට ද, මුල් සිතටත් පසු සිතටත් මධ්‍යයෙහි ඇති ධර්මාන්තරයට ද කියනු ලැබේ. දෙවැනි නයෙහි "අන්තරයති අතරක් තබයි. ඉති, ඒ නිසා, අන්තරං, අන්තර නම් වේ. යයි නාම ධාතුවෙන් කල්පනා කරයි. "නත්ථි යෙසං අන්තරන්ති අන්තරා" යෙසං, යම් ධර්මයක් හට, අන්තරං අතරක්, නොහොත්, අතරක් දක්වන්නා වූ ධර්මයක්, නත්ථි, නැද්ද, ඉති, ඒ නිසා, තෙ, ඒ ධර්මයෝ, අනන්තරා, අනන්තර නම් වෙති. මේ විග්‍රහ තේරුමෙන්, පූර්ව සිත, පසු සිත යන දෙකම අනන්තරයයි කියවෙන්නේ නමුත්, එසේ අන්තරයක් නැත්තා වූ පූර්ව සිත ප්‍රධානම වන බැවින්, පූර්වචිත්තයාගේ ශක්තියම අනන්තර ප්‍රත්‍ය වේ.

**නැවත විස්තර කරන්නෙමිඃ** පූර්ව පූර්ව චිත්තයන්හි තමාගේ නිරෝධයෙන් පසු නැවත සිත් කොටසක් ඉපදවිය හැකි ශක්ති

විශේෂයක් තිබේ. එසේ සිත් ඉපදවීමේ දී ද "කොයි කවර සිතක් හෝ උපදීවායි" කියා යම්කිසි උපකාරයක් නොකරත්, වීථි කාණ්ඩයෙහි දක්වන ලද චිත්තනියාමයට අනුව, චක්ඛුවිඤ්ඤාණ සිත තමා (ළඟට) අනතුරුව සම්පටිච්ඡනය උපදවීමට ද, සම්පටිච්ඡන සිත තමාට අනතුරුව සන්තීරණ සිත ඉපදවීමට ද, මේ ආදී වශයෙන් තමාට අනතුරුව සම්බන්ධ චිත්ත චෛතසිකයන්ම උපදවීමට උපකාර කරයි. ඒ නිසා තමාට අනතුරුව සුදුසු පරිදි චිත්තයන් චිත්ත නියාමයට අනුව උපදවීමට සමර්ථ වූ පූර්ව පූර්ව චිත්තයාගේ ශක්තිය අනන්තර ප්‍රත්‍යයයි දතයුතු."

**පාඩම් කළයුතු:**

"නියමය අනුවැසිත් - අනතුරුවැ ඉපදීමට
උපකාර වන සැත් - අනන්තර පසනමැයි දතයුතු"

**සමනන්තර පච්චයෝ:** සුට්ඨු අනන්තරාති සමනන්තරා" සුට්ඨු, අතිශයින්, අනන්තරා, අතරක් නැත්තාවූ ධර්මයෝ නොහොත්, කිසිසේත් අතරක් දක්වන ධර්මයක් නැත්තා වූ ධර්මයෝ, සමනන්තරා, සමනන්තර නම් වෙති. (සං + අනන්තර - යි පද සිඳිය යුතුය. සං සබ්දය, අතිශය අර්ථයට කියයි.) අතිශයින් අතරක් නැතිව පසු සිත් උපදවීමට උපකාර විය හැකි පූර්ව චිත්තයාගේ ශක්තිය සමන්තර ප්‍රත්‍යය නම් වේ. "අතිශයින් අතරක් නැති" යන වචනයේ අදහස වනාහි පූර්ව සිත පසුසිත යැයි සිත් දෙකොටස වෙන් කළ හැකි වුවත් පූර්ව චිත්තයාගේ භංගය හා පසුචිත්තයාගේ උප්පාදයට අතරක් නොලැබෙන බැවින් එකම සිතක් මෙන් උපදින බැවින් 'අතිශයින් අතරක් නැති' යයි කීහ.

**පැහැදිලි කරන්නෙමි:** රූප ධර්මයෝ 8 ය. 9 ය. ආදි වශයෙන් පිඬුකොට කලාප කොට උපදින බැවින් සටහන් වශයෙන් ප්‍රකට වෙති. ඒ නිසා මේ රූප කලාපය, මේ කලාපයෙන් උඩ පිහිටියේය. යට පිහිටියේය. වම්පස පිහිටියේය. දකුණුපස පිහිටියේ යැයි වෙන් කිරීමට එක් කලාපයෙක්හි අතරක් ඇත. නාම ධර්මයන්ගේ වනාහි එසේ සටහනක් ද නැත. එකක්ෂණයෙක්හි සිත් දෙක තුන එකට

ඉපදීමක් ද නැති බැවින් එසේ වෙන් කිරීමක් නොලැබේ. පූර්ව චිත්ත අපර චිත්තයන් එක සිතක් මෙන් හැඟෙන ලෙස (එකිනෙකට) සම්බන්ධව උපදී.

**පාඩම් කළ යුතු**

"කිසි සටහනක් නැත - සිත්හි එකැතින් එකසැණ
දෙක තුන එකට පිඬුවී - ඉපදීමෙක් කැලම නැත"

මෙසිත උඩ යට හෝ - වම දකුණු පස හෝ කියා වෙන් කළ
නොහැකි වී - පෙර පසු දෙසිත එකමෙන්

"අතිශයින් ඉඩ නොපා - පසු සිත ඉපදවීමට,
උපකාර සැත් විසෙස් - සමනන්ත රැයි දත යුතු"

(මූලටීකාව) තත්ථ පුරිම පච්ඡිමානං නිරොධුප්පාදන්තරා භාවතො නිරන්තරුප්පාදන සමත්ථතා අනන්තර පච්චයො, රූපධම්මානං විය සණ්ඨානාභාවතො පච්චය පච්චයුප්පන්නානං සභාවට්ඨානාභාවතොච "ඉදමිතො හෙට්ඨා උද්ධං තිරියන්ති" විභාගාභාවා, අත්තනා එකත්ථම්ව උපනෙත්වා සුට්ඨු අනන්තර භාවෙන උප්පාදන සමත්ථතා සමනන්තර පච්චයතා"

මේ ටීකා වචනය අනන්තර සමනන්තරයන්ගේ ශක්ති විශේෂයක් නොදක්වන වචනයකි. 'සං' සබ්දය ගැන විශේෂ වූ තේරුමක් දක්වන වචනයකි. අනන්තර සමනන්තර යන්ගේ වනාහි ස්වරූප ධර්ම වශයෙන් හා උපකාරක ශක්ති වශයෙන් විශේෂයක් නැත. රූපයාගේ උත්පාදයටම උපචය සන්තති කියා දෙකක් වදාළාසේ එක ශක්ති විශේෂයටම අනන්තර සමනන්තර යැයි වෙනෙය්‍යජ්ඣාසයට අනුව දෙකක් කොට වදාළහ. මෙය සත්‍යයකි. පසුචිත්තයට, අන්තරයක් නැතිව ඉඩදීමට උපකාර විය හැකි පූර්ව චිත්තයාගේ ශක්තිය ඇතැම් ශ්‍රාවකයෙකුට අනන්තරපච්චයො යැයි වදාළ මාත්‍රයෙන් අවබෝධ වේ. ඇතැම් ශ්‍රාවකයෙකුට වනාහි 'සං' ශබ්දය ඇතුළත් කොට 'සමනන්තර පච්චයො' යැයි අතිශයින් අන්තරයක් නැතිව උපකාරවේ' යැයි දේශනා කිරීමෙන් අවබෝධ වේ.

ඒ නිසා අට්ඨ කථාවේ "යො අනන්තර පච්චයො. සෙව්ව සමනත්තර පච්චයො බ්‍යඤ්ජනමෙව හෙත්ථ නානං, උපචය සන්තති ආදී සු විය'යි කීහ. (මෙහි බ්‍යඤ්ජනමෙව නානං" යන්නෙහි ශබ්ද විශේෂ වනාහි අනන්තරයෙහි 'සං' ශබ්දය නොකියා සමනන්තරයෙහි සං සබ්දය ඇතුල් කරන ලදී. එසේ නමුත්, ශබ්දයෙහි වෙනස්කම් සංසබ්දය නිසා 'අතිශයින්' යන අර්ථයත් වැඩිවීම පමණකි. 'බ්‍යඤ්ජනමෙව' යන්නෙහි 'එව' ශබ්දය වනාහි ස්වරූප විශේෂයක් නොලැබෙන බව (ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න විශේෂයක් නැති බව) දක්වයි.

වාදාන්තරයක්, ආචාර්ය ආයුෂ්මත් රේවත ස්ථවිරයෝ වනාහි - අත්ථානන්තරතාය, අර්ථ ද්‍රව්‍ය පරමාර්ථ ධර්මයෙන් අතරක් නැතිව උපදිනා බැවින්, අනන්තර පච්චයො, අනන්තර ප්‍රත්‍ය නම් වේ, කාලානන්තරතාය, කාලයකින් අතර නැතිව උපදින බැවින් සමනන්තර පච්චයො, සමනන්තර ප්‍රත්‍ය නම් වේ' යැයි අනන්තර ප්‍රත්‍යය හා සමනන්තර ප්‍රත්‍යය විශේෂ කොට කියති. ඒ කතාවට අනුව චක්ඛු විඤ්ඤාණයේ භංගය හා සම්පටිච්ඡන චිත්තයාගේ උප්පාද අන්තරයෙහි පරමාර්ථ ධර්මයකින් අන්තරයක් නැතිව චක්ඛු විඤ්ඤාණ සිත විසින් සම්පටිච්ඡන සිතට උපකාර කිරීම අනන්තර ශක්තිය නම්. චක්ඛුවිඤ්ඤාණ සිතේ භංගක්‍ෂණයේ දී කාලයකින් අතරක් නැතිව සම්පටිච්ඡන සිත ඉපදීමට උපකාර වනුයේ සමනන්තර ශක්තිය නම් වේ යැයි කියවේ. ඒ ආයුෂ්මත් රේවත ස්ථවිරයන්ගේ කථාව 'නිරෝධ සමවතට සමවැදීමට මුලින් නෙව සඤ්ඤානාසඤ්ඤා ජවන් සිත, සමවත ඇතුලේ දී කාලාන්තරයකින් පසුව ඵලජවනයට සමනන්තර ශක්තියෙන් උපකාරවේ" යනුවෙන් වදාළ පාලිය සමඟ නොගැලපේ යැයි අටුවාවේ කියා ඇත.

**නැවත විස්තරය කරම්:** අටුවාවෙහි "නිරොධ සමවතට සමවැදීමේ දී පූර්ව වූ නෙවසඤ්ඤා නාසඤ්ඤා ජවන් සිත සමාපත්තියෙන් නැගිටින කාලයේ ඵලජවනයට, සමවන් කාලයේ කාලයෙන් අතරක් ඇතත් පරමාර්ථ ධර්මයකින් අතරක් නූන බැවින් අනන්තර සමනන්තර ශක්ති දෙක විසින්ම උපකාර කරනු ලැබේ. අසඤ්ඤ සත්ත්ව භූමියට යාමට පෙර කාම භූමික චුති සිත අඤ්ඤසත්ත්ව

භූමියෙහි කල්ප 500 පන්සියයක කාලයක් අතර වූයේ නමුත් අසඤ්ඤසත්වයෙන් නැවත කාම භූමියෙහි උපදින්නා වූ පටිසන්ධි සිතට උපකාර කරයි. ඒ නිසා අනන්තර සමන්තරයන්හි කාල අන්තරයක් නැතිකම නොකිය යුතු. පරමාර්ථ ධර්මයකින් අතරක් නැතිකම පමණක්ම අනන්තර සමනන්තර යැයි ගතයුතුය. මේ අටුවා අදහසට අනුව අනන්තරයෙහි අන්තර යනු අන්තරවන්නාවූ ධර්මයක්ම ගත යුතු. කාලාන්තරය නොගත යුතුය."

**මූලටීකාවෙහි**:- කාලය යනු පරමාර්ථ ධර්මයන්ට ඉපදීමට අවකාශය ගැන කියනු ලබන පඤ්ඤත්තියකි. නිරෝධ සමවතට සමවන් කාලය, අසඤ්ඤසතත්වයෙහි උපදින කාලයයි. නාම ධර්මයන්ට උපදීමට නාමකාලය නොවේ. රූප ධර්මයන්ට උපදීමට රූප කාලය වේ. නාම ධර්මයන්ගේ පරම්පරාවට නාම කාල අන්තරයක් ඇති නැති බව සුදුසු පරිදි කල්පනා කටයුතු වේ. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ජවනය හා ඵලජවනයය. අසඤ්ඤසතත්ව පූර්ව චුතිය හා පසුපටිසන්ධිය යන මොවුන්ගේ නාම කාලාන්තරයක් නැත. එසේ නාම කාල අන්තරයක් නැති බවම 'අනන්තර' කියා ගැනීමට සුදුසු බැවින් ආයුෂ්මත් රේවත ස්ථවිරයන්ගේ කථාවට උසස් කොට දක්වා ඇත. මේ අදහස අනන්තර සමනන්තර යන්නෙහි කාල අන්තරයක් නොලැබීම, පරමාර්ථ ධර්මයකින් අතරක් නොලැබීම යන මේ දෙකම ගනු ලැබෙති.

**චෝදනාවක්**:- නිරෝධ සමවතට සමවන් කාලයේ සහ අසඤ්ඤ සත්ත්ව භූමියෙහි උපන් කාලයෙහි රූපධර්ම පමණක් උපදිති. ඒ රූප ධර්මයෝ නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ජවනය හා ඵලජවනයන්ට ද, අසඤ්ඤ සත්ත්වයට පූර්වචිත්තය හා පසු පටිසන්ධියට ද අන්තර වන්නේ නොවේදැයි? චෝදනාවක් වේ.

**පිළිතුර**: රූපපරම්පරාව සහ නාමපරම්පරාව ප්‍රකෘතියෙන්ම අසමාන වෙති. ඒ නිසා රූප ධර්ම පරම්පරාව නාම ධර්ම පරම්පරාවෙහි ඇතුළත් කිරීමට නොහැකිය. ඒ නිසා පූර්ව පූර්ව ජවනය පසුපසු ජවනයන්ට උපකාර වන්නාසේ ද, පූර්ව පූර්ව භවංගය පසුපසු භවංගයට උපකාර වන්නාසේ ද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන

ජවනය ඵලජවනයට ද අසඤ්ඤසත්ත්ව භූමියට යාමට පෙර කාම භූමියෙහි චුති සිත අසඤ්ඤසත්ත්වයෙන් නැවත කාම පටිසන්ධියට ද පරමාර්ත්ථ ධර්මයන් අතර නොවී එකම සම්බන්ධය ඇතිව උපකාර වේ.

**ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නයෝ:-** රහතන් වහන්සේගේ චුති සිතෙන් පසුව උපකාර ලැබිය යුතු සිතක් නොඋපදනා බැවින් ප්‍රත්‍ය ධර්මයෙහි රහතන් වහන්සේගේ චුති සිත හැර, චුතියට පූර්ව ජවනය හෝ භවංගය රහතන් වහන්සේගේ චුති සිතට උපකාර වන බැවින් රහතන් වහන්සේගේ චුති සිත ප්‍රත්‍යයොත්පන්නයෙහි ඇතුළත් වේ. ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නයන් වන ක්‍රමය, වීථි චිත්ත පරම්පරාව බලා සම්ප්‍රයුක්ත චෛතසිකයන් හා එකට උපදින පඤ්චද්වාරාවජ්ජනය ප්‍රත්‍යය නම්. සම්ප්‍රයුක්ත චෛතසිකයන් සමග එකට උපදින චක්ඛුවිඤ්ඤාණ සිත ප්‍රත්‍යයොත්පන්න නම් මේ ආදී වශයෙන් තදාරම්මණය තෙක්ද, දෙවැනි තදාරම්මණ චිත්තොත්පාදය ප්‍රත්‍යය. ප්‍රථම භවංග චිත්තොද්පාදය ප්‍රත්‍යයොත්පන්නය. ප්‍රථම භවංග චිත්තොත්පාදය ප්‍රත්‍යය. දෙවැනි භවංග චිත්තොත්පාදය ප්‍රතයොත්පන්නය යනාදී වශයෙන් ද නිරෝධ සමවත් කාලයේ සමවතට සමවැදීමට පූර්වයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුශල (හෝ) ක්‍රියාජවන චිත්තොත්පාදය ප්‍රත්‍යය. සමවතින් නැගිටින කාලයේ අනාගාමි ඵල ජවනය හෝ අර්හත් ඵලජවනය ප්‍රත්‍යයෝත්පන්නය, පූර්වභවයෙහි චුති චිත්තොත්පාදය ප්‍රත්‍යය. මේ භවයේ ප්‍රතිසන්ධි චිත්තොත්පාදය ප්‍රත්‍යයෝත්පන්නය. අසඤ්ඤසත්ත්ව භූමියට යාමට පූර්වයෙහි කාම භූමියෙහි චුති චිත්තොත්පාදය ප්‍රත්‍යය (අසඤ්ඤසත්ත්ව භූමියෙන් චුතවී) නැවත කාම භූමියෙහි උපදනා පටිසන්ධි චිත්තොත්පාදය ප්‍රත්‍යයොත්පන්නය. මෙසේ පිරිනිවන් නොපාන තෙක් පූර්ව පූර්ව චිත්ත චෛතසිකයෝ පසු පසු චිත්ත චෛතසිකයන්ට අනන්තර ශක්තියෙන් උපකාර වෙති. රූපධර්මයෝ වනාහි එසේ උපකාර නොලබනා බැවින් නියතයෙන් ප්‍රත්‍යනිකයෙහි ඇතුලත් වෙති. (මේ ප්‍රත්‍ය දෙකෙහි අනන්තර ප්‍රත්‍යය සක්විති රජකු දිවංගතවීමට සමානය. සමනන්තර ප්‍රත්‍යය සක්විති රජකුගේ නෛෂ්ක්‍රම්‍යයට

සමානයැයි පූර්වාචාර්යයෝ උපමාවක් දැක්වූහ. (අටුවාවෙහි උපමාවක් දක්වා නැත) සක්විති රජකු දිවංගත වීමෙන් හෝ නෛෂ්ක්‍රම්‍ය කිරීමෙන් පසු දෙටු රාජ කුමාරයා රාජ්‍යයට පත්වීම නියමයෙන් වෙන්නා සේ එසේම පූර්ව පූර්ව චිත්තචෛතසිකයන් නිරුද්ධ වන කල්හි නියාම ධර්ම ක්‍රමයට පසු පසු සිත් ඉපදීමට අනන්තර සමනන්තර ශක්තියෙන් උපකාර කොට නිරුද්ධ වෙති. පූර්වාචාර්යයෝ වනාහි දිවංගත වී නෛෂ්ක්‍රම්‍ය කිරීමට වඩා දෙටු පුත් රජයට පත්වීම නියතය. අනන්තරයටද වඩා 'සං' ශබ්දයෙන් විශේෂවත් වූ සමනන්තරය නියතය. ඒ නිසා පූර්වාචාර්ය උපමාව මාරුකොට අනන්තරය හා නෛෂ්ක්‍රම්‍යයද සමනන්තරය හා දිවංගතවීම ද සමාන වේ යැයි කියන ලදී)

**අභ්‍යාස ප්‍රශ්ණ:**

1. අනන්තර පදයෙහි අන්තර ශබ්දය කුමන අර්ථයකට (කවරෙක්හිලා) කියනු ලැබේ ද?
2. කිනම් ශක්තියකට අනන්තර ප්‍රත්‍ය යැයි කියනු ලැබේද?
3. සමනන්තරයෙහි 'අතිශයින් අතරක් නැති' යන කථාවෙහි අතිශයින් අතරක් නැති බව පැහැදිළි කොට පෙන්වන්න.
4. අනන්තරය හා සමනන්තරයෝ ස්වරූප වශයෙන් ශක්ති වශයෙන් විශේෂ ද සමාන ද, සමාන නම් කුමක් නිසා ප්‍රත්‍ය දෙකක් කොට දේශනා කරන ලද්දේ ද?
5. පරමාර්ථ ධර්මයකින් අතරක් නැති බවඅන්තරය කාලයකින් අතරක් නැති බවට සමනන්තර යැයි කියන කෙච්වාදයෙහි ඒ වාදය ඉවත් කිරීමට අටුවාවේ කිනම් කරුණක් කොතැනක දක්වා ඇත්ද?
6. නිරෝධ සමවතට සමවදින කාලයේ ඊට මුලින් ඇති චතුත්ථාරූප්පජවනය නිරෝධයෙන් නැගිටින කල්හි ඵලජවනයට උපකාර වීමේ දී ද, අසඤ්ඤසත්ත්ව භූමියට යාමට මුලින් ඇති චුතිසිත අසඤ්ඤ සත්ත්වයෙන් නැවත කාම භූමියේ පටිසන්ධි සිතට උපකාර වීමේ දී ද, රූප පරමාර්ථ ධර්මයෝ අතරක් කරන්නාහුය යනුද සත්දිනක් හා කල්ප 500 පන්සියයක

කාලයක් අන්තර වන්නාහුය යනු ගත යුතුද නොගත යුතු දැයි (මූලටීකා අදහසට අනුව) කල්පනා කළ යුත්ත විමසන්න.

7. ප්‍රත්‍යයෙහිලා රහතන් වහන්සේගේ චුතිසිත අත්හරින ආකාරය ද ප්‍රත්‍යයොත්පන්නයෙහි ඒ චුතිසිත ඇතුලත් වන ආකාරය ද පැහැදිළි කරන්න.

8. මේ ප්‍රත්‍යදෙකට උපමාවක් දක්වා ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්නවන ආකාරය චක්ඛුද්වාරික වීථියකට අනුව දක්වන්න.

**සහජාත ප්‍රත්‍යද්විත්‍රිරාශිය**

සහජාත පච්චයො යන ප්‍රත්‍යයොද්දේශයෙහි ස්වරූපාර්ථයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න වශයෙන් දෙවැදෑරුම් වෙත්. ඒ දෙක අතුරෙන් අන්‍යොන්‍යනයන්ට ද, අන්‍යොන්‍ය නාමස්කන්ධ චිත්තජ රූප පටිසන්ධි කර්මජ රූපයන්ට ද 'උපකාර' ඇත්තා වූ සියලු සිත් 89 එකුන් අනූවය. චෛතසික දෙපණසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි 4 නාමස්කන්ධයෝය, ඔවුනොවුන් සහ උපාදාරූපයන්ට උපකාර ඇත්තා වූ චිත්තජරූප පටිසන්ධි කර්මජරූප බාහිර රූප ආහාරජරූප උතුජ රූප අසඤ්ඤසත්ව කර්මරූප, ප්‍රවෘත්ති කර්මරූප වශයෙන් සියලු මහාභූත 4 සතරය, ඔවුනොවුන්ට උපකාර ඇත්තා වූ පඤ්චවොකාරයෙහි පටිසන්ධි නාමස්කන්ධයෝය. හදයව ස්තුය යන මේ ධර්මයෝ සහජාත ප්‍රත්‍ය වන්නා වූ ධර්මයෝ නම් වෙති. ඔවුනොවුන්ගෙන් උපකාර ලබන්නා වූ සියලුම 89 එකුන් අනූ චිත්තයෝය. චෛතසික දෙපණසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි සතර නාමස්කන්ධයෝය.

උපාදාරූප ඇතුලු සතර මහා භූතයෝය. පඤ්චවොකාර පටිසන්ධිනාමස්කන්ධයෙන් උපකාර ලබන්නා වූ හෘදය වස්තුවය. හෘදය වස්තුවෙන් උපකාර ලබන්නා වූ පඤ්චවොකාර පටිසන්ධි නාමස්කන්ධයෝය යන මේ ධර්මයෝ සහජාත ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝතපන්න ධර්මයෝ නම් වෙති. (ප්‍රත්‍යනීක ධර්ම නොලැබෙති)

සහජාත පච්චයො:- ජායති, උපදී, ඉති, ඒ නිසා, ජාතො, ජාතනම් (ජනධාතුවට තප්‍රත්‍යවිය, 'ජනාදීන මාතිමහි' යන සූත්‍රයෙන් න,

හට ආ කරන ලදී) සහ- එකට, ජාතො, උපන් ධර්මය, සහජාතො, එකට උපන් ධර්මය නම් වේ. තෙල්පහන දැල්වීම හා සමගම ආලෝකය පහළවීමට උපකාර වන්නාක් මෙන් තමාගේ ඉපදීමත් සමඟම එකට ප්‍රත්‍යයෝත්පන්නය හට උපදීමට උපකාර විය හැකි ශක්ති විශේෂය සහජාත ප්‍රත්‍ය නම් වේ. එසේ සහජාත වශයෙන් උපකාර වීමේ දී එකට උපදින සියලුම ධර්මයන්ට සහජාත ශක්තිය නැත. පැහැදිළි කරන්නෙමි. මවුපිය දෙදෙනෙක් කුඩා ළදරුවන් සමඟ ගමනක් යාමේදී මවුපිය දෙදෙනාට නම් ඔවුනොවුන්ට උපකාර කළ හැකි බලයක් ඇත. නමුත් පුංචි ළදරුවන්ට එසේ විශේෂ ශක්තියක් නැත. එසේ චිත්ත චෛතසිකයන් ඔවුනොවුන්ට ද මහාභූතයෝ ඔවුනොවුන්ට ද, ප්‍රතිසන්ධි නාමස්කන්ධ හා හෘදය වස්තුව ඔවුනොවුන්ට ද සහජාත ශක්තියෙන් උපකාර කළ හැකි නමුත් එකට උපදින අන්‍ය රූපයනට විශේෂ බලයක් නැති බැවින් ඒ එකට උපදින රූපයන් විසින් සහජාත ශක්ති වශයෙන් පෙරළා උපකාර නොකළ හැකිය.

පාඩම් කරන්නඃ

"තෙල් පහනක එළිය - දැල්වෙනු සමඟ දිස්වෙත, එමෙන් සහදැ දම්හට උපකාර සහජාත නම්"

**නාමස්කන්ධ හා රූපඃ-** ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න වන ආකාරය සංග්‍රහ වචනයට අනුව සුදුසු පරිද්දෙන් විස්තර කරන්නෙමි. "ඔවුනොවුන්ට ද, ඔවුන්නොවුන් නාමස්කන්ධ චිත්තජරූප පටිසන්ධි කර්මජ රූපයන්ට  ද, උපකාර ඇත්තා වූ සිත් 89. එකුන් අනූවය චෛතසික දෙපණසය යන පවත්ති පටිසන්ධි නාමස්කන්ධ සතර"යි කියන ලද වචනය, "චිත්ත චෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සහජාත රූපානඤ්ච" යන සංග්‍රහ වචනයට සිංහලෙන් දෙන ලද තේරුමය. ඒ වචනයෙන් ලැබෙනුයේ නාමස්කන්ධ යැයි කියන ලද සතර නාමස්කන්ධයෝ හා චිත්ත චෛතසික ධර්මයෝමය. ඒ නාමස්කන්ධය ද, ප්‍රවෘත්ති කාලයේ ඇති නාමස්කන්ධය, ප්‍රතිසන්ධි කාලයේ වූ නාමස්කන්ධය කියා දෙකක් වේ. ඒ දෙක අතුරෙන් ප්‍රතිසන්ධි නාමස්කන්ධය තම තමා ඔවුනොවුන්ට ද, එකට උපදනා වූ ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද, උපකාර වෙති.

ප්‍රවෘත්ති නාමස්කන්ධයෝ වනාහි ඔවුනොවුන්ට ද එකට උපදනා වූ චිත්තජ රූපයන්ට ද උපකාර වෙති. 1. ඔවුනොවුන්ට ද, අන්‍යොන්‍ය නාමස්කන්ධයෝ චිත්තරූප පටිසන්ධි කර්මජ රූපයන්ට ද යැයි කියන ලද වචනය, දෙකට වෙන් කළ යුතුය. ඒ දෙක අතුරෙන් පළවැනි වචනයෙන් චතුවොකාර භූමියෙහි උපදනා වූ නාමස්කන්ධයන් සහ පඤ්චවොකාර භූමියෙහි රූප නොඋපදවිය හැකි චක්ඛුවිඤ්ඤාණාදී නාමස්කන්ධයන් දක්වති. දෙවැනි වචනයෙන් පඤ්චවොකාර භූමියෙහි පටිසන්ධි නාමස්කන්ධයන් හා රූප ඉපදවිය හැකි ප්‍රවෘත්ති නාම ස්කන්ධයෝ දක්වන ලදහ. 'ඇත්තාවූ' යන වචනයෙහි 'උපකාර ඇත්තා වූ' යනු කියන ලදී. 'ඔවුනොවුන්ට' යන්නෙහි නාමස්කන්ධයෝ ඔවුන් ඔවුන් හට මාරුවෙමින් උපකාර කරත් යැයි කියන ලද්දේ වේ.

පළමුවැනි වචනයේ ප්‍රත්‍ය ප්‍රත්‍යයොත්පන්න වන අයුරු චතුවොකාර භූමියෙහි පටිසන්ධි කාලයෙහි අරූප විපාක චිත්ත චෛතසික සංඛ්‍යාත වූ පටිසන්ධි නාමස්කන්ධ ඉපදීමේ දී විඤ්ඤාණස්කන්ධය ප්‍රත්‍යවේ. ඉතිරි නාමස්කන්ධ තුන ප්‍රත්‍යයොත්පන්න වෙති. ඉතිරි නාමස්කන්ධ තුන ප්‍රත්‍යය වෙති. විඤ්ඤාණස්කන්ධය ප්‍රත්‍යයොත්පන්න වේ. වේදනාස්කන්ධය ප්‍රත්‍යවේ. සෙසු නාමස්කන්ධ තුන ප්‍රත්‍යයොත්පන්නයහ. සෙසු නාමස්කන්ධ තුන ප්‍රත්‍යය. වේදනාස්කන්ධය ප්‍රත්‍යයොත්පන්නය. මේ ආදී වශයෙන් එක ස්කන්ධක් ප්‍රත්‍යය. සෙසු තුන ප්‍රත්‍යයොත්පන්නය. ඒ සෙසු තුන ප්‍රත්‍යය. ඉතිරි එක ප්‍රත්‍යයොත්පන්නයයි ද, ස්කන්ධ දෙකක් ප්‍රත්‍යය. ඉතිරි ස්කන්ධ දෙක ප්‍රත්‍යයොත්පන්නයයි ද, මාරුකොට දැක්විය යුතුය. චතුවොකාර භූමික ප්‍රවෘත්ති කාලයෙහි හා පඤ්චවොකාර භූමියෙහි රූප ඉපදවිය නොහැකි චක්ඛුවිඤ්ඤාණාදිය උපදීමේදී ද මේ නය ක්‍රමයට සමනය.

දෙවැනි වචනයෙහි ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න වන අයුරුඃ- පඤ්චවොකාර භූමියෙහි ප්‍රතිසන්ධි කාලයේ සම්බන්ධවන චිත්ත චෛතසික සංඛ්‍යාත නාමස්කන්ධ හා කර්මජ රූපයන් උපදීමේ දී විඤ්ඤාණස්කන්ධය ප්‍රත්‍යය වේ. ඉතිරි නාමස්කන්ධ තුන සහ

කර්මජරූප ප්‍රත්‍යයොත්පන්න වෙති. ඒ ඉතිරි නාමස්කන්ධ තුන ප්‍රත්‍යය වෙති. විඤ්ඤාණස්කන්ධය හා කර්මජ රූප ප්‍රත්‍යයොත්පන්න වෙති. මේ ආදි ක්‍රමයෙන් එක් සකන්ධයක් ප්‍රත්‍යය වේ. ස්කන්ධ තුනක් සහ කර්මජ රූප ප්‍රත්‍යයෝත්පන්නයෝය. ස්කන්ධ තුන ප්‍රත්‍යය, එකස්කන්ධයක් හා කර්මජරූප ප්‍රත්‍යයෝත්පන්නය. ස්කන්ධ දෙකක් ප්‍රත්‍යය, ස්කන්ධ දෙකක් හා කර්මජ රූප ප්‍රත්‍යයොත්පන්න යැයි මාරුකොට දැක්විය යුතුය. (කර්මජ රූපය ප්‍රත්‍යයොත්පන්නයෙහිම ඇතුළත් වේ. හේ වනාහි ප්‍රත්‍යයෙහි ඇතුලත් නොවේ) ප්‍රවෘත්ති කාලයෙහි ලොභමූල ප්‍රථම චිත්ත චෛතසික සංඛ්‍යාත නාමස්කන්ධ සහ ඒ සිත නිසා චිත්තරූප උපදීමේ දී විඤ්ඤාණස්කන්ධය ප්‍රත්‍යය වේ. ඉතිරි ස්කන්ධ තුන හා චිත්තජ රූප ප්‍රත්‍යයොත්පන්න වේ. මේ ආදි ක්‍රමයෙන් සිත් උපදිනා උපදින ක්‍රමයට දැනගත යුතුයි.

**මහා භූත හා උපදාරූප**

"ඔවුනොවුන්ටද, උපාදාරූපයන්ට ද, ඇත්තා වූ චිත්තජ රූප පටිසන්ධිකර්මජ රූප (පෙ) සියලු මහාභූත සතර" යන වචනය "මහාභූතා අඤ්ඤමඤ්ඤං උපාදා රූපානඤ්ච යන සංග්‍රහ වචනයට සිංහලෙන් දී ඇති තේරුමය. ඒ වචනයෙහි මහාභූත සතර ඔවුනොවුන්ට පෙරළා උපකාර කරත්, තමන් හා එක කලාපයෙහි පිහිටි එකට උපන් උපාදාරූපයන්ට ද උපකාර වන බව දත යුතුයි. චිත්තජ පටිසන්ධිකර්මජ යනාදි වචනයෙහි චිත්තජ මහාභූත පටිසන්ධි කර්මජ මහාභූතාදී වශයෙන් මහාභූතයන්ටම කියන බව දත යුතු. 'සියලු මහාභූත' යනුවෙන් එකක් කොට නොකියා චිත්තජ පටිසන්ධි කර්මජ ආදී වශයෙන් එක එක වෙන් කොට කීම පාලියෙහි වදාළ ක්‍රමයට වෙන් වෙන්ව පැහැදිළිවීමටය.

ප්‍රත්‍යය ප්‍රතයෝත්පන්න වන ආකාරයඃ- චිත්තජ රූප කලාපයෙහි රූප පිඩුකොට රූප 8 ය. 9 ය ආදී වශයෙන් ඉපදීමේ දී එහි ඇත්තා වූ පඨවී ධාතුව ප්‍රත්‍යවේ ඉතිරි මහාභූත තුන හා උපාදා රූප ප්‍රත්‍යයොත්පන්න වෙති. ඉතිරි මහාභූත තුන ප්‍රත්‍යය පඨවී ධාතුව හා උපාදාරූප ප්‍රත්‍යයෝත්පන්න වෙති. මේ ආදී වශයෙන් එක් ධාතුවක් ප්‍රත්‍යය. ඉතිරි ධාතු තුන හා උපාදාරූප

ප්‍රත්‍යයෝත්පන්න වෙති. ධාතු දෙකක් ප්‍රත්‍යය වෙති. ඉතිරි ධාතු දෙක සහ උපාදාරූප ප්‍රත්‍යයෝත්පන්න වේ යැයි දත යුතු. මෙහිදී මහාභූතයෝ ඔවුනොවුන්ට පෙරළා උපකාර විය හැකිය. උපාදාරූපයන්ට වනාහි ප්‍රත්‍යයෙහි ඇතුළත් නොවිය හැකිය. නියතයෙන් ප්‍රත්‍යයෝත්පන්න වෙති. එසේම ප්‍රතිසන්ධි කාලයෙහි කායදසක කලාප ආදිය බාහිර උතුජ කලාපය.

ආහාරජ කලාප, ශරීරයෙහි උතුජ කලාප, අසඤ්ඤසත්ව කර්මජ කලාප, ප්‍රවෘත්ති කර්මජ කලාපයන්හි ඇතුළත් වූ මහා භූත හා උපාදාරූපද විස්තර කරන්න.

ප්‍රතිසන්ධි නාමස්කන්ධ හා හෘදය වස්තුව: 'ඔවුනොවුන්ට අනුමානිත වූ පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධය හෘදය වස්තුව' යැයි කී වචනය 'පටිසන්ධික්ඛණෙ වත්ථුවිපාකා අඤ්ඤමඤ්ඤං'යි කී සංග්‍රහ පාලියට සිංහලෙන් දුන් තේරුමයි. මේ වචනයෙහි පඤ්චවොකාර භූමියෙහි ප්‍රතිසන්ධි චිත්ත චෛතසිකයන් හා කර්මජ කලාපයෙහි හෘදය වස්තුව ඇතුළත් වී ඇති බැවින් 'ප්‍රතිසන්ධි චිත්ත චෛතසික සංඛ්‍යාත නාම ස්කන්ධ සතර ප්‍රත්‍යය. හෘදය වස්තුව ප්‍රත්‍යයොත්පන්නය. හෘදය වස්තුව ප්‍රත්‍යය. ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ප්‍රත්‍යයොත්පන්නය යි පඤ්චවොකාර භූමියෙහිම සත්වයන්ට සියලුම ප්‍රතිසන්ධි කාලයන්හි ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න වන බව ආකාරය දත යුතුයි.

මේ කියන ලද වචනයෙහි සහජාත තුන තේරුම් ගත යුතුය.

1. ඔවුනොවුන්ට ද, අන්‍යෝන්‍ය නාමස්කන්ධයෝ චිත්තජ රූප පටිසන්ධි කර්මජ රූපයන්ට ද, උපකාර කරන්නා වූ සතර නාමස්කන්ධයෝය.
2. ඔවුනොවුන්ට ද උපාදාරූපයන්ට ද, උපකාර වන්නා වූ සතර මහා භූතයෝය.
3. ඔවුනොවුන්ට උපකාර වන්නා වූ ප්‍රතිසන්ධි නාමස්කන්ධ, හෘදය වස්තු රූපයෝය. මෙසේ සහජාතය තුන්වැදෑරුම් වේ. ඒ නිසා 'තිවිධොහොති සහජාතපච්චයො'යි සංග්‍රහවෙහි කීහ.

ප්‍රත්‍යයොත්පන්නඃ- ඔවුනොවුන්ට උපකාර ඇත්තා වූ සිත් 89 එකුන් අනූවය. චෛතසික දෙපණසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ 4 සතරය' යන්නෙහි 'උපකාර ඇත්තාවූ' යනු 'අනුමානිතවූ' යන තේරුමට කීහ. 'නාමස්කන්ධ සතර ඔවුනොවුන්ට අනුමානිතව (පෙරළා) ප්‍රත්‍යයොත්පන්න වෙති. විඤ්ඤාණස්කන්ධය ප්‍රත්‍යය වුවොත් ඉතිරි නාමස්කන්ධ තුන ඒ විඤ්ඤාණස්කන්ධයට අනුමානිතව (පෙරළා) ප්‍රත්‍යයොත්පන්න වෙති. ඉතිරි නාමස්කන්ධ 3 තුන ප්‍රත්‍යය වුවහොත් ඒ නාමස්කන්ධ තුනට අනුමානිතව විඤ්ඤාණස්කන්ධය ප්‍රත්‍යයොත්පන්න වේ. මේ ආදී වශයෙන් ඔවුනොවුන් විසින් අනුමානිත වන ආකාරය දත යුතුය. ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නයන් පෙරළා ලැබිය හැක්කා වූ සියලු ප්‍රත්‍යයෝ, ප්‍රත්‍යයෝත්පන්නයෙහි 'අනුමානිත' යැයි·කියා සම්බන්ධ කරනු ලැබේ. ඇතැම් කෙනෙක් වනාහි අනුමානිත'යි කී තැන 'උපස්තම්භක වන්නා වූ'යි අදහස් කරති. ඒ අදහස 'ඔවුනොවුන් කෙරෙන්' යන අපාදාන වචනයට ගැලපෙන නොගැලපෙන බව සිතිය යුතුය. තවද එසේ 'උපස්ථම්භක' යනු ඨිතික්‍ෂණය සමගම සැසැඳේ. උප්පාදක්‍ෂණයෙහි උපකාර වන බව 'උපස්ථම්භක' වචනයෙන් නොකියවේ. ඒ නිසා 'රියනක් දිග දණ්ඩ වියතක් දිග දණ්ඩකින් මනින්නේ නම් දඬුව දිගවේ. දෙරියනක් ඇති දඬුවකින් මනින්නේ නම් දඬුව කොටවේ යයි උපනිධා උපමානිත දඬු උපමාව මෙන්ම 'උපමානිතය' කියන ලද්දේ යැයි දත යුතුය.

'උපාදාරූප හා සහජාත වන සියලුම මහාභූත සතර'යි කී තැන 'සියලුම' යනු චිත්තජමහාභූත. පටි කර්මජ මහාභූත. බාහිර මහාභූත උතුජ මහාභූත. අසඤ්ඤසත්ත්ව කර්මජ මහාභූත. ප්‍රවෘත්ති කර්මජ මහාභූත. වශයෙන් සියලුම මහාභූත යැයි කියන ලද්දේ වේ. ඒ මහා භූතයෝ ද ඔවුනොවුන්ට අනුමානිතව ප්‍රත්‍යයොත්පන්න වෙති. පඨවි මහා භූතය ප්‍රත්‍යය වී නම් ඒ පඨවී මහාභූතයට අනුමානිතව ඉතිරි මහාභූත තුන ප්‍රත්‍යයොත්පන්න වෙති. යනාදි වශයෙන් දත යුතුය. උපාදාරූපයෝ වනාහි

නිත්‍යයෙන් ප්‍රත්‍යයොත්පන්න වෙති. ඒ නිසා 'සියලුම උපාදාරූපයයි' නොකීවත් 'සියලුම උපාදාරූපයෝ' යැයි දත යුතුයි. 'පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෙන් අනුමානිත හෘදය වස්තුවය. හෘදය වස්තුවට කෙරෙන් අනුමානිත පඤ්චවොකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ'ය යන වචනයේ තේරුම දැන් අවබෝධයි. අන්‍යොන්‍යප්‍රත්‍යයොත්පන්නයෙහි ද මේ කීම ඇතුළත් වේ. ඇතැම් ත්‍රිරාශි ග්‍රන්ථවල 'පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට උපකාර ඇත්තා වූ හෘදය වස්තුවය. හෘදය වස්තුවට උපකාර ඇත්තා වූ පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය' කියා තිබේ. 'ඇත්තා වූ' යන වචනය වනාහි ප්‍රත්‍ය ධර්මයෙහිලා යෙදිය යුතු වචනයකි. ප්‍රත්‍යයොත්පන්නයෙහිලා කියයුත්තක් නොවේ. ඒ නිසා අන්‍යොන්‍ය ප්‍රත්‍යයෝත්පන්න වචනය හා නොගැලපෙන බැවින් සම්බන්ධ වන වචනයක් නොවන බැවින් ද ඒ කීම නුසුදුසුය.

**ප්‍රත්‍යනීකඃ-** මේ සහජාත ප්‍රත්‍යයෙහි සියලුම සංඛත ධර්මයෝ ප්‍රත්‍යයෝත්පන්නයෙහි ඇතුළත් වන බැවින් ප්‍රත්‍යනීක දැක්වීමට අවශ්‍ය නැත. නිබ්බාන පඤ්ඤත්ති ඉතිරි වුවත් හේතුවෙන් උපදනා වූ ඵල සංඛ්‍යාත ප්‍රත්‍යයොත්පන්නයෙහි අසංඛත සංඛ්‍යාත නිර්වාණය හා ප්‍රඥප්තීහු නියතයෙන් ඇතුළත් නොවන බැවින් ඒ ධර්මයන් නිසා ද ප්‍රත්‍යනීක දැක්වීමට නොහැකිය.

**අභ්‍යාස ප්‍රශ්නඃ**

1. සහජාත ශක්තිය උපමාවක් සමඟ දක්වන්න.
2. 'චිත්තචෙතසිකාධම්මා අඤ්ඤමඤ්ඤං සහජාත රූපානඤ්ච' යන සංග්‍රහ පාඨයෙහි සිංහල තේරුම පෙන්වන්න.
3. ඒ වචනයෙහි ලැබෙන 'චිත්ත චෙතසික ධම්මා අඤ්ඤමඤ්ඤං'යි කිනම් කලෙක කිනම් කිනම් ධර්ම

කොටසකට දක්වා 'චිත්ත චෙතසික, ධම්මං, සහජාත රූපානඤ්ච' යනුවෙන් කිනම් කලෙක කුමන ධර්ම කොටසකට දක්වන කියන ලදද.

4. ඒ වචන දෙකින් පළමු වචනයෙහි ප්‍රත්‍ය ප්‍රත්‍යයොත්පන්න වන ආකාරය ද, දෙවැනි වචනයෙහි ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න වන ආකාරය ද වෙනු වෙනම දක්වන්න.

5. 'මහාභූතා අඤ්ඤමඤ්ඤං උපාදරූපානඤ්ච' යන සංග්‍රහ පාඨයෙහි සිංහලට පෙරළා අර්ථ දක්වන්න.

6. චක්ඛුදසක කලාපයෙහි ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න වන ආකාරය දක්වන්න.

7. 'පටිසන්ධික්ඛණෙ වත්ථු විපාකා අඤ්ඤමඤ්ඤං' පාඨයෙහි සිංහල තේරුම දක්වා ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න වන ක්‍රමය දක්වන්න.

8. 'තිවිධොහොති සහජාත පච්චයො' යන්නෙහි ජහජාත තුන ගණන්කර පෙන්වන්න.

9. ප්‍රත්‍යයොත්පන්නයෙහි 'අනුමානිත' යන වචනයේ අදහස (මේ පොතේ කීම හා කෙච්වාදය) දක්වන්න.

10. මේ සහජාත ප්‍රත්‍යය හා සම්බන්ධ කොට කුමක් නිසා ප්‍රත්‍යනීක නොගන්නා ලද ද. නිබ්බාන පඤ්ඤත්තීන් ප්‍රත්‍යනීකය හැයි නොකියන්නේ කුමක් නිසාද, කරුණු දක්වා විස්තර කරන්න.